# ලාංකීය ශිෂ්‍ය ව්‍යාපාරයේ ඉතිහාසය

සමාජවාදී ශිෂ්‍ය සංගමය

ලාංකීය ශිෂ්‍ය ව්‍යාපාරයේ ඉතිහාසය
සමාජවාදී ශිෂ්‍ය සංගමය ©

ISBN 978-955-8125-20-5

පළමු මුද්‍රණය 2013 ජූනි

සමාජවාදී ශිෂ්‍ය සංගමය
අංක 464/20
පන්නිපිටිය පාර
පැලවත්ත
බත්තරමුල්ල

Website - http://www.ssusrilanka.com
Email - ssu_lanka@yahoo.com

# පෙරවදන

ලංකාව තුළ ''අධ්‍යාපනය ''නම් ක්‍රියාවලිය ආරම්භ වූ ආකාරයත්, එහි වර්ධනයේ එක්තරා අවදියකදී ලාංකීය ශිෂ්‍ය ව්‍යාපාරය බිහිවීම හා එහි විකාශනයත් විග්‍රහ කරමින් සමාජවාදී ශිෂ්‍ය සංගමය විසින් එළි දක්වන ලද ''ලාංකීය ශිෂ්‍ය ව්‍යාපාරයේ ඉතිහාසය'' නම් මෙම කෘතිය සැබවින්ම කාලීන අවශ්‍යතාවයක් ඉටු කිරීමකි.

මේ වන විට එක් අතකින් අධිරාජ්‍ය විරෝධී, දේශප්‍රේමී සළුපිළි පැළඳ 'බැටළුහම පොරවාගත් වෘකයාගේ ' භූමිකාව රඟපාන රාජපක්ෂ පාලනය නිදහස් අධ්‍යාපනයේ අවසානය සනිටුහන් කිරීමට අධිරාජ්‍යවාදී වුවමනාවන්ට අනුව වහා වහා කටයුතු කරමින් සිටී. අනෙක් අතින් අතිවාමවාදී ළදරු වලිප්පුව වැළඳුණු සුළු පිරිසක් ද ශිෂ්‍ය ව්‍යාපාරයේ බලය, ගෞරවය හා එහි සමගිය බිඳිමින් ශිෂ්‍ය ව්‍යාපාරය දුර්වල කිරීමේ කොන්ත්‍රාත්තුව ඉටු කරමින් සිටිති. මෙම තත්ත්වය තුළ නිදහස් අධ්‍යාපනයේ අයිතිය මෙන්ම ලාංකීය ශිෂ්‍ය ව්‍යාපාරය ද රැකගතයුතු තීරණාත්මක සංධිස්ථානයකට ශිෂ්‍ය ව්‍යාපාරය පැමිණ තිබේ. මෙවැනි මොහොතක ලාංකේය ශිෂ්‍ය ව්‍යාපාරයේ ගමන්මඟ පිළිබඳව ආපසු හැරී බලන හා එහි අත්දැකීම් යළි සාකච්ඡා කරන මෙවන් කෘතියක් එළිදැක්වීම යුගයේ අවශ්‍යතාවක් ඉටු කිරීමකි.

ලාංකීය ශිෂ්‍ය ව්‍යාපාරය විශේෂ ගුණාංග රැසකින් සමන්විත එකකි. ඒ සියල්ල මේ කෘතිය තුළ අඩංගුය. විශේෂයෙන් ම එය අධ්‍යාපන ප්‍රශ්න වලට පමණක් සීමා වූ ජනතාවගෙන් වියෝ වූ ව්‍යාපාරයක් නොව, සමාජයේ පොදු ප්‍රශ්න වෙනුවෙන්, මවුබිමේ නිදහස වෙනුවෙන්, ප්‍රජාතන්ත්‍රවාදය වෙනුවෙන් පොදුජන බලවේග සමග අත්වැල් බැඳ සටන් කළ, කැපකිරීම් කළ, දිවි පිදීම් පවා කළ ව්‍යාපාරයකි. එසේම ලාංකේය ශිෂ්‍ය ව්‍යාපාරය අධ්‍යාපන ප්‍රශ්න වලදී පවා තමන් වෙනුවෙන් නොව අනාගත පරපුර වෙනුවෙන් සටන් කළ ව්‍යාපාරයකි. තමන් වෙත ලැබී ඇති එහෙත් අනාගත පරපුරට

නොලැබීමට ඉඩ ඇති නිදහස් අධ්‍යාපනයේ අයිතිය අනාගත පරපුරට ආරක්ෂාකර දීම වෙනුවෙන් සටන් කළ ව්‍යාපාරයකි. විවිධ පාලක කණ්ඩායම් විසින් නිදහස් අධ්‍යාපනය වැනසීමට දරන ලද විවිධ උත්සාහයන් හා කුමන්ත්‍රණයන්ට පසුවත් නිදහස් අධ්‍යාපනය නමින් කිසිවක් හෝ අද ඉතිරි වී තිබේ නම් එය ඔවුන් කළ සටනේ ප්‍රතිපලයන්ය. අනෙක් අතට ලාංකීය ශිෂ්‍ය ව්‍යාපාරය ප්‍රතිසංස්කරණවාදී සීමා තුළ සිර නොවූ සමාජ පරිවර්තනයක වුවමනාව පිළිගෙන ඒ වෙනුවෙන් ක්‍රියාත්මක වූ ව්‍යාපාරයක් ද විය. මෙම කෘතිය තුළ අඩංගු වන්නේ ඒ සඳහා වන ජීවමාන උදාහරණයන්ය.

නිදහස් අධ්‍යාපනයේ අයිතිය අනාගත පරපුරට රැකදීම ශිෂ්‍ය ව්‍යාපාරයේ පමණක් නොව දෙමාපියන්ගේ ද පොදු සමා-ජයේ ද වගකීමකි. නිදහස් අධ්‍යාපනයේ අයිතිය වෙනුවෙන් සටන් කරන අතරම එය කප්පාදු කරමින් සිටින ධනවාදයට එරෙහිව නව සමාජ පරිවර්තනයක් වෙනුවෙන් ද සටන් කළ යුතුය.''ලාංකීය ශිෂ්‍ය ව්‍යාපාරයේ ඉතිහාසය'' නමින් එළිදකින මෙම කෘතිය එකී වගකීම අපට නැවත සිහිපත් කරවයි.

අනේකවිධ දුෂ්කරතාවයන්ගෙන්, කටුක අත්දැකීම් වලින් මෙන්ම ජයග්‍රහණයන්ගෙන් ද පිරුණු ශිෂ්‍ය ව්‍යාපාරයේ ඉතිහාසය නව පරපුරට මඟ පෙන්වන බව නිසැකය. ලාංකේය ශිෂ්‍ය ව්‍යාපාරය අභිමුව ඇති සියලු අභියෝග ජය ගැනීමේ හැකියාව එය සතු බව විශ්වාස කරන අපි ඊට සුබ පතමු.

ලාංකීය ශිෂ්‍ය ව්‍යාපාරය දිගුකල් දිනේවා !

එම්. ටිල්වින් සිල්වා
ප්‍රධාන ලේකම්
ජනතා විමුක්ති පෙරමුණ
2013.06.16

# පටුන

හැඳින්වීම

1. පුරාණයේ අධ්‍යාපනය.
2. යටත් විජිත සමයේ අධ්‍යාපනය.
3. නිදහස් අධ්‍යාපනයේ හඬ සමාජයෙන් මතුවේ.
4. සරසවි ඇරඹේ! සටන්ද ඇරඹේ!
5. 71 අරගලය හා ශිෂ්‍ය දායකත්වය.
6. 1976 විශේෂ සංධිස්ථානයක් ලෙස.
7. ධර්මිෂ්ඨ ලේබලයෙන් පැමිණි මර්දනයේ නව යුගය.
8. හන්තානේ ලේ ගලයි.
9. රට අනතුරක.
10. අධ්‍යාපන අයිතිය උදුරා ගැනීමේ තවත් තැතක්.
11. වෛද්‍ය පීඨ අරගලය පෙරට ම.
12. ජාතික ශිෂ්‍ය සටන් මධ්‍යස්ථානය ගොඩනැඟේ.

# හැඳින්වීම

පාලක පංතියත්, විවිධ අවස්ථාවාදී කල්ලි කණ්ඩායමුත් විසින් ලාංකීය ශිෂ්‍ය ව්‍යාපාරයේ ගමන් මඟ පිළිබඳව විවිධ ව්‍යාජ විග්‍රහයන් ඉදිරිපත් කරමින් තිබේ. ඉතිහාසයේ විවිධ අවස්ථාවල ශිෂ්‍ය ව්‍යාපාරය හා සම්බන්ධව සිට පසුව එයට එරෙහි වූවන් ද විවිධ ප්‍රකාශනයන් හරහා මේවා පළ කරමින් තිබේ. සමහරු ජීවනෝපාය මාර්ගයක් බවට ද එය හරවාගෙන ඇත. සමහරුන් ශිෂ්‍ය ව්‍යාපාරයේ කීර්තිමත් ඉතිහාසය මගින් තම තමන්ගේ චරිත පුම්බා ගැනීමට වලිකන බව ද පෙනේ. නව ලිබරල් ආර්ථික උපාය මාර්ගයන්ට අනුව ඉතිහාසයේ මෙන් ම වර්තමානයේත් ''නිදහස් අධ්‍යාපනය" ධනපති පාලකයින්ටත් අධිරාජ්‍යවාදීන්ටත් මහත් වූ හිසරදයක් වී ඇත. ලාංකීය ශිෂ්‍ය ව්‍යාපාරය, අධ්‍යාපන අයිතිය වැනසීමට පාලකයින් සිදු කළ කුමන්ත්‍රණ සියල්ලක් ම පාහේ පරදවනු ලැබීය. එපමණක් නොව රටටත් ජනතාවටත් එරෙහිව පාලක පංතිය ක්‍රියාත්මක වූ බොහෝ අවස්ථාවල ඒවාට එරෙහි ව පොදුජනතාව සමග එක්ව සටන් කිරීමට ශිෂ්‍ය ව්‍යාපාරය පසුබට වූයේ නැත. ඒ නිසා වර්තමානයේ අධිරාජ්‍යවාදීන්ගේත් ධනපති පාලකයින්ගේත් වුවමනාව වී ඇත්තේ තමන්ට අභියෝගයක් නොවන හීළෑ වූ ශිෂ්‍ය ව්‍යාපාරයක් ගොඩනගා ගැනීමයි. දැනටමත් ශිෂ්‍ය නායකයින් යයි කියාගන්නා ඇතැම් අය මේ උගුලට හසුවී තිබෙන බව මෑත කාලීන සමහර ක්‍රියාකාරීත්වයන් තුළින් තහවුරු වේ. ඒ නිසා සැබෑ, අවංක ශිෂ්‍ය ක්‍රියාකාරීන් හමුවේ

විශාල අභියෝගයක් පවතී. ඒ සඳහා ඉතිහාසයෙන් ගත හැකි අත්දැකීම් සම්භාරය සුවිශාලය. ශිෂ්‍ය ව්‍යාපාරයේ ඉතිහාසය නිවැරදිව විග්‍රහ කරගත යුත්තේ ඒ සඳහාය.

මෙම පොත ලිවීමේදී මුහුණ දීමට සිදුවූ ප්‍රධාන ම ගැටලුව වුයේ සත්‍ය හා නිවැරදි තොරතුරු සපයාගැනීමේ දුෂ්කරතාවයයි. 1988-1989 සමයේ බිහිසුණු රාජ්‍ය මර්දනය සමඟ සිසු නායකයන් ඇතුළු ක්‍රියාකාරීන් දහස් ගණනක් ඝාතනය වු නිසා සමහර සිදුවීම් හා තීන්දු තීරණ පිළිබඳවත් තොරතුරු සොයාගැනීම දුෂ්කර වී ඇත. නිවැරදිව ම තහවුරු කර ගත නොහැකි තොරතුරු හැකිතාක් දුරට පළ නො කර සිටීමට වග බලා ගත් බව ද මෙහි ලා සටහන් කළ යුතුය. විශේෂයෙන් ම ජීවිත පරිත්‍යාග කරන ලද සිසු විරුවන්ගේ, වීරවරියන්ගේ තොරතුරු පළ කිරීමේ දී සංකීර්ණතාවයක් පැවැති අතර සොයාගත් තොරතුරු වලින් සීමා වීමට සිදු විය. ඒ නිසා අප නම් පවා නොදන්නා අප්‍රතිහත කැපකිරීම් කරන ලද තවත් විශාල පිරිසකගේ තොරතුරු ඇතුළත් කිරීමට නොහැකි වන්නට ඇති බව නිසැකය. 1991 න් පසු ශිෂ්‍ය ව්‍යාපාරයේ ගමන් මඟ පිළිබඳව කොටස මෙයට ඇතුළත්ව නොමැත. ඒ පිළිබඳ විස්තර ඇතුළත් කෘතියක් ඉදිරියේදී ඔබ අතට පත් කිරීමට අදහස් කරගෙන සිටිමු. මේ පොත පිළිබඳ ඔබේ අදහස්, යෝජනා, විවේචන, අප වෙත ලැබීමට සලස්වන්නේ නම් ඉතා වැදගත්ය.

අධ්‍යාපන හා පර්යේෂණ අංශය
සමාජවාදී ශිෂ්‍ය සංගමය

# 01. පුරාණයේ අධ්‍යාපනය

ලංකාවේ අධ්‍යාපන ඉතිහාසය සෙවීමේදී ක්‍රි.පු. කාලය තෙක් දිවයන ඉතිහාසයක් එය සතුය. එහෙත් අපගේ මාතෘකාවට අදාළව සලකන විට එය ආයතනික අධ්‍යාපනය ගැන පමණක් දළ අදහසක් ඇතිකර ගැනීමට පමණක් ප්‍රමාණවත් වනු ඇත. ගමක අධ්‍යාපන කේන්ද්‍රස්ථානය වූයේ පන්සලයි. අනුරාධපුර යුගයේ ඇරඹි මහා විහාරය භික්ෂු අධ්‍යාපන මධ්‍යස්ථානයක් ලෙස පැවැතීම මෙහිදී විශේෂත්වයකි. එය විද්‍යාපීඨයක් වශයෙන් ද හඳුන්වා තිබේ. කෙසේ නමුත් බුදු දහම ලංකාවට පැමිණ වසර 200ක් පමණ ගතවනතුරුත් නිශ්චිත ලේඛන ක්‍රමයක් වර්ධනය වී නොතිබූ අතර මුඛ පරම්පරාව ප්‍රධාන මාධ්‍ය විය. ක්‍රි.පු. 103 දී පමණ වට්ටගාමිණී අභය රජුගේ කාලයේ අනුරාධපුර අභයගිරි විහාරය පිහිට වූ අතර එය මහා විහාරය සමඟ ප්‍රතිපාක්ෂික වී ක්‍රියාත්මක විය. විනය ආදී ඇතැම් කරුණු මීට හේතු වූ බව කියවේ. සිදු වූ සිදුවීම් දාමය තුළ අද ඉතිරිව ඇත්තේ මහා විහාරය සම්බන්ධ කරුණු පමණි. එය වැඩිපුර මහා විහාර මතය තහවුරු කරන්නකි. ජේතවන විහාරයද අධ්‍යාපන මධ්‍යස්ථානයක් ලෙස වැදගත් විය. මෙහි ගොඩනැගිලි 520 තිබූ බව ඉතිහාස ලේඛන වල කියැවේ. 13 වන සියවසේදී සිංහල ව්‍යාකරණ සංග්‍රහයක් වූ සිදත්

සඟරාව ලියවී තිබේ. 14 වැනි සියවසේ පමණ මාතලේ අලුවිහාරයේදී ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කිරීම ද මෙහිදී සිදු වූ වැදගත් සිදුවීමකි. එකල හෙළ අටුවා ග්‍රන්ථ පාලියට නැගූ බුද්ධඝෝෂ තෙරුන් ද මෙහි වැදගත් චරිතයකි. එසේම අභයගිරිය ආශ්‍රිතව වැඩි කලක් ගත කළ පාහියන් භික්ෂුව ද එසේම වැදගත් වේ. අටුවා යුගයෙන් පසු ටීකා යුගයක් ද දක්නට ලැබේ. අනුටීකා, නව ටීකා යනුවෙන් ද මේවායේ තවත් විකාශන පවති. 10වන සියවසට අයත් ධම්පිය අටුවා ගැටපදය හා 11 වන සියවසට අයත් ජාතක අටුවා ගැටපදය මේ දක්වාම නො නැසී පවතී.

ක්‍රි.ව. 1236-1270 දක්වා සිටි II වන පැරකුම්බා රජු සමයේ ලියවුණු විශුද්ධි මාර්ග මහා සන්නස හා වන විනිස සන්නස ද මෙහිදී වැදගත් වේ.

ක්‍රි.ව. 1412-1467 කාලයේ සිටි VI පැරකුම්බා රජු විසින් කරවූ පැපිලියානේ සුනේත්‍රා දේවී පිරිවෙන විශ්වවිද්‍යාලයක මට්ටමින් පවත්වාගෙන ගිය බව ඒ පිළිබඳ වන ශිලා ලේඛන වලින් තහවුරු කෙරේ. පුස්තකාල, නේවාසිකාගාර හා වැඩිපුර අධ්‍යයන පහසුකම් ද මෙහි තිබූ බව තහවුරු වී ඇත. කෑරගල පද්මාවතී පිරිවෙන, තොටගමුවේ විජයබාහු පිරිවෙන, වීදාගම ඝනාන්ද පිරිවෙන මීට අමතරව පැවැති වැදගත් අධ්‍යාපන කේන්ද්‍රස්ථාන කීපයකි. මේවා ආශ්‍රිතව බෝහෝ සාහිත්‍ය, ආගමික ග්‍රන්ථ ද ලියවුණි. කෙසේ වුවද පෘතුගීසි ආක්‍රමණයත් සමඟ ආසියාතික වැඩවසම් ක්‍රමයට ආවේණික අධ්‍යාපන සම්ප්‍රදායන් බිඳවැටුණි. ඒ අතර පැරණි සමාජ සංස්ථාව තුළ එක් එක් ක්ෂේත්‍රයන්ට අදාල ශිල්ප ක්‍රම පැවැති බවත් ඒවා සමඟ අධ්‍යාපනයේ යම් සම්බන්ධයක් අනිවාර්යෙන්ම පැවැති බවත් පිළිගැනීමට සිදුවේ. ඓතිහාසික වාරි කර්මාන්ත තාක්ෂණයත්, ඉංජිනේරු ශිල්ප ක්‍රමත්, චිත්‍ර හා මූර්ති කලාවේත් ගෘහ නිර්මාණ ශිල්පයන්ගේත්, පාරම්පරික වෛද්‍ය ක්‍රමවේදයනුත් ඇතුළු ශිල්ප ක්‍රම පිළිබඳ ඉතිරි වී ඇති පෞරාණික උරුමයන් ඊට සාක්ෂි දරයි. බටහිර ජාතීන්ගේ ආක්‍රමණත් සමඟ ඊට ගැලපෙන අධ්‍යාපන රටාවක් ලාංකේය භූමිය තුළ තහවුරු කරන ලදි. වත්මන් අධ්‍යාපන ක්‍රියාවලියට මුල් පදනම වැටුණේ ඒ කාලය තුළදීය.

# 02. යටත් විජිත සමයේ අධ්‍යාපනය

1505 සිදු වූ පෘතුගීසීන්ගේ පැමිණීමත් සමග එතෙක් පැවතෙමින් ආ සමාජ ක්‍රියාවලියේ බරපතළ වෙනස්කම් සිදුවීම ඇරඹුණි. මුහුදුබඩ ප්‍රදේශවල පෘතුගීසි පාලනය තහවුරු වූ අතර ක්‍රිස්තියානි ආගම ව්‍යාප්ත කිරීමේ විශාල වුවමනාවක් ඔවුන්ට විය. ඊට අමතරව සූරා කෑමේ යාන්ත්‍රණය අටවා ගැනීමට යම් අධ්‍යාපනයක් සහිත පිරිසක් අවශ්‍ය විය. මේ අරමුණු දෙක සඳහා අධ්‍යාපන අවස්ථා ඇති කිරීමට පෘතුගීසීන් පියවර ගනු ලැබීය.

පෘතුගීසි අධිරාජ්‍යයා විසින් සිය යටත් විජිත සඳහා මිෂනාරිවරුන් යැවීම වැඩ පිළිවෙළක් ලෙසින් ම ක්‍රියාවට නැංවීය. රාජකීය අනුග්‍රහය යටතේ මෙසේ විවිධ නිකායවලට අයත් මිෂනාරිවරුන් යවන ලදී. කෝට්ටේ VII වන බුවනෙකබාහු රජුගේ කාලයේ (1521-1551) ලංකාවේ මිෂනාරි කටයුතු ප්‍රැන්සිස්කන් වරුන්ට පවරන ලදී. 1543 වසරේ 'ජුවන් ද විලාද කොන්දෙ' නම් පූජකවරයාගේ නායකත්වයෙන් පළමුවෙනි මිෂනාරි දූත පිරිස ලංකාවට පැමිණියහ.

1602 පමණ ජෙසුයිට් නිකායිකයින් ද, 1605 ඩොමිනිකන්වරු ද, 1606 ඔගස්ටියන්වරු ද මෙසේ මිෂනාරි අධ්‍යාපන කටයුතු වෙනුවෙන් ලංකාවට පැමිණියහ. ඔවුන්ට මුදලින් ආධාර ද, ඉඩම්

වැනි වරප්‍රසාද ද හිමි විය. ක්‍රමානුකූලව මිෂනාරි විද්‍යාල ද ආරම්භ කෙරිණි. කොළඹ ශාන්ත අන්තෝනි විද්‍යාලය එවැන්නකි. ලංකාවේ රාජ කුමාරවරුන්ට මිෂනාරි අධ්‍යාපනය ලබා දීමට වැඩිපුර ඉදිරිපත් වූයේ ෆ්‍රැන්සිස්කන්වරුන්ය. කුමාරවරුන් ක්‍රිස්තියානි ලබ්ධියට හරවා ගැනීම වඩා වැදගත් සේ ඔවුන් සැලකූ බව පෙනෙන්නට තිබේ. මෙසේ අධ්‍යාපනය ලැබූ කුමාරවරුන් අතර බුවෙනකබාහු රජුගේ මුණුබුරු වූ කෝට්ටේ සිහසුනට උරුමකම් කී ධර්මපාල කුමරු, මහනුවර කරලියද්දේ බණ්ඩාර රජුගේ මයිලණු වූ යමසිංහ කුමරු ආදීන් ද වූහ.

යමසිංහ රජු සිහසුනට පත්ව කෙටි කලකින් මිය යාම නිසා ඔහුගේ පුත් දොළොස් හැවිරිදි දොන් ජුවන් කුමරුන් සිංහාසනාරූඪ කරන ලදී. නමුත් නොබෝ දිනකින් ම කොනප්පු බණ්ඩාර විසින් ඔහුව සිහසුනෙන් නෙරපන ලදුව කොළඹ ශාන්ත අන්තෝනි විදුහලේ ද පසුව පෘතුගාලයේ ගෝව නගරයේ ද අධ්‍යාපනයට යොමු වී එහිම පදිංචි විය.

මෙකල එක් එක් නිකාය පදනම් කරගනිමින් අවශේෂ ප්‍රදේශ දක්වා පාසල් ව්‍යාප්තියක් ඇති විය. මේවායේ විෂය මාලාවල ප්‍රධාන තැනක් හිමි වූයේ ක්‍රිස්තු ලබ්ධියටය. මෙම පාසල් කොළඹ හා යාපනය ආශ්‍රිතව වැඩි ව්‍යාප්තියක් දක්නට ලැබුණි. විශේෂයක් වශයෙන් මොවුන්ගේ අධ්‍යාපන විෂය මාලාවල නාට්‍ය කලාව ඇතුළත් වීම සඳහන් කළ යුත්තකි.

## ලන්දේසීන්ගේ ආගමනය

පෘතුගීසි පාලනයෙන් පසු ලන්දේසීහු මුහුදුබඩ ප්‍රදේශ තම පාලනයට නතුකර ගැනීමෙන් අනතුරුව කොළඹ, යාපා පටුන හා ගාල්ල යන උප පරිපාලන ඒකක 3 ක් පවත්වාගෙන ගියහ. මොවුන්ට පැවති ප්‍රධාන වුවමනාවක් වූයේ රෙපරමාදු ක්‍රිස්තියානි ධර්මය වැඩිපුර ප්‍රචාරය කිරීමයි. ප්‍රෙඩිකැන්ටන් පූජකයින් ඉහළ වැටුප් හා දීමනා ගෙවා ගුරුවරුන් ලෙස මේ සඳහා යොදවන ලදී. දේවස්ථාන නමින් ම පාසල් ද ආරම්භ කරන ලදී.

1650 පමණ වන විට පාසල් ජාලයක් ව්‍යාප්ත විය. පැරිෂ් පාසල් නම් වූ මේවා අවුරුද්ද මුළුල්ලේම පවත්වන ලදී. නියමිත වාර හෝ දිගු නිවාඩු කාල නොතිබුණි. නිවාඩු දින වූයේ නත්තල් දිනය, අලුත් අවුරුදු දිනය, ස්වර්ගාරෝහණ දිනය, යාඥා කිරීමේ හා ස්තුති කිරීමේ දිනය ලෙස විශේෂයෙන් වෙන් කෙරුණු දින පමණකි. ඉරිදා හැර අන් හැම දිනයක් ම පාසල් දිනයක් විය. බදාදා හා සෙනසුරාදා අර්ධ නිවාඩු දින විය. පෙරවරුවේ 8 සිට 11 දක්වා ද පස්වරුවේ 2 සිට 5 දක්වා ද පාසල් පැවැත්වුණි.

1663 දෙසැම්බරයේදී පාසල් පරිපාලන මූලස්ථානය වශයෙන් 'ෂෝලාර්හාලෆර්හාදරි' පාසල් මඬුල්ල නම් ආයතනය පිහිටුවනු ලැබීය. ආණ්ඩුකාරයා විසින් එහි සාමාජිකයින් පත් කරන ලදී. පාසල් අධීක්ෂණය පරීක්ෂාව හා පාලනය මේ හරහා සිදු විය. ස්කොලාර්කන් (පරීක්ෂකයා) නමින් හැඳින්වුණු ගිහි සාමාජිකයින් සිය පරීක්ෂණ වාර්තා පාසල් මඬුල්ල වෙත ඉදිරිපත් කරනු ලැබීය. යුරෝපීය ළමුන් සඳහා ලන්දේසි පාඨශාලා නමින් පාසල් පැවති අතර ඒවායේ කියවීම, ලිවීම, අංක ගණිතය, අක්ෂර වින්‍යාසය, භූගෝල විද්‍යාව හා ගායනය ආදී විෂයයන් උගන්වන ලදී.

1787 වන විට පෞද්ගලික පාසල් ලෙස, කොළඹ 4 ක්ද ගාල්ලේ 2 ක්ද මාතර 2 ක්ද ආදී වශයෙන් ඇරඹී තිබුණි. ලන්දේසි වෙළඳ සමාගම්වල සේවය කළ වහල් ජනයා ද, ලන්දේසි නිවාස වල සේවය කළ වහල් ජනයා ද සඳහා අධ්‍යාපනය දීමට කොළඹ ආයතනයක් පැවති බව සඳහන් වේ. 1681 වහල් ජනයා දෙසීයක් පමණ මෙහි ඉගෙන ගැනීම් කටයුතුවල නිරත වූ බවත්, විශේෂයෙන් ලන්දේසි බස ඉගැන්වීම මෙහි මූලික අරමුණ වූ බවත් පෙනෙන්නට තිබේ. මෙම කාලයේ සෙමනේරි ආරම්භ කිරීම ද වැදගත් කරුණකි.

පළමු සෙමනේරිය 1690 දී යාපනය නල්ලූර්හි ශිෂ්‍යයන් 24 කින් ආරම්භ කරන ලදී. එහි අරමුණ වූයේ පූජකයන් ද, කතියේරුවන් ද, ලිපිකරුවන් ද, භාෂා පරිවර්තකයන් ද යන ක්ෂේත්‍රවල ගුරුවරුන් ලෙස පිරිස් පුහුණුකිරීම විය. ඉන් පසුව 1690 දීම අගෝස්තු මාසයේ කොළඹ සෙමනේරිය ද පසුව ගාල්ල හා මාතර සෙමනේරි ද පිහිටුවීමට පියවර ගැනුණි.

සෙමනේරිවල කටයුතු නිසි ආකාරව සිදු නොවීම නිසා ගුරුවරුන් පුහුණු කරන විධිමත් ආයතනයක අවශ්‍යතාවය මතු විය. 1747 කොළඹ පිටකොටුවේ පැරණි පාසල් ගොඩනැගිල්ලක් අලුත් වැඩියා කර නෝමන් පාසල හෙවත් ගුරු විද්‍යාලය ආරම්භ කළේ මේ අනුවය. මේවා මෙසේ ආරම්භ වුවද හොඳින් නඩත්තු නො වූ නිසා විවිධාකාරයේ ගැටලු පැවතුණි.

1737 දී ලන්දේසි මුද්‍රණාලය කොළඹ පිහිටුවීමෙන් පසුව ආධ්‍යාපනික පොත් මුද්‍රණය කිරීමත් සමඟ ම අධ්‍යාපනය අරබයා වැදගත් කාර්ය භාරයක් ඉටු කරන ලදී. පාසල් අධ්‍යාපනයට ද එවැනි පොත් පත් යොදා ගන්නා ලදී. ලන්දේසි පාලන සමයේ අධ්‍යාපන ක්ෂේත්‍රය සම්බන්ධයෙන් පැවති වැදගත් කරුණු මේවාය.

## බ්‍රිතාන්‍ය පාලනය තුළ අධ්‍යාපනයේ වෙනස්කම්

බ්‍රිතාන්‍යයන් සිය පාලනය තුළ උත්සාහ කලේ හැකි උපරිම ලෙස අපේ රට සූරාකෑමයි. වතු වගාවන් ද ආරම්භ වූයේ ඒ අරමුණ සඳහාය. අධ්‍යාපනය යම් පමණකට හෝ ව්‍යාප්ත කිරීමට ඔවුන්ට අවශ්‍ය වූයේ මෙම වැඩකටයුතු සඳහා අවශ්‍ය ශ්‍රමිකයින්, ලිපිකරුවන් නිර්මාණය කර ගැනීමටය.

1832 පමණ ඉදිරිපත් වූ කෝල්බෲක් කොමිසමේ වූයේ රජයේ පාසල් සම්බන්ධ ප්‍රතිසංස්කරණයන්ය. මේ යටතේ අවධානය යොමුකර තිබුනේ මිෂනාරී හෝ පෞද්ගලික පාසල් නොව රජයේ පාසල් පිළිබඳවය. මේවා සිංහල ප්‍රදේශවල පාසල් 90 ක්ද, දෙමළ ප්‍රදේශවල පාසල් 4 ක්ද, ලෙස කෝල්බෲක් නිරීක්ෂණය කොට තිබූ අතර ඔහුට අනුව ඒවා ඉතා ම පහත් තත්වයක පැවැතුණි. සැබවින්ම මේවා පැරණි ලන්දේසි පැරිස් පාසල් වූ අතර බ්‍රිතාන්‍යයන් විසින් ඒවා නැවත පිහිටුවනු ලැබ තිබුණි. මේ ඒ පිළිබඳ වූ වගන්ති කිහිපයකි.

''පාසල් ගුරුවරුන්ගෙන් ඉංග්‍රීසි භාෂාව පිළිබඳ අවබෝධයක් අපේක්ෂා නො කරන ලදී. ඒ ගැන කිසිම දැනීමක් ඔවුන්ට නැත. ඔවුහු බොහෝවිට තමන් දරන තනතුරු සඳහා නුසුදුස්සෝය. දේශීය භාෂා

කියවීමත් එම අකුරු ලිවීමත් හැර කිසිවක් පාසල්වල නො ඉගැන්වේ. අයථා දෑ බොහෝ සිදුවේ.''

මේ ආකල්පයේ ප්‍රතිඵල කෝල්බෲක් වාර්තාව ඉදිරිපත් කර නොබෝ දිනකින්ම දැකිය හැකි විය. එනම් පාසල් වැඩි ප්‍රමාණයක් වසාදමන ලදී.

කෝල්බෲක්ගේ යෝජනාව වූයේ දිවයිනේ ආච්ඩිකන්වරයා හා පූජකවරුන්ද, දිස්ත්‍රික්ක භාර රජයේ දිසාපතිවරුන්ගෙන් ද රජයේ සමහර ප්‍රධාන සිවිල් හා අධිකරණ නිලධරයන් ද ඇතුළත් කොමිසමක පාලනය යටතට සියලු රජයේ පාසල් ගෙන ආ යුතු බවයි. 1932 මීට අදාළ පාසල් කොමිසම පත්කරන ලදී.

මීට අමතරව පැවති පෞද්ගලික පාසල් 649 හා මිෂනාරී පාසල් 236 සම්බන්ධ වෙනස්කම් කිරීමට කෝල්බෲක් අවධානය යොමුකර නො තිබුණි. ඒවා එසේම පවත්වාගෙන යා යුතු බව කොමිසමේ අදහස විය.

කෝල්බෲක්ගේ තවත් වැදගත් යෝජනාවක් වූයේ පාසල් ගුරුවරුන් පාසල් කොමිසමේ නිර්දේශය පරිදි පත්කළ යුතු බවත්, ඉංග්‍රීසි බසින් ඉගැන්වීමට හැකිවන පරිදි ඔවුන්ට ඒ පිළිබඳ මනා නිපුණතාවයක් තිබිය යුතු බවත්ය. මෙහි ප්‍රතිඵලය වූයේ ඉගැන්වීම් මාධ්‍යයද ඉංග්‍රීසි බවට පත්වීමත් කලක් යනතුරු රජයේ පාසල් යනු ඉංග්‍රීසි පාසල් වීමත් ය.

මේ අතර පන්සල් හා වෙනත් ඒ ආශ්‍රිත ස්වදේශික අධ්‍යාපනය කිසිසේත් සැලකිය යුත්තක් නොවේ යැයි කියමින් කෝල්බෲක් පැරණි අධ්‍යාපන සම්ප්‍රදායන් සම්පූර්ණයෙන් බැහැර කළේය. සැබවින් ම යටත් විජිතය සූරාකෑම වේගවත් කර ගැනීමට අවශ්‍ය යාන්ත්‍රණයක් ඇටවීමේ දී ඔවුන්ට ඒවා වැදගත් නොවීම වටහාගත හැක්කකි.

## පාඨශාලා කොමිසම

1832 පාඨශාලා කොමිසම පිහිටුවද්දී එවකට සිටි ආච්ඩිකන්වරයා ඊට දැඩි ලෙස විරුද්ධ වී තිබේ. නමුත් එංගලන්තයේ බලපෑම නිසා එය පිහිටුවන ලදී. මේ තත්ත්වය නිසා එය මුලදී අක්‍රීය ආයතනයක්

වී ඇත. ශාන්ත පාවුලු දෙව් මැදුරේ යටත් විජිත පූජක තනතුරේ වැඩ බැලූ ජෝසප් මාර්ස් දේවගැතිවරයා කොමිසමේ ලේකම්වරයා විය. ආච්ඩිකන්වරයා මාර්ස් දේවගැතිවරයා සමග ගැටුමක් ඇතිකර ගැනීම නිසා මාර්ස් දේවගැතිවරයා පසුව තනතුරින් ඉවත්විය.

1837 ආණ්ඩුකාරවරයා ලෙසින් පත්වූ ජේ.ඒ. ස්ටුවර්ට් මැකන්සිට ද මෙම කොමසමේ වැඩපිළිවෙළක් ගැන සොයාබැලීමට නො හැකි විය. එය එතරම්ම අක්‍රීය වී තිබූ නිසාය. රැස්වීම් පවා නො පැවැත්වූ බව කියවේ. මේ වනවිට කොමිසමේ මූලිකයා ආච්ඩිකන්වරයා විය. ආච්ඩිකන්වරයා කොමිසමට තිබූ විශාලම බාධාව ලෙස මැකන්සි දුටුවද ඔහුට හෙතෙම ඉවත් කළ නොහැකි විය. ඇන්ග්ලිකන් සභාව හා රජය අතර මේ අරගලය වසර කීපයක් පැවති අතර එය අධ්‍යාපනය කෙරෙහි ඉතා අහිතකර ප්‍රතිඵල ගෙනදුණි.

අවසානයේ පැවති පාඨශාලා කොමිසම විසුරුවා හැර අලුත් කොමිසමක් පත් කිරීමට බ්‍රිතාන්‍ය රජය අදහස් කළේය. 1939 බ්‍රිතාන්‍ය රජයේ ද අධ්‍යාපන ප්‍රතිපත්තියේ වෙනසක් සිදුවිය. එනම් අධ්‍යාපනය සඳහා දෙන රජයේ දීමනා, ආගමික සමිති හරහා දෙනවා වෙනුවට ප්‍රිවි කවුන්සිලයේ කමිටුවක් වෙත පැවරීමයි. 1841 මැකන්සි ආණ්ඩුකාරයා විසින් එකල තැපැල්පතිව සිටි ජෝර්ජ් ලී ලේකම් ලෙස කටයුතු කරන නව පාඨශාලා කොමිසමක් පත් කරන ලදී. එහි ඉතිරි සාමාජිකයන් පත් කළේ ඊළඟ ආණ්ඩුකාරයා වූ සර් කොලින් කාමල් ය. 1847 දක්වා වූ කොලින් කාමල් ගේ කාලයේ පාඨශාලා කොමිසමේ යම් ක්‍රියාකාරිත්වයක් ඇතිවිය. 1845 දී පාඨශාලා කොමිසමේ සභාපති ලෙස කොළඹ බිෂොප්වරයා පත්කිරීම ද වැදගත් සිදුවීමකි. මේ අතර ඉංග්‍රීසි භාෂාව ඉගැන්වීමට පවා දේශීය භාෂාවේ ඇති වැදගත්කම හා අවශ්‍යතාවය වැඩිකල් නොගොස් ම කොමිසමට ඒත්තු ගියේය. මේ නිසා හැම පාඨශාලාවක ම දේශීය භාෂාවලින් ඉගැන්වීමට යෝජනාවක් සම්මත කර ගැනුණි. 1845 දී ස්වභාෂා පාඨශාලාවට ගුරුවරුන් පත්කර ගැනීමේ අරමුණින් '' තෝර්මල් පාඨශාලාව'' නමින් දේශීය ආයතනයක් පිහිටුවනු ලැබුණි.

1847 සිට ඇරඹි ටොරින්ටන් ආණ්ඩුකාරයාගේ කාලයේ දී ආගමික මතභේදයක් මත කොළඹ බිෂොප්වරයා පාඨශාලා කොමිසන්

සභාපති ධූරයෙන් ඉවත්විය. ඉන් කොමිසමේ වැඩ කටයුතුවලට බාධා සිදුවිය.

## පාසල් ගාස්තු ඉහළ දමයි

මේ කාලයේ කෝපි අර්බුදය ද පැමිණි නිසා රජයෙන් අධ්‍යාපනයට වෙන්කළ සොච්චම් මුදල ද තවත් අඩුවිය. මේ තත්ත්වය යටතේ පාඨශාලා කොමිසම දෙමාපියන්ගෙන් මුදල් අයකර ගැනීමට පාඨශාලා ගාස්තු ඉහළ දැමිය යුතු බවට යෝජනාවක් සම්මත කර ගැනුණි. 1849 එම වැඩපිළිවෙළ ක්‍රියාවට නැගුණි.

1860 ජූලි මාසයේ දී සී.ජේ. මැකාර්ති ආණ්ඩුකාරයා පත් වූ පසු පාඨශාලා පරීක්ෂක වශයෙන් වෝල්ටර් සෙන්ඩල් පත් කිරීමට නිර්දේශ කිරීම අතිශයින් වැදගත් තීන්දුවක් විය. මෙය පාඨශාලා කොමිසමට පටහැනි එකක් වුව ද ඉන් වැදගත් මැදිහත්වීමක් සිදු වූ බව පැවසේ. 1866 සිට ආණ්ඩුකාරයා වූ සර් හර්කියුලස් රොබින්සන් අධ්‍යාපන රටාවේ වෙනස්කම් රාශියකට පදනම දමන ලදී.

අධ්‍යාපනය සම්බන්ධ සෙවීමට පත්කළ අනුකමිටුවක් මගින් යෝජනා ලබාගන්නා ලදී. ඒ අනුව පාසල් කොමිසම අහෝසි කොට ''ප්‍රසිද්ධ ඉගැන්වීම් අධ්‍යක්ෂකවරයකු'' පත්කරන ලදී.

## අධ්‍යාපනයට ව්‍යවස්ථාවක්

1837 දී මාර්ෂ් දේව ගැතිවරයා විසින් පිළියෙළ කරන ලද ''ලංකාද්වීපයේ ආණ්ඩුවේ පාඨශාලා පාලන ක්‍රමයේ ඒකීයතාවය වැඩිදියුණු කිරීම සඳහා සාමාන්‍ය නීති රීති සහ යෝජනා පිළිබඳ නිර්දේශ පත්‍රය" යන්න පාඨශාලා කොමිසම විසින් පිළිගනු ලැබිණි. එය දිවයිනේ රජයේ පාසල් සඳහා සකස් වූ ''පළමු වැනි ව්‍යවස්ථා සංග්‍රහය" ලෙස සැලකිය හැකිය.

1832 ඇරඹි කොළඹ ඇකඩමියේ තවත් අංගයක් ලෙස ''ක්වීන්ස් කොලේජ්" නමින් උසස් පාසලක් ද ඇරඹි අතර මෙය කල්කටා විශ්වවිද්‍යාලයට සම්බන්ධ ආයතනයක් ලෙස සැලකීය. එය

උපාධි අපේක්ෂකයින් සූදානම් කිරීමේ ආයතනයක් ලෙස පැවැත් වීය.

## පළමු විභාගය

ලංකාවේ අධ්‍යාපන ඉතිහාසයේ පළමු වරට 1862 ලාංකීය ශිෂ්‍යයන් සඳහා පරීක්ෂණයක් පැවැත්වීමට ආණ්ඩුව අදහස් කළේය. ඊට ආසන්න හේතුව වූයේ රාජ්‍ය සේවාවේ කනිෂ්ඨ තනතුරු පිරවීමට අවශ්‍ය වීමයි. මධ්‍යම පාඨශාලා කොමිසම මගින් එය සිදු කරන ලදි.

1868 පත්කළ අනුකමිටුව මගින් අධ්‍යාපනය සම්බන්ධ යෝජනා 11 ක් ඉදිරිපත්කරන ලදි. ඉන් කීපයක් පහත දක්වා ඇත.

01. පාඨශාලා කොමිසම වෙනුවට ප්‍රසිද්ධ ඉගැන්වීම් අධ්‍යක්ෂවරයකු පත් කිරීම.
02. ප්‍රාථමික අධ්‍යාපනය සිංහලෙන් හා දෙමළෙන් ලබා දීම සඳහා හැම ගමක් පාසාම ස්වභාෂා පාඨශාලා ආරම්භ කිරීම.
03. අවුරුදු 02 ක් තිස්සේ වසා දමා තිබූ කොළඹ කාර්මික පාඨශාලාව නැවත විවෘත කිරීම.
04. "ක්වීන්ස්" විද්‍යාලය හා කල්කටා විශ්වවිද්‍යාලය අතර සම්බන්ධය නවතා දමා ඒ වෙනුවට වාර්ෂික වටිනාකම පවුම් 180 ක් වන අවුරුදු 03 ක කාල සීමාවකට වලංගු ඉංග්‍රීසි ශිෂ්‍යත්ව ප්‍රදානය කිරීම.

යටත් විජිත බාර ලේකම්වරයා මෙම යෝජනා පිළිගත් අතර ඒවා ක්‍රියාත්මක කිරීමට නිර්දේශ කරන ලදි. ඒ අනුව 1868 දී පාඨශාලා කොමිසම අහෝසි කොට 1869 ජනවාරි සිට ප්‍රසිද්ධ ඉගැන්වීම් අධ්‍යක්ෂවරයකු පත්කරන ලදි. ඒ සඳහා තෝරා ගත්තේ එංගලන්ත මහ රැජිනගේ රජයේ පාඨශාලා පරීක්ෂක වශයෙන් වසර 10 ක් සේවය කළ එසේ ම එවකට අයර්ලන්ත ප්‍රාථමික අධ්‍යාපනය පිළිබඳ රාජකීය

කොමිසමේ ලේකම්වරයා ලෙස සේවය කරමින් සිටි ''ජේ.එස්. ලෝරි'' මහතාය. ප්‍රසිද්ධ ඉගැන්වීම් දෙපාර්තමේන්තුව ඇරඹුණේ ඔහු ලංකාවට පැමිණි පසුවය.

## ඉක්මන් සූරාකෑම

බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් බලාපොරොත්තු වූ පරිදි තම සූරාකෑමේ වැඩපිළිවෙළ වේගවත්කර ගැනීම සඳහා පරිපාරිපාලන ක්ෂේත්‍රයට දේශීය ශ්‍රමිකයින් යොදා ගැනීමට අවශ්‍ය වූ අතර ඇතිකර තිබූ අධ්‍යාපන රටාවෙන් එය නිසි පරිදි ඉටු නොවීම නිසා කඩිනමින් මෙසේ වෙනස්කම් රැසකට පියවර ගත් බව පෙනෙන්නට තිබේ.

මෙම නව අධ්‍යාපන වෙනස්කම් ඇතිකිරීම සඳහා අධ්‍යාපන වැය ශීර්ෂය පවුම් 20027 දක්වා වැඩිකිරීමට යටත් විජිත බාර ලේකම්වරයා අනුමැතිය දෙන්නේ ද මේ අනුවය.

ප්‍රසිද්ධ ඉගැන්වීම් අධ්‍යක්ෂකවරයා ලෙස වැඩ භාරගත් ''ලෝරි'' පාසල් නගාසිටුවීම වෙනුවෙන් නිර්දේශ 17 ක් ඉදිරිපත් කළේය. ඔහු මේ සමග වාර්තාවක් ඉදිරිපත් කළ අතර එකල පැවති අධ්‍යාපනයේ තත්ත්වය එහි සඳහන් වේ. එහි කොටසක් මෙසේය.

"ගුරුවරයා සුළු අපහසුවක් දැනුන විටද, නිවාඩුවක් ගැනීමට සිතූ විටද, පාසල වසයි. නිවාඩු කාලයක් ඉදිරියට තබාගෙන ද හේ පාසල වසයි. උදේ වැස්සොත් පාසල වසයි. දෙසතියක නිවාඩුව මසකට දීර්ඝ කර ගනී. පැමිණීමේ සංඛ්‍යාව අනුව ඔහුගේ මාසික වැටුප ගෙවනු ලබන හෙයින් වැටුප් ලබා ගැනීමට අවශ්‍ය පැමිණීමේ අවම සංඛ්‍යාව නො පැමිණි විට ඒ සුළු අඩුව හරිගස්සා ගැනීමට පැමිණීමේ ලේඛනයට බොරු ගණන් ඇතුළු කරයි."

කෙසේ වුවද ලෝරිගේ නිර්දේශවලට ආණ්ඩුකාරයා ඇතුළු බ්‍රිතාන්‍ය පාලක ආණ්ඩුවේ සහය නො ලැබීම නිසා හෙතෙම තනතුරින් ඉල්ලා අස්විය. එම පුරප්පාඩු සඳහා පාඨශාලා පරීක්ෂකයකු වූද, කොළඹ ඇකඩමියේ ගුරුවරයකු වූද, ඩබ්ලිව්.ජේ. සෙන්ඩල් පත් විය. සෙන්ඩල් ආණ්ඩුවේ වුවමනාවට පූර්ණ එකඟතාවයෙන් වැඩ කළ අයෙක් විය.

බලාපොරොත්තු වූ පරිදි අධ්‍යාපනය සඳහා ආණ්ඩුව මුදල් වෙන් නො කිරීම නිසා සැලසුම් බොහොමයක් අසාර්ථක විය. 1875 - 77 වකවානුවේ පැවති "කෝපි අර්බුදය" හේතුවෙන්ද ආර්ථිකය පසු බෑ අතර, අධ්‍යාපනයට තවත් මුදල් අඩු කෙරිණි.

1901 ජන සංගණනයට අනුව පාසල් යායුතු වයසේ ළමයින්ගෙන් 3/4 ක් ම පාසල් නො ගිය ළමයින් අතර විය.

1880 දී ලංකාවට පැමිණි හෙන්රි ස්ටීල් ඕල්කට් මහතා බෞද්ධ පරම විඥාණාර්ථ ව්‍යාපාරය ආරම්භ කළ අතර, ඊට බෞද්ධ හිමිවරු සහ ප්‍රධාන පෙළේ ගිහියන්ගේ සහයෝගය ලැබුණි. මෙහි ප්‍රධාන අරමුණක් වූයේ බෞද්ධ පාසල් ආරම්භ කිරීම වූ නමුත් මුදල් ප්‍රශ්න ඊට බාධකයක් විය. එබැවින් ඒ සඳහා අරමුදලක් ආරම්භ කර එයට මුදල් ආධාර එකතු කරනු ලැබුණි. ඒ අනුව ප්‍රථම බෞද්ධ පාසල් ආරම්භ කිරිමට පියවර ගැනුණි.

**කොළඹ ආනන්ද විද්‍යාලය (1886)**
**මහනුවර ධර්මරාජ විද්‍යාලය**
**ගාල්ලේ මහින්ද විද්‍යාලය**
**මාතලේ විජය විද්‍යාලය**
**ගම්පොල ජිනරාජ විද්‍යාලය**
**නාවලපිටියේ බෞද්ධ විද්‍යාලය**

යන පාසල් ඒ අනුව ආරම්භ කළ ප්‍රමුඛ පෙළේ පාසල් ය. මෙය අධ්‍යාපන ව්‍යාප්තියට බෙහෙවින් බලපෑ කරුණකි.

හින්දු හා ඉස්ලාම් භක්තිකයින් ද මීට සමගාමීව කටයුතු කළ බව පෙනෙන්නට තිබේ. 1872 දී වන්නාර්පොත්තෙයි හි හිංදු පාසලක් ආරම්භ කළ ආරුමුග නාවලාර් ගේ බලපෑම මෙහි ලා සුවිශේෂ ය. 1887 දී යාපනයේ හින්දු විද්‍යාලය, 1890 දී යාපනයේ ශෛව පරිපාලන සභාව යටතට පත් කර ගැනුණි. ඉස්ලාම් භක්තිකයන් කොළඹ සහිරා විද්‍යාලය ආරම්භ කිරිම ද මෙහි තවත් පියවරකි.

1889 දී උසස් ඉංග්‍රීසි, ප්‍රාථමික ඉංග්‍රීසි, කනිෂ්ඨ ඉංග්‍රීසි, ස්වභාෂා හා ඉංග්‍රීසි ස්වභාෂා පාසල් යනුවෙන් පාසල් යළි වර්ග කරන ලදී.

මීට සමගාමීව අධ්‍යාපනයට වෙන්කරන මුදල් ද ක්‍රමානුකූලව ඉහළ දැමුණි.

20 වන සියවස ආරම්භ වන විට ලාංකේය සමාජය තුළ ආගමික හා ජාතිකත්ව බෙදීම තවදුරටත් පැවතෙමින් හා ඒවා පෝෂණය කරන පාලන රටාවක් ක්‍රියාත්මක වී තිබුණි. අධ්‍යාපන ක්‍රියාවලියෙන් මීට සුවිශාල දායකත්වයක් ලැබුණු බව පෙනෙන්නට තිබේ. එසේම බ්‍රිතාන්‍යයන්ගේ බෙදා පාලනය කිරීමේ පිළිවෙත ද ඊට හේතු විය.

මේ තත්ත්වය තුළ පවා වෙන් වෙන් වශයෙන් හෝ මතු වූ බ්‍රිතාන්‍යයන්ට එරෙහි ව්‍යාපාර නො පැවතියේ නොවේ. නමුත් බොහෝ විට ඒවා තුළ ජාතිවාදී, ආගම්වාදී මූලයන් පැවතුණි. 1880 ඕල්කට් තුමාගේ පැමිණීමෙන් පසු ඇරඹි බෞද්ධ ව්‍යාපාරය ද එවැන්නකි. කෙසේ නමුත් එවැනි ව්‍යාපාරයන්ගේ බලපෑම සමාජයට තිබූ බව අවිවාදිත ය. අනගාරික ධර්මපාල, වලිසිංහ හරිශ්චන්ද්‍ර, පියදාස සිරිසේන වැනි අය ද, භික්ෂූන් වහන්සේලා ද මහජන රැස්වීම්, විවිධ සිංහල මාධ්‍ය ප්‍රකාශන හරහා ස්වදේශික උරුමයන් හා නිදහස පිළිබඳ කතාබහ කරන ලදී.

කෙසේ වුවද බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් අධ්‍යාපන වියදම් අඩු කිරීමට දිගටම බලපෑම් කරන ලදී. 1901 දී ආණ්ඩුකාරයා කර ඇති මේ ප්‍රකාශයෙන් ඒ බව වඩාත් තහවුරු වේ.

"අපගේ වියදම් පිළිබඳ සීමාවක් තිබිය යුතු බව යටත් විජිත බාර ලේකම්වරයා නැවත නැවත මතක් කරයි. එහෙත් අනාගත පරම්පරාවේ සුබසිද්ධිය හා ක්‍රියා කලාපය කෙරෙහි එතරම් බලපාන අධ්‍යාපනයේ දියුණුව අවහිර නො කළ යුතුය. එය ඉදිරියටම යා යුතුය. එහෙත් අප ඒ සඳහා මුදල් කෙසේ සොයා ගන්නෙමුද?"

1901 දී සිදුකරන ලද ජන සංගණනයෙන් වැදගත් තොරතුරු රැසක් අනාවරණය විය. ඒ අනුව මුළු ජනගහනය 35,65,964කි. ඉන් 27,90,255කට ලිවීමට හා කියවීමට නොහැකිය. එය ආසන්න වශයෙන් ජනගහනයෙන් 4/5කි. පාසල් යා යුතු වයසේ ළමුන් 8,67,103 ක් සිටින බවත් ඉන් 6,50,000ක් ම පාසල් නො යන බවත් සංගණන අධිකාරී පී. අරුණාචලම් මහතා පෙන්වා දුන්නේ ය. එනම් පාසල්

යා යුතු වයසේ ළමුන්ගෙන් 3/4 ක්ම පාසල් නො යන බවය. මෙසේ හෙළිදරව් වූ කරුණුවලින් තත්ත්වයේ බරපතළකම ගැන හෙළි වූ අතර බොහෝ දෙනෙකු ගේ ඇස් ඇරුණි. ඊට අමතරව බ්‍රිතාන්‍ය දේශපාලන ක්ෂේත්‍රයේ ද සිදු වූ ඇතැම් ප්‍රජාතාන්ත්‍රික ප්‍රතිසංස්කරණයන් නිසා ද යම් බලපෑමක් සිදුවිය.

1905 දී ඉංග්‍රීසි උගත් ලාංකිකයන් පිරිසක් එක්ව ආචාර්ය ආනන්ද කුමාරස්වාමි ගේ නායකත්වය යටතේ ''ලංකා ප්‍රතිසංස්කරණ මණ්ඩලය" පිහිටුවා ගැනුණි. එහි එක් පරමාර්ථයක් වූයේ භාෂාව හා අධ්‍යාපනය සම්බන්ධයෙන් ජනමතය දිරි ගැන්වීමයි.

ඒ අතර ලංකාවේ අධ්‍යාපන පහසුකම් පිළිබඳව මහජන මන්ත්‍රී මණ්ඩලයේදී යටත් විජිත බාර ලේකම්වරයාගෙන් නිතර නිතර ප්‍රශ්න කරනු ලැබුණි. අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා ක්‍රියාත්මක කරන ලෙස ලංකාණ්ඩුකාරයා වෙත විදුලි පුවත් යැවුණි. මේ තත්ත්වයන් මත 1905දී මේ පිළිබඳ කාරක සභාවක් පත් කළ අතර එහි ප්‍රසිද්ධ ඉගැන්වීම් දෙපාර්තමේන්තුවේ නිලධාරීහු ද, පාසල් කළමණාකාරවරු පිරිසක්ද සිටියහ.

## සාක්ෂරතාවය 25% වූ කාලයක්

1923 කොළඹ නගරය මුල්කරගෙන මහා වැඩ වර්ජනයක් සිදු වූ අතර එය දේශපාලන හැඩයක් ද ගනු ලැබුණි. කම්කරු නායකයෙකු ලෙස ඒ.ඊ. ගුණසිංහ ඉස්මතුවූයේ මෙයත් සමගය. 1927 - 1929 කාලය ද වරාය හා ට්‍රෑම් කාර් රථ වර්ජනය සිදු වූ කාලය ලෙස ද ප්‍රකටය.

ඒ නිසා දේශපාලන ප්‍රතිසංස්කරණ සඳහා වැඩිම බලපෑම සිදු කළේ පීඩිත ජනතාව ගෙනගිය අරගල බව පැහැදිලි ය. උදාහරණයක් වශයෙන් සර්වජන ඡන්ද අයිතිය පිළිබඳ සටන් පාඨ මූලිකව මතු කළේ කම්කරු ව්‍යාපාරය මගිනි. මුල දී කම්කරු ව්‍යාපාරයේ ප්‍රකාශකයා වූයේ ඒ. ඊ. ගුණසිංහයි. එබැවින් අධ්‍යාපන ප්‍රතිසංස්කරණ සඳහා ද ඒවායින් සැලකියයුතු බලපෑමක් සිදුවිය.

# අනිවාර්ය අධ්‍යාපනය

1905 අධ්‍යාපනය පිළිබඳ යෝජනා සකස් කිරීමට පත්කළ කොමිසමින් නිර්දේශ කීපයක් ඉදිරිපත් කරන ලදී. ඒ අනුව ව්‍යවස්ථාදායක සභාවේ යම් විරෝධතාවයක් ද සහිතව ආඥා පනත් 02ක් සම්මත විය.

**i) 1906 දී නාගරික පාඨශාලා ආඥා පනත**
**ii) 1907 දී ගම්බද පාඨශාලා ආඥා පනත**

ස්වභාෂාවෙන් අධ්‍යාපනය ලැබීමට පහසුකම් නො තිබුණු ගම්බද හා වතුකර ප්‍රදේශවල ගුරුවරුන්ට ඒ පහසුකම් සැලසීමත්, දෙමළ හා මුස්ලිම් දෙමව්පියන්ගේ ගැහැනු දරුවන්ට අවුරු 6-10 අතර ද, සෙසු දරුවන්ට අවුරුදු 6 - 12 අතර ද අධ්‍යාපනය අනිවාර්ය කිරීම මෙම ආඥා පනත් දෙකෙහි ප්‍රතිඵලයන් ය.

එහෙත් අනිවාර්ය ස්වභාෂා අධ්‍යාපනය පිළිබඳ වගකීම පළාත් පාලන මණ්ඩලවලට පැවැරීම තුළ ආණ්ඩුව වියදම්වලින් ගැලවීමට උපක්‍රමයක් සකස්කරගත් බවක් පෙනෙන්නට තිබේ.

කෙසේ නමුත් දරුවන් පාසල් නො යවන දෙමව්පියන්ට විරුද්ධව නඩු දැමීමට පියවර ගනු ලැබිණි. එය ද ක්‍රියාත්මක විය. උදාහරණයක් ලෙස එක වසරක් තුළ යාපනයේ පමණක් මෙවැනි නඩු 14,286ක් ගොනුකර තිබුණි. වරදකරුවන් වන අයට හය මාසයකට නොවැඩි බරපතළ වැඩ සහිත හෝ රහිත සිරදඬුම් නැතහොත් රුපියල් 20.00ට නොවැඩි දඩයක් නැතහොත් ඒ දෙක ම හෝ පමුණුවනු ලැබුණි.

1910 දී පමණ නැවත අධ්‍යාපනය පිළිබඳ නිර්දේශ ඉදිරිපත් කිරීමට ''මැක්ලවුඩ් කමිටුව'' හා ''ජේ.ආර්. බ්‍රිජ්'' කමිටුව පත්කරන ලදී. මෙහි බ්‍රිජ් කමිටුව සාපේක්ෂව රැඩිකල් නිර්දේශ ඉදිරිපත් කරන ලදින් රජය වැඩිපුර සැලකිල්ලට ගනු ලැබුවේ මැක්ලවුඩ් කමිටු නිර්දේශයන්ය.

ඒ අනුව 1912 දී ''ප්‍රසිද්ධ ඉගැන්වීම් දෙපාර්තමේන්තුව'' යන

නම වෙනුවට ''අධ්‍යාපන දෙපාර්තමේන්තුව'' යනුවෙන් වෙනස් කොට අධ්‍යාපන අධ්‍යක්ෂ තනතුරක් ඇති කළේය. බලතල හිමි අලුත් අධ්‍යාපන මණ්ඩලයක් ද ඒ අනුව ඇතිවිය. එහි ප්‍රධාන කටයුත්ත වූයේ අධ්‍යාපන ව්‍යවස්ථා සංග්‍රහය නමින් රෙගුලාසි පිළියෙළ කිරීමයි.

1917 දී අනිවාර්ය අධ්‍යාපනය ලැබීමේ උපරිම සීමාව වයස 17 දක්වා වැඩිකරන ලදී. ශ්‍රීමත් විලියම් මැනිං ආණ්ඩුකාරවරයාගේ කාලයද අධ්‍යාපන ක්ෂේත්‍රයට වැදගත්විය.

1919 දී ව්‍යවස්ථාදායක සභාවට ලංකාවේ අධ්‍යාපනය සම්බන්ධ සංදේශයක් ඉදිරිපත් කරන ලදී. එය පදනම් කොටගෙන නව අධ්‍යාපන පනතක් සකස් විය. දීර්ඝ විවාදයක් සමග 1920 අංක 1 ආඥා පනත ලෙස සම්මත වූයේ එයයි.

භාෂා මාධ්‍යය නොසලකා සියලු පාසල් එක පාලනයක් යටතට ගැනීමට ඉන් කටයුතු යෙදිණි. තවද වැදගත් යෝජනා කීපයක් ඒ අතර විය.

උසස් අධ්‍යාපන අවස්ථා සඳහා ලංකාව තුළ ආයතනයක අවශ්‍යතාවය විවිධ පාර්ශ්වයන් විසින් මතුකර තිබුණි. අනෙක් පසින් එය අවශ්‍යතාවයක් ලෙස ඉස්මතුව තිබුණි. එවකට බ්‍රිතාන්‍ය විශ්ව විද්‍යාල සඳහා ඇතුළත්වීමේ අවස්ථාව හිමි වූයේ ලංකාවෙන් ම එක් අයකුට පමණි. ඒ අනුව 1921 විශ්වවිද්‍යාල කොලීජිය ආරම්භ කරන ලදී.

ඉතා ප්‍රාථමික මට්ටමක පැවැති සාක්ෂරතාවය ක්‍රමානුකූලව වර්ධනය වීමට පාසල් අධ්‍යාපනයේ ව්‍යාප්තිය සැලකිය යුතු බලපෑමක් කරන ලදී.

| වර්ෂය | ඇතුළත් කළ මුළු ශිෂ්‍ය සංඛ්‍යාව |
|---|---|
| 1908 | 2 87 000 |
| 1914 | 3 85 000 |
| 1920 | 3 90 000 |

**වගුව 01:-**

**පාසල්වලට ඇතුළත් කළ සිසු සංඛ්‍යා ඉහළ යාම**

| | 1901 | 1911 | 1921 | 1946 |
|---|---|---|---|---|
| පිරිමි % | 3.7 | 3.8 | 5.2 | 8.4 |
| ගැහැනු% | 3.8 | 1.5 | 2.1 | 4.0 |
| පොදු | 2.6 | 2.7 | 3.7 | 6.3 |

**වගුව 02:-**

**ඉංග්‍රීසි කියවීමට හා ලිවීමට හැකි අයගේ ප්‍රතිශතය**

1901 දී රජය අධ්‍යාපනය වෙනුවෙන් වෙන්කළේ මුළු වැයෙන් 3.5%කි. 1924 දී එය 6.7%ක් දක්වා වැඩිකර තිබුණි. ලාංකීය පිරිමින්ගෙන් 60%ක්ද, ගැහැණුන්ගෙන් 90%ක්ද අකුරු නො දත්හ. 1914දී ස්වභාෂා පාසල්වලට ඇතුළු වන අයගෙන් 8වන පංතිය දක්වා සිටියේ 06%ක් පමණි. 1929 වන විටත් ජනගහනයෙන් 03%ක් වත් ද්විතීයික අධ්‍යාපනය සඳහා ඇතුළත් නොවුණි.

# 03. නිදහස් අධ්‍යාපන හඬ සමාජයෙන් මතුවේ

1910 දී අධ්‍යාපනයේ තත්ත්වය සොයාබලා නිර්දේශ ඉදිරිපත් කිරීමට ජේ. ආර්. බ්‍රිජ් කමිටුව පත් කළ බව ඉහත දී අපි කතා කළෙමු. එහෙත් එයින් ඉදිරිපත් වූ නිර්දේශ ඒ කාලයට සාපේක්ෂව රැඩිකල් බවක් ගත් නිසා එවකට ආණ්ඩුව ඒවා සැලකිල්ලට නො ගත් බව බොහෝ දෙනාගේ මතයයි. එවකට පැවති අධ්‍යාපන තත්ත්වය බ්‍රිජ් වාර්තාවෙන් තදින් විවේචනයට ලක්විය.

ඉංග්‍රීසි පාසල් 179 න් ද්විතීයික පාසල් යැයි නියතව හඳුන්වාදිය හැකි වූයේ 55ක් පමණක් බව එම වාර්තාව පෙන්වා දේ. ඉන් 25ක්ම බස්නාහිර පළාතේ වූ අතර සබරගමුව, වයඹ, උතුරු මැද, ඌව යන පළාත් හතරේ එකදු ද්විතීයික පාඨශාලාවක්වත් නොතිබුණි.

එම පාසල්වල පවා ගොඩනැගිලි ඉඩ මඳ බව, උපකරණ ප්‍රමාණවත් නො වීම දැකිය හැකි විය. ඉංග්‍රීසි පාසල් 179න් 9 ට පමණක් විද්‍යාගාර පැවතුණි. එක් පංතියක ළමයින්ගේ වයස් පරතරය අවුරුදු නවයක් පමණ වූ බව බ්‍රිජ් සඳහන් කර ඇත. වයස 15 පිරීමට පෙර ශිෂ්‍යයන්ගෙන් 48%ක්ම පාසල හැරගොස් ඇත.

කෙසේ නමුත් බ්‍රිජ් ඉදිරිපත් කළ නිර්දේශ සමාජයේ පංති පදනම ආරක්ෂා කිරීමේ රාමුව තුළ ම ඉදිරිපත් කළ බව පෙනී යයි.

1. උසස් වෘත්තීන් සඳහා වරප්‍රසාද ලත් උසස් සමාජ පංතිවලට කේම්බ්‍රිජ් ජ්‍යෙෂ්ඨ තත්ත්වය දක්වා ඉංග්‍රීසි මාධ්‍යයෙන් අධ්‍යාපනය දෙන ද්විතීයික පාසල්. (මේවා එංගලන්තයේ ග්‍රෑමර් පාසල් හා උසස් පාසල්වලට සමාන විය.)

2. රජයේ සේවාවේ සුළු රැකියාවකට හිමිකම් කියන ඊ ළඟ සමාජ පංතියට කනිෂ්ඨ තත්ත්වය දක්වා ප්‍රායෝගික විෂයයන්ට නැඹුරුව ඉංග්‍රීසි මාධ්‍යයෙන් සාමාන්‍ය අධ්‍යාපනය දෙන පාසල්.

3. සමාජයේ දුප්පත් පංතිය සඳහා ඉංග්‍රීසි-ස්වභාෂා පාසල් (සමාජ පරිසරය ගැන නොතකා හැම ළමයෙකුටම වයස 12 වන තෙක් අධ්‍යාපනය දිය යුත්තේ මවු බසිනි.)

මේ නිර්දේශ වෙනුවට ආණ්ඩුව සැලකිල්ලට ගත්තේ මැක්ලවුඩ් කමිටු වාර්තා නිර්දේශයන් ය.

1926 යාපනය දිස්ත්‍රික් මන්ත්‍රී ඒ. කනගරත්නම් මහතා ද අධ්‍යාපනය සම්බන්ධයෙන් වැදගත් යෝජනාවක් ව්‍යවස්ථාදායක සභාවට ගෙන ආවේ ය. එනම්, ස්වභාෂා හා ඉංග්‍රිසි ලෙස පාසල් අතර ඇති බෙදීම අහෝසි කොට භාෂා තුනට ම උගන්වන ගුණාත්මක බවින් උසස් පාසල් ඇතිකිරීම පිළිබඳ අවධානය යොමු කිරීම පිණිස කොමිෂන් සභාවක් පිහිටුවන ලෙසය.

මේ ආදී වශයෙන් සමාජයේ විවිධ අයගෙන් අධ්‍යාපනයේ යහපත් වෙනස්කම් සඳහා ඉල්ලීම් ඉදිරිපත් වන්නට විය. වෘත්තීය සමිති උද්ඝෝෂණවල බලපෑම ද, හුදකලාව හා සංවිධානාත්මකව මතු වූ ජාතික නිදහස හා බැඳුණු ක්‍රියාමාර්ගවල බලපෑම ද, යුරෝපයේ වාමාංශික ව්‍යාපාරයන්ගේ බලපෑම ද යන මේ සියල්ලේ බලපෑම මේවාට තිබූ බව පෙනී යයි. 1909 මැකලම් ප්‍රතිසංස්කරණයන් ද, 1920 හා 1924 මැනිං ප්‍රතිසංස්කරණයන් ද සිදු වූයේ මේ බලපෑම් හේතු කරගෙනය. සර්වජන ඡන්ද බලය හිමිවීම ද මෙහි තවත් ප්‍රතිඵලයකි.

මේ පසුබිම තුල නිදහස් අධ්‍යාපන අයිතිය පිළිබඳ සංවාදය ද ක්‍රමානුකූලව මතු වී සමාජ අවශ්‍යතාවයක් ලෙස කරළියට පැමිණ තිබුණි. මේ අරබයා වැදගත් කාර්යභාරයකට උරදුන් පුද්ගලයා ලෙස සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මහතා ඉතිහාස ගත වී තිබේ. අධ්‍යාපන

ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ඔහුගේ ළැදියාව ද පැවති සමාජ වටාපිටාව ද ඊට ඉවහල් වූ බව ඔහුගේ ජීවන තොරතුරු විමසා බැලීමෙන් පෙනී යයි.



## කන්නන්ගර මහතාගේ ජීවන තොරතුරු

උපත - 1884 ඔක්තෝම්බර් 13 අම්බලන්ගොඩ රන්දොඹේ දී

ප්‍රාථමික අධ්‍යාපනය - අම්බලන්ගොඩ වෙස්ලියන් මෙතෝදිස්ත මිශ්‍ර පාසල

ද්විතීයික අධ්‍යාපනය - ගාල්ල රිච්මන්ඩ් විද්‍යාලය

1898 - රිච්මන්ඩ් විද්‍යාලයේ ශිෂ්‍යත්ව විභාගය සමත් වීම.

1899 - කේම්බ්‍රිජ් ජූනියර් විභාගය සමත් වීම.

1901 - කේම්බ්‍රිජ් සීනියර් විභාගය සමත් වීම.

1904 - අංක ගණිතය සඳහා බ්‍රිතාන්‍ය යටත් විජිතවල

පළමුවැනියා වීම. විශ්වවිද්‍යාල ප්‍රවේශ විභාගයට පෙනී සිටීම.

මෙ කල ලංකාවෙන් ම තෝරාගත්තේ එක් අයකු වීම නිසා සරසවි ප්‍රවේශය අහිමි විය.

1904 අප්‍රේල් 04 - රිච්මන්ඩ් විද්‍යාලයේ ගුරු පත්වීම. නීති විද්‍යාලයට ඇතුළත්ව නීතිය හැදෑරීම

1905 - 1910 - මොරටුව වේල්ස් කුමර විද්‍යාලය, කොළඹ වෙස්ලි විද්‍යාලය, කොල්ලුපිටිය මෙතෝදිස්ත බාලිකා විද්‍යාලය යන පාසල්වල ගුරු වෘත්තියෙ නියැලීම.

1910 ජූලි - නීති විභාගය සමත්වීම.

1911 - 1920 - ව්‍යවස්ථාදායක සභාවට උගත් ලාංකිකයෙකු තෝරා ගැනීමේ ඡන්දයේ දී එයට ඉදිරිපත් වූ මාර්කස් ප්‍රනාන්දු හා පොන්නම්බලම් රාමනාදන් යන දෙදෙනාගෙන් පොන්නම්බලම් රාමනාදන්ගේ ගාලු දිස්ත්‍රික් මැතිවරණ ප්‍රචාරක ලේකම් ලෙස කටයුතු කිරීම. මෙයින් රාමනාදන් ජයගත්තේය.

1916 - ලංකා ප්‍රතිසංස්කරණ ලීගයේ සාමාජිකත්වය ගැනීම.

1918 දෙසැම්බර් 13 - ලංකා ජාතික සංගමය පිහිටුවීමේ අවස්ථාවට සහභාගී වීම.

1922 දෙසැම්බර් 04 - විවාහ වීම.

1925 ජූනි 18 - ව්‍යවස්ථාදායක සභාවේ දකුණු පළාත නියෝජනය කළ ඕ.සී. තිලකරත්න හදිසි අනතුරකින් මිය යාම නිසා පැවති අතුරු මැතිවරණයට ඉදිරිපත්වී ජයගැනීම. ව්‍යවස්ථාදායක සභාවට තේරීපත්වීම.

1926 අගෝස්තු 29 - ව්‍යවස්ථාදායක සභාවට පැවති මැතිවරණයෙන් ජයගැනීම.

1931 මැයි 04 - ව්‍යවස්ථාදායක සභාව විසුරුවා හැරීම සහ යළි ජය ගැනීම.

1931 ජූලි 08 - රාජ්‍ය මන්ත්‍රණ සභාව රැස්වීම හා විධායක සභා

07ට නියෝජිතයින් පත්කිරීම.

1931 ජූලි 09 - අධ්‍යාපන විධායක කාරක සභාවේ සභාපති වීමත් සමග ලංකාවේ පළමු අධ්‍යාපන ඇමතිවරයා ලෙස පත්වීම.

1938 අගෝ 09 - රාජ්‍ය මන්ත්‍රණ සභාවට නව අධ්‍යාපන ආඥා පනතක් ගෙන ඒම.

1940 අප්‍රේල් 04 - අධ්‍යාපනය සම්බන්ධ පරීක්‍ෂා කරන කමිටුවක් අවශ්‍ය බවට මන්ත්‍රණ සභාවට පැමිණි යෝජනාව අනුමත වීමත් සමග එම කමිටුවේ සභාපති ලෙස පත් වීම.

1943 නොවැම්බර් - පරීක්‍ෂණ කමිටු වාර්තාව අවසන් කිරීම හා රාජ්‍ය මන්ත්‍රණ සභාවට ඉදිරිපත් කිරීම.

1944 මැයි 30 - අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා කෙටුම්පත පිළිබඳ රාජ්‍යමන්ත්‍රණ සභාවේ කන්නන්ගර මහතාගේ ප්‍රසිද්ධ දේශනය.

1945 ජුනි 06 - අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා වැඩි ඡන්දයෙන් සම්මත වීම.

1947 - කන්නන්ගර මහතා විසින් අධ්‍යාපන ආඥා පනත ඉදිරිපත් කිරීම.

1947 - මතුගම ආසනයෙන් මහමැතිවරණයට ඉදිරිපත් වූ අතර පරාජයට පත් වීම.

1950 - 52 - ඉන්දුනීසියාවේ ශ්‍රී ලංකා තානාපති ලෙස කටයුතු කිරීම.

1952 - මහමැතිවරණයේ දී අගලවත්ත ආසනයට තරගකර පාර්ලිමේන්තුවට පත්වීම. අමාත්‍යධූරයක් හිමි වීම.

1956 - ක්‍රියාකාරී දේශපාලනයෙන් ඉවත් වීම.

1965 සැප් 23 - මියයෑම.

## අධ්‍යාපනය පිළිබඳ විධායක කාරක සභාව

1. සී. ඩබ්. ඩබ්. කන්නන්ගර
2. එච්. ඩබ්. අමරසූරිය

3. ඩබ්. ටී. බී. කරලියැද්ද
4. ඒ. රත්නායක
5. ජී. ආර්. ද සොයිසා
6. ජී. ඊ. මඩවල
7. එස්. ඒ. වික්‍රමසිංහ

මෙහි සභාපති ලෙස කන්නන්ගර මහතා පත්වේ.

සී.ඩබ්. ඩබ්. කන්නන්ගර මහතා ඉගෙනීමට දක්ෂයෙකු වීමත්, ගුරු පත්වීම් ලැබ පාසල් කීපයක උගන්වා ලද අත්දැකීමුත්, නීති විභාගය සමත් වීමත්, අධ්‍යාපන ක්ෂේත්‍රයට ඔහුගේ තිබූ ලැදියාවත් ඔහු සම්බන්ධව කැපී පෙනෙන කරුණු වේ. නීති විභාගය සමත් වීමෙන් පසු 1911 දී පොන්නම්බලම් රාමනාදන්ගේ ගාලු දිස්ත්‍රික් මැතිවරණ ප්‍රචාරක ලේකම් වීමෙන් දේශපාලනයට ඔහු දැක්වූ උනන්දුව පෙන්නුම් කරයි. 1925 ගාල්ලේ පැවති අතුරු මැතිවරණයට ඉදිරිපත් වී ජයගෙන ව්‍යවස්ථාදායක සභාවට පත් විය. 1926 සහ 1931 දී මැතිවරණවලින් ජයගනු ලැබීය. අධ්‍යාපන අමාත්‍ය වගකීම ලැබෙන්නේ ඉන් අනතුරුවය.

මේ කාලය තුළ අධ්‍යාපනය තුළ යම් යම් වැඩ කොටස් කිරීමට උත්සාහ කළ බව පෙනී යයි. ඒවා අතර 1920 අධ්‍යාපන පනත සංශෝධනය කොට ඉංග්‍රීසි මාධ්‍ය පාසල් වල පස් වන පංතිය දක්වා ස්වභාෂාවන් විෂයක් ලෙස ඉගැන්වීම අනුමත කරගැනීම වැදගත් කරුණකි. ඊට අමතරව

* 1935 විභාග මණ්ඩලයක් පත්කිරීම (පසුව විභාග දෙපාර්තුමේන්තුව වූයේ මෙයයි.)

* 1935 මැලේරියා වසංගතය සමග පාසල් දිවා ආහාර සැපයීම ඇරඹීම යන ඒවා ද වැදගත් ක්‍රියාමාර්ගයන් ය.

මේ කාලයේ 1935 සැප් 12 දා ගලගෙදර ආසනයේ මන්ත්‍රී පී.බී. රණරාජා රටේ අධ්‍යාපන කටයුතු පරීක්ෂාකොට වාර්තාවක් සකස් කිරීමට කොමිසමක් අවශ්‍ය බවට රාජ්‍ය මන්ත්‍රණ සභාවට යෝජනාවක් ගෙන එන ලදී. යෝජනාව ගෙන ආවද ඉන් පසු රජය

මන්ත්‍රණ සභාව විසුරුවා හරින ලදී. මැතිවරණයෙන් ගලගෙදරට පත්වූයේ ඊ.ඒ. නුගවෙලය. ඔහු ඉහත යෝජනා යළි ගෙන එන ලදී. එය සාකච්ඡාවට ලක් වූ අතර පසුව 1939 පෙබරවාරි 09 දා ඒ සම්බන්ධ අධ්‍යාපන විධායක කමිටුවේ යෝජනාව මන්ත්‍රණ සභාවට ඉදිරිපත් විය.

එහි සඳහන් වූයේ වෙනත් කොමිසමක් පත් කරනවා වෙනුවට අධ්‍යාපන විධායක කමිටුවට ම ඒ සඳහා බලය පැවරිය යුතු බවයි. එසේම විධායක කමිටු සාමාජිකයන්ට අමතරව මෙයට අධ්‍යාපන විශේෂඥයින් ප්‍රමාණයක් ද සහභාගී කරගත යුතු බවට යෝජනා විය.

**අධ්‍යාපන විධායක කාරක සභාවට නම් කළ අධ්‍යාපන විශේෂඥයින්,**

1. **අධ්‍යාපන අධ්‍යක්ෂක**
2. **රජයේ ගුරු විද්‍යාලයේ හා රාජකීය විද්‍යාලයේ විදුහල්පති**
3. **එම්. ලෙගොන් පියතුමා**
4. **ආර්. ඩබ්. ස්ටොෆර්ඩ් පියතුමා**
5. **පී. ද එස්. කුලරත්න**
6. **එස්. සිවපාදසුන්දරම්**
7. **ඊ. ඒ. නුගවෙල**

1940 අප්‍රේල් 04 දා මෙම යෝජනාව රාජ්‍ය මන්ත්‍රණ සභාවේ අනුමත වූ අතර කන්නන්ගර මහතා එහි ද සභාපති බවට පත්විය. පරීක්ෂණ කමිටුව රැස් වී තොරතුරු රැස් කිරීමට පුළුල් සමීක්ෂණයක් සිදු කිරීමට තීරණය කරන ලදී. ඒ අනුව ප්‍රශ්න 21 ක් සහිත ආකෘතියක් සකස්කර ජනතා අදහස් විමසන ලදී. එයට සන්දේශ 114 ක් ලැබී තිබූ අතර ඉන් 39 ක් පෞද්ගලික ඒවා විය. රටපුරා 98 දෙනෙක් හමුවී ප්‍රශ්න මාලාව ඉදිරිපත්කර ගැටලු හා තත්ත්වය විමසා බලන ලදී. පරීක්ෂණ කමිටුව මේ සම්බන්ධව රැස්වීම් දිගටම පැවැත්වූ අතර වාර්තාව සකස් කරනවිට වාර 90 ක් රැස්වී තිබුණි. ක්‍රියාවලිය අතරතුර විදුහල්පති එස්. ඒ. පේක්මන්, මහාචාර්ය ජී. පී. මලලසේකර, ජී. කේ. ඩබ්. පෙරේරා, ආර්. එස්. ද සේරම් දේවගැතිතුමා, එන්. නඩරාජා, ජේ. සී.අමරසිංහම්,

අයිවර් ජෙනිංග්ස් යන අයද කමිටුවට හවුල් කරගන්නා ලදී.

1943 සැප්තැම්බර් වාර්තාව අවසන් කරන ලද අතර ලිඛිත වාර්තාව ලියන ලද්දේ කන්නන්ගර මහතා විසින් ම බවද සඳහන් වේ. 1943 නොවැම්බරයේ රාජ්‍ය මන්ත්‍රණ සභාවට වාර්තාව ඉදිරිපත්කරන ලදී.

ඒ අනුව සාකච්ඡා කර සංශෝධිත කෙටුම්පත 1944 ජනවාරි 01 දා අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කරන ලදී. 1944 පෙබරවාරි 07, මාර්තු 06-07 දිනවල ඇමති මණ්ඩලය තුළ සාකච්ඡා කර 1944 මාර්තු 09 දා යළි රාජ්‍ය මන්ත්‍රණ සභා න්‍යාය පත්‍රයට ඇතුළත් කර ගන්නා ලදී. නමුත් එහිදී ප්‍රධාන කොන්දේසියක් ඉදිරිපත් වූ අතර එය නම් මෙම යෝජනා සම්මත වුවද ක්‍රියාත්මක කරන්නේ රටේ මුදල් තත්ත්වය අනුව බවය.

ඒ අනුව 1944 මාර්තු 31 දා අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා සාකච්ඡාවට ගැනීමට නියමිත විය. එහෙත් එදින සාකච්ඡාව ඇරඹුණේ පැය 02 ක් පසුවී ප.ව. 4.30 ට ය. තමාගේ කතාව සම්පූර්ණයෙන් කිරීමට කාල වේලාව මදි බැවින් කතාවෙන් අඩක් ඉදිරිපත් කිරීමට කන්නන්ගර මහතා අකමැති වී තිබේ. නමුත් එවකට සභා නායකව සිටි ඩී. එස්. සේනානායකට අවශ්‍යවූයේ අධ්‍යාපන ඇමතිගේ කතාවෙන් අඩක් එදින ඉදිරිපත් කර ඉතිරි අඩ මැයි මාසයේ දිනයක ඉදිරිපත් කිරීමට සැලැස් වීමය. එයින් එහි වැදගත්කම හැල්ලු කිරීමය. නමුත් අවසානයේ විවාදය කල් තබන ලදී.

විවාදය ආරම්භවූයේ 1944 මැයි 30 දාය. විවාදය දිගට ම පවත්වන ලදී. කන්නන්ගර මහතා ජුනි මස 16 වැනිදා සිය කතාව සිදුකළ අතර එය ඔහුගේ දිවියේ අනුවේදනීයම කතාව බව කියැවේ.

තමාටත්, කමිටුවටත් මුහුණ දීමට සිදු වූ බාධාවන් ද විඳින්නට සිදු වූ අපහාසයන් ද ඔහු විස්තර කරන ලදී. රටේ අධ්‍යාපන දුබලතා පිළිබඳ වාර්තාවෙන් කරුණු සංඛ්‍යා දත්ත ගෙන හැර දක්වමින් සභාවේ අවධානය තදින් ඊට යොමු කිරීමට ඔහු සමත් වී තිබේ. මෙහිදී ඔහු කවිපද කිහිපයක් ද කතාවට එක්කර ගත්තේ ය.

**බක මුහුණු දහවල් - නොදකී කවුඩු රෑ කල්**
**නුනුවණ දන සියල් - දොසිත් නො දකී දිවා රෑ කල්**

ඉංග්‍රීසි ජාතිකයෙකුගේ කවියක් ද ඉදිරිපත් කළ අතර එහි සිංහල අදහසද ඉදිරිපත් කළේ ය. එය මෙසේය.

**නොයනා හිරු රැසසිඳු ගැබ පතුලත**
**අගනා මිණි රැස අඳුරෙම සැඟවෙත**
**පිපෙනා වනයෙහි කුසුමන් නිමනැත**
**හමනා සුළඟින් වනයෙම පරවෙත**

මෙලෙස දීර්ඝ දේශනයක් කළ කන්නන්ගර මහතා කතාව අවසන් කළේ රෝම අධිරාජ්‍යවාදියෙකු වූ ඔගස්ටස්ගේ කියමනක් අනුසාරයෙනි. එනම් තමා රෝමයට එනවිට තිබුණේ ගඩොලින් බැඳි නගරයක් බවත්, තමා යනවිට තිබෙන්නේ කිරිගරුඬින් නිමවූ නගරයක් බවත් ඔගස්ටස් ප්‍රකාශ කළ ආකාරයට ම අප එනවිට තිබුණු මිළ අධික අධ්‍යාපනය වෙනුවට, අධ්‍යාපනය අඩු මිලකට බැස්සුවා, සීල් තබන ලද පොතක් මෙන් තිබුණු අධ්‍යාපනය විවෘත ලියුමක් බවටපත් කළා, ධනවතුන්ගේ ප්‍රවේණියක්ව තිබූ අධ්‍යාපනය දුප්පතුන්ගේ දායාදයක් බවටපත් කළා යයි උදම් අනන්නට මේ රාජ්‍ය මන්ත්‍රණ සභාවට හැකිවුවහොත් එය කොතරම් ශ්‍රේෂ්ඨ දැයි විමසා සිටිමිනි.

ඔහුගේ කතාවට උණුසුම් ප්‍රතිචාර හිමි විය. කතාව අසා සිටි, මේ විවාදයට සවන් දීමට පැමිණ සිටි ඉන්දීය ආණ්ඩුවේ නියෝජිත එම්.එස්. අනේ විශේෂ අමුත්තන්ගේ ගැලරියෙන් බැස පැමිණ කන්නන්ගරට අතට අත දී ආචාරකරන ලදී.

කතාව අවසන් කරනවාත් සමගම නැඟීසිටි සභානායක ඩී. එස්. සේනානායක විවාදය ජූලි 18 දක්වා කල්දැමීමට යෝජනා කරන ලදී. ඊට බලවත් විරෝධයක් සභාවෙන් මතු වූ අතර ජූලි 11 විවාදය ඇරඹීමට තීරණය විය. මෙම විවාදය මාස 15 ක් පුරා පැවැත්වුණි. සංශෝධන 51 ක් ඉදිරිපත් විය. 1945 ජුනි 06 ඡන්ද විමසීම පැවති අතර එය වැඩි ඡන්දයෙන් සම්මත විය. විරුද්ධව ඡන්දය දුන් අය අතර ඩී.

එස්. සේනානායක, ජෝන් කොතලාවල හා ඒ.එෆ්. මොලමුරේ යන අයද වූහ.

## නොමිලේ අධ්‍යාපනය අවශ්‍ය 5% කට පමණක් බව ඩී. එස්. සේනානායක කියයි

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා සම්බන්ධ විවාදය රාජ්‍ය මන්ත්‍රණ සභාවේ පවත්වන ලද්දේ ඒ පිළිබඳ අමාත්‍යංශ මණ්ඩල නිර්දේශ කවරේද යන්න ඉදිරිපත් නොකරමිනි. ඒ අනුව ප්‍රතිසංස්කරණ යෝජනාවන්ට සභාවේ මන්ත්‍රීවරුන්ගේ විරෝධයක් මතු කර ගෙන, යෝජනා ක්‍රියාත්මක කිරීමට මුදල් නොමැති බව ගෙන හැර දක්වමින් එය යටපත් කිරීමට මුල් පුටුවල සිටි අධිරාජ්‍ය ගැති වලව්කාර නායකයින් අදහස් කර ගෙන සිටි බව පැහැදිලිය. ඒ සඳහා ඔවුන්ට කළ හැකි සෑම කූට උපක්‍රමයක්ම භාවිත කරන ලදි.

කන්නන්ගර මහතා සිය දේශනයේදී අධ්‍යාපන ප්‍රතිසංස්කරණ වාර්තාව සමාන කළේ නිදහස් අධ්‍යාපනය නමැති මුතු ඇටය තැන්පත් කර ඇති කරඬුවක් ලෙසය. වාර්තාවේ අනෙකුත් යෝජනා එම කරඬුව අලංකාර කරන සැරසිලි හා කැටයම් යැයි ඔහු කීවේය. මුතු ඇටය කුමක් දැයි මන්ත්‍රීවරයෙකු විමසූ විට ඒ අන් කිසිවක් නොවෙයි ''බාලාංශයේ සිට විශ්වවිද්‍යාල අධ්‍යාපනය දක්වා නොමිලේ අධ්‍යාපනය ලබාදීම'' ලෙස අවධාරණය කළේය.

කන්නන්ගරගේ දේශනයත් බොහෝ මන්ත්‍රීවරු වාර්තාවට පක්ෂව කල ඉදිරිපත් කිරීමත් නිසා ඩී. එස්. සේනානායක, ජෝන් කොතලාවල වැනි අයට තම වුවමනාවන් සඟවා ගන්නට සිදු විය.

සභානායක වශයෙන් කටයුතු කළ ඩී.එස්. සේනානායක විවාදයේ දී පළ කළ අදහස් වලින් මෙය පැහැදිලි වේ. ''ප්‍රශ්නය වන්නේ මුදල් සොයා ගැනීම නොවෙයි, මිනිසුන් සොයා ගැනීමයි, කාර්යමණ්ඩල සොයා ගැනීමයි, ගුරුවරුන් සොයා ගැනීමයි. මේ අඩු පාඩු සපුරා ගත හැකි නම් ඊට පෙර අපි මුදල් සොයා දෙන්නම්. ඕං ඔන්න නිදහස් අධ්‍යාපනය දුන්නාය කියා පුහු වැඩ පිළිවෙළකට කැමැත්ත දක්වන අන්තිම මිනිහා මා විය හැකිය. වහලය නැති ගොඩනැගිලි

හදලා රැකියාවක් කර ගත නො හැකි ටික දෙනෙකුට රස්සාව දීම නිදහස් අධ්‍යාපනය නොවෙයි. ඕනෑ කරන ගුරුවරුන් පුහුණු කරලා සූදානම් වන විට මුදල් දෙන්නම්. හැබැයි නිදහස් අධ්‍යාපනය කියලා වහල නැති ගොඩනැගිලි හදනවට මා විරුද්ධයි. රස්සාවක් කර ගත නොහැකි අයට රස්සාවල් දෙනවටත් මා විරුද්ධයි.''

නිදහස් අධ්‍යාපනය පිළිබඳව අදහස් දක්වමින්, වාර්තාවේ කිසිම තැනක සියලු දෙනාට ම නිදහස් අධ්‍යාපනය ලබා දෙන බව සඳහන් වී නැති බවත්, යෝජනා අනුව පාසල් වර්ග 03ක් බිහි කෙරෙන බවත්, ශාස්ත්‍රීය අධ්‍යාපනය ලබනු ඇත්තේ 5% ක් පමණක් බවත් පැවසූ ඔහු තමාගේ අදහසේ හැටියට නොමිලේ අධ්‍යාපනය ලබා දිය යුත්තේ මේ 5% ට පමණක් බවත් පැහැදිලි කළේය. තමා මේ යෝජනා වටහා ගෙන ඇත්තේ ඒ ආකාරයෙන් බවත් ''නිදහස'' යනුවෙන් තමා අදහස් කරන්නේ තෝරා ගැනීමේ නිදහස බවත් මේ යෝජනාවල එවැනි නිදහසක් පිළිබඳව සඳහනක් නොමැති බවත් තමාගේ අදහසේ හැටියට නම් සියලු දෙනාට ම නොමිලේ අධ්‍යාපනය ලබා දිය යුත්තේ වයස 11 දක්වා හා ඉන් පසුව ශාස්ත්‍රීය අධ්‍යාපනය ලබා දීමට තෝරා ගනු ලබන සිසු පිරිසට පමණක් බවත් පැවසීය.

සියලු දෙනාට ම නිවන් දැකිය නොහැකිය. ටික දෙනෙක් නිවන් දකිති. වැඩි දෙනා සංසාරේ සැරි සරති. මේ රටේ සිටිය යුත්තේ එක නායකයෙකු සහ දෙතුන් සියයක සිවිල් සේවකයන්ය. දොස්තරවරුන් දෙතුන් සියයකි. මේ ටික දෙනා බිහි කිරීමට ශිෂ්‍යයන්ගෙන් 5%කට වඩා අවශ්‍ය නැත. මේ 5% මුළු රටින් ම, සමස්ත ජනතාව අතරින් ම තෝරා ගෙන ඒ අයට නොමිලේ අධ්‍යාපනය ලබා දිය යුතු යැයි කියමින් දේශනය අවසන් කළේය.

ඩී. එස්. සේනානායක සභානායක ලෙසත්, ඇමති මණ්ඩලය නියෝජනය කරමින් කතා කළ නිසාත් මේ ඔහුගේ පැලැන්තියේ ම අදහස බවට විවාදයක් නැත. ඔහු නිදහස් අධ්‍යාපන යෝජනා වහලය නැති ගොඩනැගිල්ලකට සමාන කළ අතර, 05%කට නිදහස් අධ්‍යාපනය හිමි වීම ප්‍රමාණවත් බව කීමට තරම් ''නිර්භීත'' විය.

අධ්‍යාපනය ගැනත්, ජනතාව ගැනත්, රට ගැනත් ඔහුගේ තිබූ දැනුම හා ආකල්ප මෙයින් මැන ගත හැකිය. යෝජනාවට විරුද්ධ වූ

06 දෙනාගෙන් ප්‍රමුඛයා ඩී. එස්. සේනානායක විය.

පුදුමයට කාරණය නම් 1947 පැවැත්වූ මැතිවරණයේ දී ඩී. එස්. සේනානායක මේ රටේ අගමැති ලෙස ජනතාව තෝරා ගැනීමයි. ධනේෂ්වර මැතිවරණ ගැනත්, ප්‍රජාතන්ත්‍රවාදය ගැනත් අගනා පාඩමක් ඒ තුළ අඩංගු වේ. එසේම නිදහස් අධ්‍යාපනය ක්‍රියාත්මක වී පාසල් සිසුන්ට නොමිලේ පෙළ පොත් ලබා දෙන විට ඒවායේ ඩී. එස්. සේනානායකව හඳුන්වා තිබුනේ ''ජාතියේ පියා'' ලෙසය. නමුත් මේ ''ජාතියේ පියා'', නිදහස් අධ්‍යාපනයේ පියා ලෙස නම් ලද සී. ඩබ්. ඩබ්. කන්නන්ගර මහතා ඉදිරිපත් කළ නිදහස් අධ්‍යාපන යෝජනාවලියට විරුද්ධ වූ ජනතා ද්‍රෝහියකු බව සිසු දරු දැරියන් දන්නේ නැත.

එසේම ඩී. එස්. සේනානායක නායකත්වය දුන් එක්සත් ජාතික පක්ෂය ද සිය ප්‍රතිපත්තිය කර ගත්තේ මේ මතය බව දශක ගණනාවක ඉතිහාසය සාක්ෂි දරයි.

අධ්‍යාපන ප්‍රතිසංස්කරණ යෝජනා පිළිබඳ රාජ්‍ය මන්ත්‍රණ සභා විවාදය පැවැත්වෙන අවධියේ ආචාර්ය එන්. එම්. පෙරේරා සිටියේ බෝගම්බර හිර ගෙදරය. එබැවින් ඔහුට විවාදයට සහභාගී වීමට නො හැකි විය. එහෙත් ඔහු හිර ගෙදර සිට ඒ පිළිබඳ පොත් පිංචක් ලියා තිබේ. අධ්‍යාපන යෝජනා ගැන එවකට පැවති වමේ පක්ෂ වල අදහස ඉන් දැන ගත හැකි අතර එහි වැදගත් කරුණු ප්‍රමාණයක් අඩංගු වෙයි.

පළමුවෙන්ම ඔහු අධ්‍යාපන වාර්තාව සැකසූ කොමිසමේ සංයුතිය ඊට ගැලපෙන හා අත්‍යවශ්‍ය එකක් නොවන බව පෙන්වා දෙයි. ඉන් පසුව කමිටුව ආදර්ශයට ගෙන තිබෙන්නේ එංගලන්තයේ පවතින පදනම් බවත් එය පන්ති පදනම් කර ගත් අධ්‍යාපනයක් බවත් පවසයි. පෙර පාසල් අධ්‍යාපනය නොසලකා තිබීමද, පොදු ජන නූගත්කම පිටු දැකීම අවශ්‍ය බව දැක තිබුනත් ඊට ක්‍රියාමාර්ග නැතිකමද අඩුපාඩුවක් ලෙස දක්වා ඇත. තවද නොමිලේ අධ්‍යාපනය 8 වන පන්තිය දක්වා දිය යුතු පදනමේ සිට වාර්තාව සකස් කර පසුව හදිස්සියේ විශ්වවිද්‍යාල දක්වා එය දික් කර තිබෙන බවත්, විය යුතුව තිබුනේ විශ්වවිද්‍යාල දක්වාම නොමිලේ අධ්‍යාපනය දෙන පදනමේ සිට වාර්තාව සකස් කිරීම බවත් පෙන්වා දී ඇත. එසේම ආගමික

අධ්‍යාපනය පිළිබඳ කමිටුවේ ස්ථාවරය බරපතළ ලෙස විවේචනය කර ඇත.

කුමන අඩුපාඩු තිබුනත් මේ යෝජනා විප්ලවීය ස්වරූපයක් ගන්නා බව ද ඔහු සඳහන් කොට ඇති අතර ඊට ඔහුගේ පක්ෂපාතීත්වය ද දක්වා ඇත.

## පනත ක්‍රියාත්මක කිරීම

1945 ජූනි 06 දින සම්මත කර ගත් පනතේ ඇතුළත් ඇතැම් කරුණු 1939 අධ්‍යාපන ආඥා පනතේ නීති රීති වලින් ක්‍රියාත්මක කළ හැකි වුවත් ඇතැම් ඒවාට නව නීති රීති අවශ්‍ය විය. ඒ නිසා ඒවා ඇතුළත් පනතක් 1947 ''අධ්‍යාපන ආඥාපනත '' ලෙස අධ්‍යාපන ඇමති කන්නන්ගර විසින් ඉදිරිපත් කරන ලදි. මෙහි නීති රීති සැකසීම නීතිපති දෙපාර්තමේන්තුවෙන් සිදු කළ අතර එය සැලකිය යුතු ප්‍රමාදයකින් යුතුව සිදු විය. එය යම් දුෂ්ට බලපෑමක් අනුව සිදු වූ බවද පැහැදිලි විය.

පනත ඉදිරිපත් කළ හැකි වූයේ 1947 ජනවාරි 23, එනම් ප්‍රතිසංස්කරණ යෝජනා සම්මත වී මාස 18කට පසුවයි.

එ දින ද සභානායක ඩී. එස්. සේනානායක සභාව කල් තැබීමේ යෝජනාවක් ගෙන ඒමට සූදානම් වූ අතර කතානායක වෛද්‍යලිංගම් දොරේසාමිගේ මැදිහත් වීමෙන් එය වැළකුණි. නිදහස් අධ්‍යාපනයට එරෙහි පිරිසගේ අරමුණ වුයේ 1947 අග රාජ්‍ය මන්ත්‍රණ සභාව විසිරුවා හරින තෙක් කල් අදිමින් නීති රීති සම්මත වීම වැළැක්වීමය. එසේම ඩී. ආර්. විජේවර්ධනගේ ''ඩෙලි නිවුස්'' පුවත් පතද, කතෝලික පල්ලිය හරහා ක්‍රියාත්මක වූ සමහර අයද, මෙම වුවමනාවෙන්ම ක්‍රියාත්මක වූ බව පෙනේ. පනත දෙවන වර කියවීම යෙදී තිබූ 1947 පෙබ. 20 මන්ත්‍රණ සභා නිවාඩු කාලය අවසන් වනතුරු විවාදය කල් තැබිය යුතු යැයි මුලින් පනතට විරුද්ධව ඡන්දය දුන් ඩී. එස්. සේනානායකගේ හිතවතෙකු වූ ඒ. එෆ්. මොලමුරේ යෝජනා කළේය.

මොලමුරේගේ යෝජනාව වැඩි ඡන්ද 02 කින් සම්මත වීම නිසා විවාදය මාර්තු 06දාට කල් තබන ලදි. මේ කාලය තුළ

නිදහස් අධ්‍යාපන පනතට එරෙහි විශාල උද්ඝෝෂණද මතු කරන ලදි. එජාපය ඇතුළු ප්‍රතිගාමී දේශපාලන ව්‍යාපාරත්, කතෝලික සභාව හා ක්‍රිස්තියානි සභාවත් මේවායේ මූලිකත්වය ගත් බව පෙනේ. 1947 පෙබ. 28 කතෝලික නායකයන්ගේ පනතට එරෙහි සංදේශයක් ද ඉදිරිපත් විය. දෙවන වර විවාදය යෙදුනු මාර්තු 06 දිනයේ පනතට එරෙහි අත්සන් සහිත සංදේශයක් පත් කළ මන්ත්‍රී අයි. එක්ස්. පෙරේරා රාජ්‍ය මන්ත්‍රණ සභාවට ඉදිරිපත් කළේය.

එදින පනත ඉදිරිපත් කරමින් කන්නන්ගර මහතා කරුණු දක්වන ලදි. ඔහුගේ කතාව අවසානයේ නැගී සිටි පී. ද එස්. කුලරත්න මන්ත්‍රීවරයා විවාදය එය මසකට කල් දැමීමට යෝජනාවක් ගෙන ආ අතර එය බී. එම්. අලුවිහාරේ මන්ත්‍රීවරයා ස්ථිර කරන ලදි. නමුත් එය යටපත් කිරීමට හැකි විය. මාර්තු 07 විවාදයෙන් පසු විවාදය මාර්තු 30ට කල් තබන ලදි. මේ අතර නිදහස් අධ්‍යාපන පනතට පක්ෂව ද රට පුරා උද්ඝෝෂණ මතු විය.

මැයි 15 පනත දෙවන වර කියවීම සම්මත වූ දිනයේ රාජ්‍ය මන්ත්‍රණ සභා ශාලාව පනතට පක්ෂපාතී වූ ජනයාගෙන් ද භික්ෂූන්ගෙන් ද පිරී තිබූ බව කියවේ. 1947 මැයි 27 දින සංශෝධන සහිතව ඡන්ද විමසීමකින් තොරව පනත තුන් වැනි වර කියවීම සම්මත විය.

දෙවන ලෝක යුද්ධය සමග මතු වූ ආර්ථික අර්බුදය සමග පීඩාවට පත් ජනාතවගේ විරෝධය ද මතු වන්නට විය. 1946 දී කම්කරු මහා වැඩ වර්ජනයක් ලෙස ප්‍රකාශයට පත් වූයේ එයයි. කම්කරුවන් 50,000 ක් පමණ සහභාගී වූ අරගලයට සංවිධානාත්මකව නිසි නායකත්වයක් ලබාදීමට එවකට වමේ නායකයන් අසමත් වීම සමග පාලක පංතිය රාජ්‍ය මර්දනය ක්‍රියාවට නැගීය. කන්දසාමි නම් කම්කරුවා ඝාතනයට ලක්විය.

සෝල්බරි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ 1947 පළමු පාර්ලිමේන්තු මැතිවරණය පැවැත්වුණි. තනි ධනපති පක්ෂයක් ලෙස පැවැතියේ එක්සත් ජාතික පක්ෂය පමණක් වීම නිසා වමේ පක්ෂ එක්ව ක්‍රියාමාර්ග ගත්තේ නම් එජාපය පැරදවීමට ද හැකියාව තිබුණි. මේ නිසා මන්ත්‍රීධුර 95න් 42ක් දිනාගත් එජාපය බලයට පත්විය.

මැතිවරණයේ දී සී.ඩබ්.ඩබ් කන්නංගර මහතා තරග කළේ මතුගම ආසනයෙනි. එජාප අපේක්ෂකයා වූයේ ඔහුය.

එහෙත් ඔහු පරාජයට පත් විය. මැතිවරණ ව්‍යාපාරය තුළ එජාපය ඔහුට සහය නොදුන් බවත්, ඩී.එස් සේනානායක ඔහුගේ රැස්වීම්වලට නොපැමිණි බවත් පසුව කන්නන්ගර මහතා කියා තිබුණි. මෙහිදී පැන නගින ගැටලුවක් නම් නිදහස් අධ්‍යාපන වැඩපිළිවෙලට එරෙහිව සිටි කණ්ඩායමකින් ම මැතිවරණයට ඉදිරිපත්වීමට කන්නන්ගර මහතා තීන්දු කිරීමය. මතුගම ආසනය ජයගත්තේ සමසමාජ පක්ෂයද සහය පළ කළ ස්වාධීනව තරග කළ විල්මට් පෙරේරා ය.

මැතිවරණයෙන් පසුව වුවද එජාපයට එරෙහිව අනිකුත් පක්ෂ හා ස්වාධීන මන්ත්‍රීවරු එක්කරගෙන ආණ්ඩුවක් පිහිටුවීමට යම් හැකියාවක් තිබුණු අතර, එච්.ශ්‍රී. නිශ්ශංක මහතාගේ 'යමුනා' නිවසේ ඒ සඳහා දීර්ඝ ලෙස සාකච්ඡාද පවත්වන ලද නමුත් එය සාර්ථක කර ගැනීමට වමේ නායකයන් අසමත් විය.

එජාප ආණ්ඩුවේ අධ්‍යාපන ඇමැති ලෙස පත්කළ යුතුව තිබුණේ කන්නන්ගර මහතා සමග දිගටම නිදහස් අධ්‍යාපනය වෙනුවෙන් හඬ නැගූ ඒ. රත්නායක වුවත් ඩී.එස් සේනානායක විසින් පත් කළේ ජී.ඒ. නුගවෙලයි. ඔහු ඩි.එස්. සේනානායකගේම මතයේ සිටි අයෙකි.

අධ්‍යාපන අධ්‍යක්ෂක ධූරය සඳහා සුදුසුකම් නොමැති විදේශකයකු වූ ''එම්. ඩබ්ලිව් හවුස්" පත් කිරීමට ඩි.එස් තීරණය කරනලදී. මෙය දැනගත් වහාම ඊට විරෝධය පා ඩබ්.ඒ. සිල්වා අධ්‍යක්ෂක ධුරයෙන් ඉල්ලා අස් වී ඇත. තවත් අය මෙය විවේචනය කළ ද පත් කිරීම සිදු විය. නිදහස් අධ්‍යාපන යෝජනා වලට කණකොකා හඬන්නට පටන් ගත්තේ මේ අයුරිනි.

ඒ අතර එවකට එජාප ආණ්ඩුව අධ්‍යාපන ධවල පත්‍රිකාවක් ප්‍රකාශයට පත් කරන ලදී. අධ්‍යාපන කටයුතු මෙහෙය වූයේ එම නිර්දේශයන් අනුව ය. ඩී.එස් සේනානායකගේ සමීප කුලුපග මිතුරෙකු වූ ඩේලි නිවුස් පුවත්පත් දේශපාලන ලියුම්කරු වූ ජේ. ලයනල් ප්‍රනාන්දු ඔහුගේ ලිපියක මෙසේ දක්වා තිබුණි.

''බොහෝ හදිසියෙන් හා කඩිමුඩියෙන් ඡන්ද දායකයන්

සතුටට පත් කිරීම සඳහා සකසන ලද අධ්‍යාපන ප්‍රතිපත්ති වෙනස් කිරීමට අගමැතිතුමා බලාපොරොත්තු වෙයි. නිදහස් අධ්‍යාපනය ලස්සන ආකර්ෂණීය වචනයක් වුවත් ලංකාවේ ආදායම නිදහස් අධ්‍යාපනය ක්‍රියාත්මක කිරීම සඳහා ප්‍රමාණවත් නොවේ. නොමිලේ අධ්‍යාපනය දුන් පමණින් අධ්‍යාපනය සඳහා වියහියදම් දැරීමට නොහැකි දෙමව්පියන්ගේ දරුවන්ට නේවාසික පහසුකම් හා ආහාර පානාදිය සැපයිය නොහැකි වීමෙන් නිදහස් අධ්‍යාපන ක්‍රමය තුළින් බලාපොරොත්තු වූ ආකාරයට සම අවස්ථා සැලසිය නොහැකිය. විශාල ශිෂ්‍ය පිරිසකට පොත්පත් හා උසස් අධ්‍යාපනය ලබාදීම සඳහා වන පලක් නැති කඩිමුඩි වැඩපිළිවෙළ නවතා කෘෂිකර්මාන්තයට හා කර්මාන්ත ක්ෂේත්‍රයට නැඹුරුවන අධ්‍යාපන ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක කිරීමට අගමැතිගේ බලාපොරොත්තුවයි. දක්ෂ හා වියදම් දැරිය හැකි හා නො හැකි සැම දෙනාට ම විචාරයකින් තොරව ජ්‍යෙෂ්ඨ ද්විතියික අධ්‍යාපනය නොමිලේ ලබාදීම වෙනුවට ඕනෑම ක්ෂේත්‍රයක ඉහළට යාමට හැකිවන පරිදි දක්ෂකම් ඇති ළමයින්ට ශිෂ්‍යත්ව ක්‍රමයක් ක්‍රියාත්මක කිරීම බලාපොරොත්තුවයි. මේ ක්‍රමය එංගලන්තයේ කොන්සර්වැටිව් පක්ෂය ක්‍රියාත්මක කරන අධ්‍යාපන ප්‍රතිපත්තියට සමානය.

ඒ අනුව නිදහස් අධ්‍යාපන වැඩපිළිවෙළට සම්පූර්ණයෙන් ම වෙනස් වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට යොදා ගත් බව පැහැදිලිය.

මේ කාලයේ කන්නන්ගර මහතාට ඉන්දිනීසියාවේ ශ්‍රී ලංකා තානාපති පදවිය පිරිනැමූ නිසා ඔහු ලංකාවේ සිටියේ ද නැත. අගමැති ඩී.එස්. සේනානායකගේ හදිසි අභාවය නිසා ධවල පත්‍රිකාව ඒ අයුරින්ම ක්‍රියාවට නො නැගුණි.

නිදහස් අධ්‍යාපන වැඩපිළිවෙළට එරෙහි වුවත් ස්වභාෂා අධ්‍යාපනය වැළැක්වීමට නොහැකි විය. ඊට හේතුව වූයේ 1951 වන විට ස්වභාෂාවෙන් ඉගෙනගත් ළමයින් පස් වැනි පංතිය දක්වා පැමිණ තිබීමයි. ඒ අනුව 1951 දෙසැ 14 අධ්‍යාපන ඇමැති නුගවෙලට 1953 ජනවාරි සිට හය වන පංතියේ ද 1954 ජනවාරි සිට හත් වන පංතියේ ද 1955 ජනවාරියේ සිට අට වන පංතියේද ඉගැන්වීමේ මාධ්‍ය ස්වභාෂාව

ලෙස නිවේදනයක් නිකුත් කිරීමට සිදුවිය.

වැළැක්වීමට නො හැකි වූ අනෙක් වැදගත් වැඩපිළිවෙළ මධ්‍ය මහා විද්‍යාල වැඩපිළිවෙළයි. ගම්බද ප්‍රදේශවලින් ද මධ්‍ය මහා විශාල පිහිටුවන ලෙස ඉල්ලීම් විශාල ලෙස ඉදිරිපත් වූ අතර එය ජනප්‍රිය වී තිබුණි. එබැවින් එය වැළැක්වීමට අපහසු විය.

1952 මැතිවරණයෙන් අගලවත්ත ආසනයට ඉදිරිපත් වී කන්නන්ගර මහතා පාර්ලිමේන්තුවට පැමිණිය ද ඔහුට අධ්‍යාපන ඇමැතිකම ලැබුණේ නැත. ඊට පත් වූයේ එම්.ඩී. බණ්ඩාය. එවිට අගමැතිවූ ඩඩ්ලි සේනානායක ද පියාගේ ප්‍රතිපත්තිය දිගටම ක්‍රියාවට දැරූ බව පෙනෙන්නට තිබුණි.

1953 පාසල් සිසු සිසුවියන්ට ලබාදුන් දිවා ආහාර නතර කිරීමට තීන්දු කරන ලදී. මෙය 53 හර්තාලයට ප්‍රබල හේතුවක් විය. 53 හර්තාලයට එවකට ලංකා විශ්වවිද්‍යාලය වූ පේරාදෙණිය සිසුන් ද සහය දක්වන ලදී. ඔවුන් අගෝස්තු 11 දා මහනුවර නගරයේ පෙළපාලි ගිය අතර පොලිසිය විසින් ඔවුන්ට පහර දෙන ලදී. සිසුන් හය දෙනෙක් අත් අඩංගුවට පත් විය. අගෝස්තු 12 දා පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජයතිලක ශාලාවේ රැස්වීමක් පැවැත්වූ සිසුන් සිද්ධිය පිලිබඳ සොයාබැලීමට කොමිසමක් පත්කරන ලෙසත් අත්අඩංගුවට පත් අය මුදවා ගන්නා ලෙසත් උපකුලපති නිකලස් ආටිගලගෙන් ඉල්ලා සිටින ලදී.

# 04. සරසවි ඇරඹේ! සටන්ද ඇරඹේ!

## ලංකා විශ්වවිද්‍යාලය ආරම්භ වේ

1901 ජන සංගණන වාර්තාවෙන් ලංකාවේ උසස් අධ්‍යාපන මට්ටම ඉතා ම පහත් තැනක පවතින බව තහවුරු වන අතර එම අඩුපාඩුව පියවීමට නම් විශ්වවිද්‍යාල මට්ටමේ ආයතනයක් අවශ්‍ය බව අවධාරණය විය. 1905 ඇරඹුණු ලංකා ජාතික ප්‍රතිසංස්කරණ සභාවත් 1906 ඇරඹුණු ලංකා විශ්වවිද්‍යාල සංගමයත් විශ්වවිද්‍යාලයක අවශ්‍යතාවය වෙනුවෙන් හඬ නගන ලදී. මෙහි ප්‍රතිඵලයක් ලෙස 1921 දී යුනිවර්සිටි කොලීජිය බිහි විය. එහි ප්‍රථම සභාපති වූයේ ආර්.එස්. මාර්ස් ය. විශ්වවිද්‍යාලය සඳහා ව්‍යවස්ථා සැකසීම භූමි භාග තෝරා ගැනීම හා මුදල් වෙන් කරගැනීම මේ කාලය තුළ කල් ඇදෙමින් ක්‍රියාත්මක විය. මේ පිළිබඳ විවිධ වාද විවාදයන් ද ඇති විය. කන්නන්ගර මහතාද මේ වෙනුවෙන් සැලිකිය යුතු මැදිහත්වීමක් කළ බව පෙනෙන්නට තිබේ.

1938 දී විශ්වවිද්‍යාලය පේරාදෙණියේ පිහටුවිය යුතු බව තීරණය විය. ඉන් පසුව ලංකා වෛද්‍ය විද්‍යාලය සහ යුනිවර්සිටි

කොලීජිය ඒකාබද්ධ කර ලංකා විශ්වවිද්‍යාලය ආරම්භ කළ යුතු බවට පනතක් රාජ්‍ය මන්ත්‍රණ සභාවට කන්නංගර මහතා විසින් ඉදිරිපත් කරන ලදී. එය නම් වූයේ 1942 අංක 20 දරණ ලංකා විශ්වවිද්‍යාල පනත යනුවෙනි. එය 1942 මාර්තු 01 සම්මත විය. පේරාදෙණියේ අක්කර 363 ක භූමි භාගයක එහි වැඩකටයුතු ඇරඹුණු අතර අවසන් වූයේ 1951 දීය. ඒ අනුව සම්පූර්ණ විශ්වවිද්‍යාලයක් ලෙස 1952 ඔක්තෝබර් 04 දා ලංකා විශ්වවිද්‍යාලය පේරාදෙණියේ ආරම්භ විය. කලා, ප්‍රාචීන අධ්‍යාපන විද්‍යා සහ වෛද්‍ය ශිෂ්‍යයන් ලෙස සිසුන් 904 ඇතුළත් කර ගන්නා ලදී. 1953 දන්ත වෛද්‍ය පීඨයත් 1954 කෘෂි සහ පශු වෛද්‍ය පීඨත් ස්ථාපිත කරන ලදී.

## සියලු පාසල් රජයට පවරා ගැනීම

නිදහස් අධ්‍යාපන වැඩපිළිවෙළේ අඩංගු මේ යෝජනාව දිගින් දිගටම ප්‍රමාද වෙනු දක්නට ලැබුණි. 1956 අප්‍රේල් මාසයේ පැවැති මහමැතිවරණයෙන් බලයට පත් වූ මහජන එක්සත් පෙරමුණ ආණ්ඩුව ද එය ක්‍රියාවට නගන බවක් නො පෙනුණි. නමුත් 1956 ඔක්තෝබර් 01 සිට කලින් නතර කරන ලද පාසල් දිවා ආහාරය යළි ලබාදීමට පියවර ගැනුණි. අටවැනි පංතියේ අවසානයේ පැවැත්වුණු අභියෝගයතා පරීක්ෂණය අවලංගු කොට පස් වන පන්තිය අවසානයේ පැවැත්වෙන ශිෂ්‍යත්ව විභාගයට ප්‍රමුඛස්ථානය ලබා දුණි.

උසස් අධ්‍යාපන කටයුතු පිළිබඳ සොයා බැලීමට 1953 ඔක්තෝබරයේ විශේෂ කමිටුවක් පත් කරන ලද අතර එම වාර්තාව 1957 නිකුත් විය. එයට අනුව 1958 පූර්ව උසස් පාඨශාලා සහතික පත්‍ර පන්තියේ ද 1959 සිට උසස් පාඨශාලා සහතික පත්‍ර පන්තියේද ස්වභාෂා මාධ්‍යයෙන් ඉගන්වීම ආරම්භ කළ යුතු විය. එහි වූ තවත් නිර්දේශ කිහිපයක් විය. ඒවා අතර කැපී පෙනෙන නිර්දේශ වූයේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සියලු මාධ්‍ය භාවිතයට ගත යුතු බවත් කොළඹ හා ගාල්ලේ සිංහල මාධ්‍ය විශ්වවිද්‍යාල දෙකක් ඇරඹිය යුතු බවත් මඩකලපුව හා යාපනයේ දෙමළ මාධ්‍යයෙන් ඉගන්වෙන විශ්වවිද්‍යාල දෙකක් ඇරඹිය යුතු බවත් රාජ්‍ය සේවයට

බඳවාගන්නා විභාග සිංහල හා දෙමළ භාෂාවන්ගෙන් පැවැත්විය යුතු බවත්, ලන්ඩන් විශ්වවිද්‍යාලවලින් පවත්වන විභාග අවලංගු කොට ඒවා ලංකාවේ විභාග දෙපාර්තමේන්තු මගින් පැවැත් විය යුතු බවත් ඉංග්‍රීසි භාෂාව දෙවන භාෂාවක් ලෙස ඉගැන්වීමට නොපමාව පියවර ගත යුතු බවත්ය. මේවා බොහොමයක් ක්‍රියාවට නගන ලදී.

1873 ආරම්භ වූ විද්‍යෝදය පිරිවෙනත් 1875 ආරම්භ වූ විද්‍යාලංකාර පිරිවෙනත් මේ වන විට කොළඹ ආසන්නයේ පැවැතිණි. ප්‍රධාන පිරිවෙන් දෙක බෞද්ධ අධ්‍යාපන පීඨ ලෙස ක්‍රියාත්මක වෙමින් පැවැතිණි. මේ පිළිබඳව ඇති වූ සාකච්ඡාවලින් අනතුරුව 1958 අංක 45 දරණ විද්‍යෝදය හා විද්‍යාලංකාර විශ්වවිද්‍යල පනත සම්මත කරගන්නා ලදී. ඒ අනුව 1957 ජනවාරි 01 දා සිට විද්‍යෝදය හා විද්‍යාලංකාර පිරිවෙන් විශ්වවිද්‍යාල බවට පත් කරන ලදී.

විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ පළමු වසර තුන මරදාන මාලිගාකන්දේ විද්‍යෝදය පිරිවෙන් භූමියේ පවත්වාගෙන යන ලදී. පසුව පැපිලියානේ සුනේත්‍රාදේවි රජමහා විහාරයට අයත් ගංගොඩවිල පිහිටි අක්කර 25ක භූමිය පවරාගෙන ඉදිකිරීම් සිදුකරන ලදී.

විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය මුලින් පෑලියගොඩ විද්‍යාලංකාර පිරිවෙන් භූමියේ පවත්වාගෙන ගොස් පසුව දළුගම අක්කර 21ක භූමියක ගොඩනැගිලි ඉදිකිර විශ්ව විද්‍යාලය එය වෙත ගෙන යන ලදී.

පාසල් රජයට පවරාගැනීම ක්‍රියාවට නැඟුනේ 60 දශකය ආරම්භවීමත් සමගය. එතෙක් විවිධ ආකාරයෙන් පවත්වාගෙන යනු ලැබූ පෞද්ගලික පාසල් මේ අනුව රජය යටතට පවරා ගන්නා ලදී.

කොළඹ තවත් විශ්වවිද්‍යාලයක් පිහිටුවිය යුතු බවට ද දිගින් දිගටම අදහස් ඉදිරිපත් විය. 1963 ගුණවර්ධන කොමිෂමේ වාර්තාවේ ද මෙය දක්වා තිබුණි. ඒ අනුව 1967 මුලදී ඒ සඳහා වැඩපිළිවෙළක් සැකසීමට කමිටුවක් පිහිටුවන ලදී. ඒ අනුව 1967 ඔක්තෝබර් මස කොළඹ විශ්වවිද්‍යාලය පිහිටුවන ලදී.

# ශිෂ්‍ය සටන් ඇරඹේ

1953 හර්තාලය සමග පේරාදෙණිය සරසවියෙන් පැන නැගී සිසු උද්ඝෝෂණය ගැන මීට ඉහත සඳහන් කරන ලදී. ඒ අනුව හුදු සිසු ප්‍රශ්න වලට කොටු නොවී පොදු ජන සටන් සමගද සම්බන්ධ වූ ක්‍රියාකාරීත්වයක් පැවැති බව පෙනී යයි. කෙසේ නමුත් වැඩිපුර පැන නැගුණේ ආයතනික ගැටලු සම්බන්ධ අරගලයන් ය.

1965 පමණ විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ඉල්ලීම් 42ක් මුල් කරගනිමින් පංති වර්ජනයක් දියත් විය. මෙයට භික්ෂූන් ඇතුළු සිසුන් 1500ක් පමණ සහභාගි වී තිබේ. ඊට සමගාමීව තම ඉල්ලීම් 22 මුල්කරගෙන කොළඹ විශ්වවිද්‍යාලයේ ශාස්ත්‍රපීඨයේද පංති වර්ජනයක් ක්‍රියාත්මක විය. මෙම ඉල්ලීම් වැඩි ප්‍රමාණයක් ශිෂ්‍ය අධ්‍යන කටයුතු වලට අවශ්‍ය පහසුකම් ඉල්ලා සිටින සුබසාධක ප්‍රශ්න විය.

1965 දෙසැම්බරයේ පේරාදෙණිය විශ්වවිද්‍යාලයේද ඉල්ලීම් 12ක් මුල්කරගත් පංති වර්ජන ව්‍යාපාරයක් පවත්වන ලදී. මෙය මර්දනය කිරීමට උපකුලපතිවරයා විශ්වවිද්‍යාල භූමියට පොලීසියද කැඳවන ලදී. මෙයින් විශාල ගැටුමක් ඇති වූ අතර සිසුන් විශාල පිරිසක් සහ පොලිසියෙන් කිහිප දෙනෙකුද තුවාල ලබන ලදී.

මේ ගැටුමෙන් උපකුලපතිවරයාගේ නිල නිවසට ගිනි තබා තිබූ අතර ඔහුගේ මෝටර් රථයටද ගිනි තබා විනාශ කර තිබුණි.

පසුව මෙම ගැටලුව සොයා බැලීමට විජේසේකර කොමිසම පත් කරන ලදී.

ශිෂ්‍ය ඉල්ලීම් ගණනාවක් මුල් කරගත් සිසු සටනක් 1967 විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ මතු විය. පොලීසිය සමග ද වරින් වර ගැටුම් ඇති විය. 1967 නොවැම්බර් 27 සිසුන් විසින් පරිපාලන අංශයේ සහ ආරක්ෂක අංශයේ ගොඩනැගිලි වලින් සේවකයන් ඉවත් කර බලය අල්ලා ගන්නා ලදී. පොලිසිය මැදිහත් කළ ද වර්ජන ක්‍රියාමාර්ගය අඛණ්ඩව කරගෙන යන ලදී. මේ සම්බන්ධව සොයා බැලීමට ද කොමිසමක් පත් කරන ලදී.

ශිෂ්‍ය අරගල එසේ වර්ධනය වන අතර පැවැති දේශපාලන වටපිටාවට සමගාමීව විශ්වවිද්‍යාල තුළ දේශපාලන ක්‍රියාකාරීත්වයක්

ද දක්නට ලැබුණි. විශේෂයෙන් කොමියුනිස්ට් හා සමසමාජ පක්‍ෂවල හා තවත් දේශපාලන ධාරාවන් ද එක්සත් ජාතික පක්ෂ හා ශ්‍රී ලංකා නිදහස් පක්ෂ දේශපාලන පක්ෂවල නියෝජිතයන් ද සරසවිය තුළ ක්‍රියාකාරී විය. බොහෝ විට මහා ශිෂ්‍ය සංගම් නිලවරණයන් සඳහා අදාළ දේශපාලන පක්ෂයේ නමින්ම ඉදිරිපත් වූ අවස්ථා ද විරල නොවීය. 60 දශකයේ පැවැතියේ එවැනි වටපිටාවකි.

1969 - 1970 කාලයේ එවකට අධ්‍යාපන ඇමැතිවරයා වූ අයි. එම්. ආර්. ඒ. ඊරියගොල්ලට එරෙහිව ශිෂ්‍ය උද්ඝෝෂණ මතු විය. පැවැති විශ්වවිද්‍යාල හතර තුළ ම මෙම විරෝධතා පැන නැගුණි. ඔහුගේ දැඩි ශිෂ්‍ය මර්දන පිළිවෙත මෙම විරෝධයන්ට විශාල ලෙස ඉවහල් විය. විශ්වවිද්‍යාල හතර එක්ව රට පුරා ඊරියගොල්ලට එරෙහිව රැස්වීම් ද පවත්වන ලදී. විශ්වවිද්‍යාල ආචාර්යවරුන්ද මේ රැස්වීම්වලට සහභාගි වීම විශේෂ කාරණයක් විය. ඊරියගොල්ලගේ ආසනය වූ කුලියාපිටිය නගරයේ ද රැස්වීමක් සංවිධානය කළ අතරම එයට සහභාගී වීමට යමින් සිටි විද්‍යෝදය සරසවියේ සිසුන් රැගත් බස් රථයකට බෝම්බ ප්‍රහාරයක් එල්ල විය. එම බෝම්බය බස් රථයේ වහලයේ වැදී ඉවතට විසි නො වූයේ නම් විශාල සිසු ජීවිත ප්‍රමාණයක් අහිමි වීමට ඉඩ තිබුණි. මෙම රැස්වීම සංවිධානය කිරීමට ගොස් සිටි සිසුන් නතර වී සිටි නිවෙස්වලටද මැර ප්‍රහාර එල්ල විය. මේ සිදුවීම් වලින් සිසුන් විශාල පිරිසක් තුවාල ලැබූහ.

මහරගම පැවැති රැස්වීමට සහභාගි වී පැමිණෙමින් සිටි විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ සිසුන්ට විජේරාම හන්දිය අසලදී බෝම්බ ප්‍රහාරයක් එල්ල විය. එවකට මහරගම ආසනයේ එ.ජා.ප.යේ සංවිධායක වු ජිනදාස නියතපාලගේ මැරවරයෝ මෙම ප්‍රහාර එල්ල කරනු ලැබීය. ඉන් සිසු සිසුවියන් රැසක් තුවාල ලැබූ අතර වනිග නායක නම් සිසුවාට බරපතල තුවාල සිදුවිය.

මෙකල වාමාංශික හිමිනමක් වූ කොටගම වාචිස්සර හිමියන් අපවත් විය. එම ආදාහන උත්සවය කොළඹ නිදහස් චතුරස්‍රයේ පවත්වනු ලැබූ අතර දේශපාලන පක්‍ෂ හා බහුජන සංවිධාන ඊට සහභාගී විය. මෙහිදී විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ මහා ශිෂ්‍ය සංගමයේ මහින්ද විජේසේකර වේගවත් කතාවක් කළේය. අධ්‍යාපන ඇමති

ඊරියගොල්ලද කතාවක් කළ අතර එහිදී රැස්ව සිටි සිසුන් එක දිගටම හූ කියන්නට වූහ. ඉන් ඊරියගොල්ලගේ කතාවට මහත් බාධාවක් සිදුවූ අතර ඔහු කතාව අවසන් කළේ ''මගේ කතාවට හූ කී අයටත් නිවන් සැප ලැබේවා" යයි කියමිනි.

# 05. 71 අරගලය හා ශිෂ්‍ය දායකත්වය

1965 ජනතා විමුක්ති පෙරමුණ ක්‍රියාකාරීත්වයට පැමිණීමත් සමග රට පුරා තරුණ හා ශිෂ්‍ය කොටස් මහත් ආශ්වාදයකින් එයට සම්බන්ධ වනු පෙනෙන්නට තිබුණි. විශ්වවිද්‍යාල තුළද මේ තත්ත්වය දක්නට ලැබුණි. ජ.වි.පෙ. ශිෂ්‍ය අංශය විද්‍යෝදය විශ්වවිද්‍යාල තුළ සමාජවාදී සංගමය නමින් ද, පේරාදෙණියේදී දේශප්‍රේමී ශිෂ්‍ය සංගමය නමින්ද ක්‍රියාත්මක විය.

ජනතා විමුක්ති පෙරමුණේ ශිෂ්‍ය කටයුතු බාරව කටයුතු කළේ පියතිලකය. කොළඹ දිස්ත්‍රික්කයේ ශිෂ්‍ය කටයුතු පියසිරි කුලරත්නට පැවරී තිබුණි.

1970 පමණ වන විට ඒ ඒ විශ්වවිද්‍යාලවල බලය හිමි කරගෙන සිටි කණ්ඩායම් විවිධ විය. පේරාදෙණියේ කොමියුනිස්ට් පක්ෂයේ මැල්කම් විජිතපාල, කොලඹ සමසමාජ පක්ෂයේ එච්. ඒ. ජස්ටින් හා කොමියුනිස්ට් පක්ෂයේ ගාමිණී පෙරේරාය.

ඒ අතර ඇමරිකන් ආක්‍රමණයක් සිදු කරන බවට ජ.වි.පෙ.ට විවිධ මාර්ගවලින් තොරතුරු වාර්තාවීම හේතුකොටගෙන 1970 මැතිවරණය එ.ජා.ප.යට එරෙහිව සමගි පෙරමුණට සහය පළ කිරීමට තීන්දුවක් ගෙන තිබුණි. ඒ අනුව ජ.වි.පෙ. ශිෂ්‍ය ක්‍රියාකාරින්ද

මැතිවරණයේදී එ.ජා.ප.යට එරෙහිව සමගි පෙරමුණ දිනවීමට සහය පළ කරන ලදී. ඊරියගොල්ලට එරෙහිව පොදු විරෝධයක් ගොඩනැගී තිබූ නිසා බොහෝ විශ්වවිද්‍යාල සිසුන් කුලියාපිටිය ආසනයේ නතරවී කඳවුරු බැඳගනිමින් ඔහුට එරෙහිව මැතිවරණ ව්‍යාපාරයට සක්‍රියව දායක විය. ඊරියගොල්ලගේ පරාජයට එය ප්‍රබල හේතුවක් විය.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ජ.වි.පෙ. ක්‍රියාකාරින් අතර සිරිවර්ධන (ගට සිරා), සරත් විජේසිංහ, ලයනල් බෝපගේ, උයන්ගොඩ, ලයනල් ප්‍රනාන්දු යන අයද සුමිත් අතුකෝරල සහෝදරයා ද විය. සිරිවර්ධනට නුවරඑළිය පොරමඩුල්ල මහා විද්‍යාලයට ගුරු පත්වීමක් ලැබුණු අතර එහි ශිෂ්‍යයින් අතර විප්ලවවාදී කටයුතුවල නියැලෙමින් සිටියදී අත්අඩංගුවට ගන්නා ලදී.

කොළඹ විශ්වවිද්‍යාලයේ ජ.වි.පෙ. ක්‍රියාකාරින් අතර උපතිස්ස ගමනායක, සුමනරත්න යන සහෝදරවරු ඉදිරියෙන්ම සිටියහ.

විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ 1970 ට පෙර ජී. අයි. ඩී. ධර්මසේකරට බලයට හිමිවී තිබූ අතර (ඔහු සරසවියෙන් ඉවත්වූයේ 1966 දීය.) 1970න් පසු ජනතා විමුක්ති පෙරමුණේ මහින්ද විජේසේකරට බලය හිමි විය. විද්‍යාලංකාරයේ ද කණ්ඩායම් කිහිපයක් සිටි අතර නිතර ගැටුම්ද ඇති විය.

මහින්ද විජේසේකර මහා ශිෂ්‍ය සංගමයේ සභාපති ලෙස පත්වීමත් සමග විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ ජනතා විමුක්ති පෙරමුණට වැඩි බලයක් තහවුරු විය. විද්‍යෝදය සංඝාරාමය ශිෂ්‍ය ක්‍රියාකාරිත්වයේ කේන්ද්‍රස්ථානයක් විය.

1970 විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ ද ජ.වි.පෙ. බලය වැඩි වීම නිසා අනෙකුත් පක්ෂවල (ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, කොමියුනිස්ට් පක්ෂය, සමසමාජ පක්ෂය ඇතුළු) අය එකට එක්වී නිලවරණයකට ඉදිරිපත් විය. දර්ශන පීඨයේ නිලවරණයෙන් ජ.වි.පෙ. අපේක්ෂකයා වූ විමල් වසන්ත විජයවර්ධන සහෝදයාත්, අනෙක් පාර්ෂවයෙන් ඉදිරිපත් වූ අයි. එල්. හේරත් යන දෙදෙනාම සමානව ඡන්ද ගනු ලැබීය. පසුව කාසියක් උඩ දැමීමෙන් ජයග්‍රාහකයා තෝරා ගැනීමට තීන්දු වූ අතර ඒ අනුව අයි. එල්. හේරත් සභාපති බවට පත් විය.

1970 ජූලි 14 දින විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ දී රෝහණ විජේවීර සහෝදරයා විසින් 'සී.අයි.ඒ. කාරයෝ' නමින් දේශනයක් පවත්වන ලදී.

1970 අගෝස්තු 10 හයිඩ් පාර්ක් පිටියේ පැවැත්වූ ජනතා විමුක්ති පෙරමුණේ මංගල රැළිය සඳහා කොළඹ විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ක්‍රියාකාරින් විශ්වවිද්‍යාලයේ සිට පෙළපාළියකින් හයිඩ් පිටියට පැමිණුනි.

විවිධ මාතෘකා ඔස්සේ සම්මන්ත්‍රණ පැවැත්වූ අතර ''අපේ ශිෂ්‍ය ව්‍යාපාරය යොමු විය යුතු මඟ'' නම් තේමාවෙන් ද ජනතා විමුක්ති පෙරමුණ විශ්වවිද්‍යාලවලත් රටපුරාත් සම්මන්ත්‍රණ පවත්වනු ලැබීය. විශ්වවිද්‍යාල හා පාසල් සඳහා දේශප්‍රේමී නමින් පුවත්පතක් ප්‍රකාශයට පත්කරන ලදී. එසේම පාසල් ශිෂ්‍ය කොටස් ඉලක්ක කර ගනිමින් 'රතු කැකුළු' නමින් පුවත්පතක් ද ප්‍රකාශයට පත් කරනු ලැබීය. මෙසේ ශිෂ්‍ය ප්‍රජාව තුළ සැලකිය යුතු දේශපාලන මැදිහත්වීමක් ජනතා විමුක්ති පෙරමුණ විසින් සිදු කරන ලදී.

## අරගලය තුළ...

1971 අප්‍රේල් අරගලයට අදාළව ජ.වි.පෙ. ශිෂ්‍ය අංශයට ප්‍රධාන වශයෙන් පැවරුනේ 500ක පිරිසක් සමග ගොස් යාපනය බන්ධනාගාරයට පහර දී රෝහණ සහෝදරයා නිදහස් කරගැනීමේ වගකීමත්, කොළඹ රොස්මිඩ් නිවාසයේ පදිංචිව සිටි අගමැතිනිය වූ සිරිමා බණ්ඩාරනායක අත් අඩංගුවට ගැනීමත්ය.

යාපනය ප්‍රහාරය සඳහා යන ශිෂ්‍ය පිරිස් දුම්රියෙන්ද, විශේෂ බස්රථයකින්ද යාපනය බලා යන ලදී. එහිදී ඇති වූ සටනේදී විශාල සිසු පිරිසක් මිය ගිය අතර විද්‍යාලංකාර විශ්වවිද්‍යාලයේ විමල් වසන්ත විජයවර්ධන සහෝදරයා ද කොළඹ විශ්වවිද්‍යාලයේ සුමනරත්න සහෝදරයා ද ඒ අයගෙන් දෙදෙනෙකි. එහිදී වෙඩි වැදී බරපතල තුවාල ලබා සිටියදී විමල් වසන්ත ජයවර්ධන සහෝදරයා සමාජවාදයට ජයවේවා! ලෙස කෑ ගැසූ බව අනෙක් අය අසා තිබුණි. මෙහිදී අත්අඩංගුවට ගත් සියලුදෙනා යාපනයේ බන්ධනාගාරගත

කරන ලදී.

රොස්මිඩ් ප්‍රහාරය සඳහා සූදානම් වූ සිසු පිරිස් කොළඹ දිස්ත්‍රික් ශිෂ්‍ය සංවිධායක වූ පියසිරි කුලරත්නගේ මෙහෙයවීමෙන් අප්‍රේල් 04 හා 05 යන දිනවල තැන් කිහිපයකට ස්ථානගත කරන ලදී. මේ අතර එජාප ඔත්තුකරුවකු වූ එඩිසන් ගුණතිලක නැමැත්තා කොළඹ සංවිධානයට සම්බන්ධවී සිට තිබෙන අතර පියසිරි කුලරත්න සමග ගොස් මෙම ස්ථාන සියල්ල දැනගෙන තිබුණි. ඔහු මගින් ජේ.ආර්. ට මෙම තොරතුරු ලැබුණු අතර ජේ.ආර්. වහාම සිරිමාවෝට විස්තර ලබාදී තිබුණි. ඒ අනුව වහාම සිරිමාවෝ අගමැතිනිය රොස්මිඩ් නිවසින් අරලියගහ මන්දිරයට ඉවත් විය. මේ අතර සිසුන් කලින් කතාකරගන්නා ලද ස්ථානවලට (කොටසක් බොරැල්ල බස්නැවතුම්පලේද, රිට්ස් සිනමා ශාලාවේද, තවත් ස්ථාන කිහිපයක) පැමිණියද පියසිරි කුලරත්නගෙන් පණිවුඩයක් ගත නොහැකිවිය. ඒ අනුව යළි කලින් සිටි ස්ථානවලටම යන ලදී. මේ වන විට ආරක්ෂක අංශවලින් එම ස්ථාන දැන සිටි නිසා සියලුදෙනාම පාහේ අත්අඩංගුවට පත් විය.

රට පුරා ම මෙසේ අරගලය තුළ සරසවි හා පාසල් සිසු සිසුවියන් ද විශාල පිරිසක් ජීවිත පුද කළ අතර සැලකිය යුතු පිරිසක් අත්අඩංගුවටද ගන්නා ලදී.



# 71 මර්දනයෙන් ඉක්බිති

71 අරගලය මර්දනය කිරීමත් සමඟ විද්‍යෝදය විශ්වවිද්‍යාල භූමිය වසර කිහිපයක් වධ කඳවුරක් හා පසුව පුනරුත්තාපන කඳවුරක් බවට පත් කරන ලදී. එම කාලය තුළ එහි අධ්‍යාපන කටයුතු කොළඹ ලුම්බිණි විද්‍යාලයට රැගෙන යන ලදී. විද්‍යාලංකාර විශ්වවිද්‍යාලය වසර කිහිපයකට වසා දැමුණේ එහි ආරම්භ කළ වධ කඳවුරු නිසාවෙනි. එසේ විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ සිටි රැඳවියන් අරගලයේ අත්දැකීම් විද්‍යෝදය බිත්ති පුරා සිතුවම් කරන ලද අතර මෑතක් වන තුරුම එවා අරක්ෂා වී පැවතුණි.

අරගලයෙන් පසු ආණ්ඩුවට යම් ප්‍රතිසංස්කරණයන් වෙත යාමට සිදුවූ අතර එය විශ්වවිද්‍යාල හා පාසල් අධ්‍යාපනයටද සාධනීය බලපෑමක් කරන ලදී. 1972දී විශ්වවිද්‍යාල සිසුන්ට බැංකු මගින් සහනදායි පොලී අනුපාතිකයන් යටතේ ප්‍රධාන වශයෙන් ණය ස්වරූපයෙන් මුදල් ආධාර ලබාදෙනු ලැබීය. 1981 මහපොළ හා ශිෂ්‍යාධාර ඇතිකරන තුරු මේ ක්‍රමය පැවතුණි. එසේම සරසවි ප්‍රවේශයේදී අඩු පහසුකම් සහිත දිස්ත්‍රික්ක වල සිසු සිසුවියන්ට අසාධාරණයක් සිදුවීම වැළැක්වීමට දිස්ත්‍රික් පදනම් ක්‍රමය 1974දී හඳුන්වා දෙන ලදී. මුලින් සිසුන් ඇතුළත්කර ගත්තේ ලංකාවෙන්ම වැඩි ලකුණු ලබාගන්නා අනුපිළිවෙළට හෙවත් කුසලතා පදනමිනි. දිස්ත්‍රික් කෝටා ක්‍රමය තුළත් එකම දිස්ත්‍රික්කය තුළ ඇති විශමතාවයන්ට විසඳුමක් නො ලැබුනත් සාපේක්ෂ වශයෙන් ඉදිරිගාමී පියවරකි. 1974 අගෝස්තු 01 දා යාපනය විශ්වවිද්‍යාලය ආරම්භ කරන ලදී.

පොදුවේ විශ්වවිද්‍යාල තුළ ජ.වි.පෙ බලය අඩපණවීමත් සමඟ යළි ආණ්ඩු හිතවාදී කොටස් විශ්වවිද්‍යාල තුළ බලය තහවුරු කරගන්නා ලදී. මෙහිදී සමසමාජ හා කොමියුනිස්ට් පක්ෂ කණ්ඩායම් ඉදිරියෙන් විය. සමසාමාජ පක්ෂය හංස හමුදාව නමින් සංවිධානයක් පිහිටුවා ගන්නා ලදී. එයට සම්බන්ධ වන ලෙස සිසුන්ට බලකිරීම් සිදු වු අතර ප්‍රතික්ෂේප කළ අයට පහරදීම් ද සිදුවිය. මේ සියල්ලේ අරමුණ තවදුරටත් ජ.වි.පෙ. බලය අඩපණ කිරීම ම විය. මෙයින් පසු 1976 පමණ වනතුරු පොදු ශිෂ්‍ය ක්‍රියාකරීත්වයේ නිහඩ බවක් පෙනෙන්නට

තිබේ.

1972 සමගි පෙරමුණු ආණ්ඩුව විසින් විශ්වවිද්‍යාලවලට තෝරාගැනීමේ දී ප්‍රමිතිකරණය හඳුන්වා දෙනු ලැබීය. එනම් දක්ෂතා අනුව නොව ජන අනුපාත අනුව විශ්වවිද්‍යාල වලට බඳවා ගන්නා ප්‍රමාණයන් තීරණය කිරීමය. මෙය පැහැදිලිවම සිංහල ජාතිවාදී පදනමින් තේරූ ක්‍රියමාර්ගයක් වූ අතර උතුරේ තරුණ හා සිසු කොටස් බෙදුම්වාදී ව්‍යාපාර වෙත වැඩි වැඩියෙන් ඇදාගැනීමට හේතු සැපයීමක් විය. මේහිදී ඇතිවන ප්‍රධාන ගැටලුවක් නම් සමසාමාජ, කොමියුනිස්ට් පකෂ හවුල් වූ ආණ්ඩුවකින් මෙ වැනි ජාතිවාදී ක්‍රියාමාර්ග ගැනිමයි.

1976 අප්‍රේල් මාසයේ විද්‍යෝදය විශ්වවිද්‍යාලයේ රෙජී කුරේ නම් ශිෂ්‍යයකු (මොහු වර්තමාන ආණ්ඩුවේ බස්නාහිර පළාත් හිටපු මහ ඇමතිවරයායාය) රහස් පොලිස් අත්අඩංගුවට ගැනීමට එරෙහිව ''කුරේ ආරක්‍ෂක අරමුදල'' පිහිටුවා සිසුන් ඔහුව නිදහස් කර ගැනීමට ක්‍රියාමාර්ග ගනු ලැබීය.

# 06. 1976 විශේෂ සංධිස්ථානයක් ලෙස

70 දශකයේ මැදභාගය වන විට අර්ථික පීඩනය තදින් ජනතාවට දැනෙන්නට වීමත් සමග ජනතා විරෝධය ද මතු විය. සමගි පෙරමුණු ආණ්ඩුව පිරිහීමට පත් විය. 71 මර්දනයෙන් පසු බොහෝ ශිෂ්‍ය සංගම්වල බලය අත්පත්කරගෙන සිටියේ සමගි පෙරමුණු ආණ්ඩුව නියෝජනය කල ශ්‍රීලනිප, සමසමාජ, කොමියුනිස්ට් පක්ෂවල ශිෂ්‍ය සංවිධාන නියෝජනය කළ පිරිස් විසිනි. පේරාදෙණිය ශිෂ්‍ය සංගමයේ බලය 1975 කාලය වන විට හිමිව තිබුණේ කොමියුනිස්ට් පක්ෂයේ ලංකා ජාතික ශිෂ්‍ය සංගමය වෙතය. මහා ශිෂ්‍ය සංගමයේ ලේකම් සරත් ප්‍රේමලාල්ද, සභාපති අබේසේකරද වශයෙන් විය. ඊට අමතරව සරසවිය තුළ සමසමාජ පක්ෂයේ ලංකා ශිෂ්‍ය සම්මේලනයත්, එජාපයේ සමවාදී ශිෂ්‍ය පෙරමුණත් (ඉතා සුළු වශයෙන්) ශ්‍රිලනිපයේ නිදහස් ශිෂ්‍ය පෙරමුණත් (ඉතා සුළු වශයෙන්) පැවතුණි.

1976 පැවති නිලවරණයෙන් සරත් ලියනගේ නැමැත්තකු සභාපති ලෙස පත්විය. මෙම නිලවරණවලින් පසු කා බී විනෝද වීම ඔව්හු පුරුද්දක් බවට පත් කරගෙන සිටියහ. මේ කාලයේ සමගි පෙරමුණ සමග ඇතිවූ මතභේද නිසා කොමියුනිස්ට් පක්ෂය හා සම සමාජ පක්ෂය ආණ්ඩුවෙන් ඉවත්විය. ඒ නිසා සරසවිය තුළටද යම්

ආණ්ඩු විරෝධයක් සම්ප්‍රේෂණය විය.

1976 ප්‍රගතිශීලි සිසු කොටස් එක්වී සමාජ අධ්‍යයන කවය ආරම්භ කළහ. 1971 අරගලයට සම්බන්ධ වී සිරගත වී පසුව නිදහස් ව පැමිණසිටි අයද මෙහි ක්‍රියාකාරී වූහ. ඒ හරහා විවිධ සංවාද පැවැත්වුණි.

එකල සිරිමාවෝ බණ්ඩාරණායක අගමැතිනිය විසින් පේරාදෙණිය මණ්ඩපයේ භූ ගර්භ විද්‍යා දෙපාර්තමේන්තු ප්‍රධානියා වූ පී. ඩබ්. විතානගේ මණ්ඩපාධිපති වශයෙන් පත්කරනු ලැබීය. ඔහුට සිරිමාවෝගේ කිට්ටු ඥාතිකමක් පැවතුණි. ඊට පෙර මණ්ඩපාධිපති වූ පශු වෛද්‍ය පීඨයේ පීඨාධිපති කොඩිතුවක්කු ''රූපා රත්නසීලි" සිදුවීමත් සමග ඇතිවූ ප්‍රශ්න මත ඉවත් කරන ලදී. ''රූපා රත්නසීලි" සිදුවීම යනු නවක වදයට බියෙන් රාමනාදන් ශාලාවෙන් බිමට පනින ලද ශිෂ්‍යාව සම්බන්ධ සිදුවීමය.

විතානගේ පැමිණි වහාම දැඩි නීති රීති පනවමින් සිසු සේවක මර්දනයක් ආරම්භ කරන ලදී. සරසවි වත්තේ අඹ ගෙඩියක් කෑම පවා බරපතල වරදක් ලෙස සැලකූ අතර එවැනි සිදුවීමක් නිසා සරසවි සේවකයෙකුට දඩ ගැසීමක් ද සිදු කරන ලදි.

මණ්ඩාධිපති විරෝධී අරගලයේ සමාජ අධ්‍යන කවය මෙහි ඉදිරියෙන් ම සිටින ලදි. මහා ශිෂ්‍ය සංගමය තුළ යම් පසුබෑමක් දක්නට තිබුණි. විතානගේ සේවකයින් කිහිපදෙනෙකුගේ වැඩ තහනම් කරන ලදි. එයට එරෙහිව සේවක වර්ජනයක් දියත්විය. මෙයත් සමඟ සිසු සේවක එකඟතාවයක් ගොඩනැඟුණි. සේවක වර්ජනයට සිසුන් සහය දීමට ඉදිරිපත් වූ අතර විතානගේ සරසවිය වැසිමට පියවර ගත්තේ ය. සරසවිය වසා දැමීමත්, විවෘත කිරීමත් සාමාන්‍ය දෙයක් බවට පත්විය.

මේ අතර කාන්තා නේවාසිකාගාරවල ''ගජේ'' (ශිෂ්‍ය නේවාසිකාගාර කාමරවල නේවාසිකාගාර නොමැති සිසුන් සහයෝග යෙන් රැඳී සිටීම සරසවි භාෂාවෙන් ''ගජේ'' ලෙස ව්‍යවහාර වේ.) ඇල්ලීමට රාත්‍රි 2.00ට පමණ සරසවි ආරක්ෂ අංශය මැදිහත් කරන ලදි. මෙයට සිසු සිසුවියන්ගේ විරෝධය එල්ල විය. මේ අතර සේවක වර්ජනය අඛණ්ඩ එකක් බවට පත්වුණි. සරසවිය වැසූ විට

ඉහත අවස්ථාවලදි සිසුන් ඉවත් වුණි. පසුව සරසවිය වසා දැමුවත් ඉවත් නොවිය යුතු බවට ''සමාජ අධ්‍යයන කවය'' ප්‍රමුඛ ශිෂ්‍ය ප්‍රජාව තීරණයකට එළැඹුණි.

## පේරාදෙණිය උණුසුම් වේ


මෙය සිසුන් සරසවියෙන් ඉවත් නොවීමට තීන්දු කළේ පළමු වතාවටය. ඒත් සමඟම තවත් අර්බුද මතුවුණි. සේවක වර්ජනය නිසා කෑම ලබාගැනිමේ ගැටලුවක් ඇතිවිය. පිටත හෝටල් වලින් දෙවරක් කෑම ගෙනවිත් දීමක් සිදුවිය. එත් පසුව සිසු සිසුවියන් ශාලාවල පෝලිමේ සිට එක්කෙනා කෑම 02, 03 බැගින් ගෙන කෑම ප්‍රශ්නය බේරාගැනීමට උත්සාහ කරන ලදී. ඒත් උපකුලපති විතානගේ ශාලාවලට පොලීසිය යොදවා කෑම බෙදීම නතර කිරීමට උත්සාහ කළේය. පසුව සිසුන් විසින් රාත්‍රී ආහාර ගෙන එන වෑන් වලට පැන ආහාර පැහැර ගැනීම් සිදුකරන ලදී. ප්‍රතිගාමී ආචාර්යවරු (අලුවිහාරේ) වැනි පිරිසක් කෑම බෙදීම වැනි කටයුතු වලට යොදාගෙන තිබුණි. සංඝමිත්තා ශාලාවේ කෑම බෙදද්දී ආචාර්යවරයකුට කෑම එකකින් පහරදීමක් සිදුවිම පදනම් කරගෙන නැවත සරසවිය වසා දමන ලදී.

1976 නොවැම්බර් 11 උදාවිය. සිසුන් සෙනෙට් ශාලාව වටකර උපකුලපති විතානගේව හිරකර ගන්නා ලදි. එදින රාත්‍රියත් එලෙසම ගතකර පසුදා පාන්දර රඳවා සිටි සිසු කාණ්ඩායම් මාරුවන අවස්ථාව සඳහා අලුත් සිසු කාණ්ඩායම පැමිණෙමින් සිටියහ. පොලීසිය වෙඩිතැබුවේ ඔවුන් වෙතය. වීරසූරිය සිසුවා එතනදීම මිය ගියේය. රත්නායක නම් ශිෂ්‍යාටත් වෙඩි වැදුනි. පොලීසිය විතානගේ මුදා ගන්නා ලදී. මේ සිදුවිම සිදුවුයේ පාන්දර 6ත් 6.30ත් අතරයි.

## විරෝධතා ඇවිලෙයි

වීරසූරිය සොයුරා ඝාතනයත් සමඟ සිසු විරෝධතා ඇවිල යන්නට විය. සමාජ අධ්‍යයන කවයෙන් ඒවාට නායකත්වය දුණි. රට

පුරා පාසල් සිසු විරෝධතා ද පැතිරෙන්නට විය. ආණ්ඩුව උපකුලපති විතානගේ ඉවත්කර ඒ වෙනුවට දේශපාලන විද්‍යා කථිකාචාර්ය ජයසිංහ මහතාව තාවකාලිකව මණ්ඩපාධිපති ලෙස පත්කරන ලදී. මේ නිසා නැවත සරසවිය විවෘත කෙරිණි. මෙකල අධ්‍යාපන ඇමැති ආචාර්ය බදුර්දීන් මහමුද්ය. වීරසූරියගේ මරණය සරසවියේ තබාගැනීමට ඉඩනොදී කුරුණෑගල උහුමීයට හෙලිකොප්ටරයක් මගින් ගෙන යාමට ආණ්ඩුව කටයුතු කළේය. ඇමැතිවරයා විදේශගතව සිටියේය. සිසු විරෝධතා සරසවි, පාසල්, කාර්මික විද්‍යාල දක්වා ව්‍යාප්ත වු අතර වෘත්තීය සමිති හරහා කම්කරුවෝද සම්බන්ධ විය. එවකට කොමියුනිස්ට් පක්ෂය නායකත්වය දුන් පේරාදෙණිය මහා ශිෂ්‍ය සංගමය මෙම උද්ඝෝෂණ දියකර හැරිමටත් විරෝධතා සමනය කිරීමට උත්සාහ කිරීමත් නිසා පොදු සිසුන්ගෙන් සම්පූර්ණයෙන් ප්‍රතික්ෂේප විය. සභාපතිවරයා කතාවක් කිරීමට පැමිණි අවස්ථාවේ සිසුන් විසින් එක දිගට හු කියා ඔහුව පලවා හරින ලදී. සටන් පාඨ අතර ''රට බල්ලට ගියා, බල්ලා රට ගියා'' ''යේකට කොමිෂම තමා දානවා''වැනි ඒවාත් තාප්පවල ලියවුණි. කෙසේ නමුත් මේ සිද්ධියටත් ඒක පුද්ගල කොමිසමක් පත් කරන ලදී. කොමියුනිස්ට් පක්ෂ පාර්ලිමෙන්තු මන්ත්‍රී සරත් මුත්තෙට්ටුවෙගම ශිෂ්‍යයින් වෙනුවෙන් පෙනී සිටියේය. ''පොලීසිය බලය පාවිච්චි කළා වැඩියි'' යනුවෙන් අධිකරණයෙන් ප්‍රකාශ විය. කොමිසම් සභාව තම



**රෝහණ වීරසූරිය සහෝදරයා**

වාර්තාව එළිදක්වන ලද්දේ 1977 පෙබරවාරි 03 වන දාය. වීරසූරිය ඝාතනය සහ සබැඳි සිද්ධීන් සම්බන්ධයෙන් පරික්ෂණ කිරීමට පත් කළ කොමිසම් සභාවේ කොමසාරිස් ලෙස කටයුතු කළේ ඩී. විමලරත්න ශ්‍රේෂ්ඨාධිකරණ විනිශ්චයකාරතුමන්ය.

එම වාර්තාවෙන් නව යෝජනාවක් වශයෙන් ඉදිරිපත් කර තිබුණේ පරිපාලකයන් හා පරිපාලිතයින් අතර නව සම්බන්ධයක් ඇතිවිය යුතු බවයි.'' තරුණ පක්ෂයට අවවාදාත්මක වචනයක් කිමට හේතු ඇති වුයේ යම් සේද එසේ ම තරුණ පිරිස් සමග ප්‍රශ්න නිරාකරණයේදී සිය බලතල මහත් සංයමයකින් පාවිච්චි කිරීම අවශ්‍ය බව පරිපාලකයන්ට අවධාරණයේන් ම කියා සිටිමට මට වුවමනාය. ශිෂ්‍යන් සාමාන්‍යයෙන් හැසිරෙන අන්දම ගැනත්, ගෞරවයකින් සහ වැටහීමකින් යුතුව නව සම්බන්ධතා ගොඩනගා ගැනීමේ හදිසි අවශ්‍යතාව ගැනත් ස්වකීය ආකල්ප වෙනස් කර ගැනීමට නව දෘෂ්ටියකින් බැලිම අවශ්‍යය. අන්‍යෝන්‍ය ගෞරවයකින් සහ වගකීමේ හැඟිමකින් යුක්තව කතාබස් මගින් ප්‍රශ්න විසඳා ගැනීම අවශ්‍ය වන අතර වඩාත් ඉක්මණින් ම අවශ්‍ය වනුයේ දෙපැත්තේ ම නම්බුව රැක ගනිමින් විශ්වවිද්‍යාලයේ මනා පාලනය සඳහා දෙපක්ෂයෙන් ඉටුවිය යුතු සේවයක් අන්‍යෝන්‍ය වශයෙන් පිළිගනිමින් පරිපාලකයන් සහ පරිපාලිතයින් අතර නව සම්බන්ධතාවයක් බිහිකර ගැනීමය.''

මේ කාලයේ ම දුම්රිය සේවක වර්ජනකුත් ක්‍රියාත්මක විය. ආණ්ඩුව පාර්ලිමේන්තුව හරහා එය නීති විරෝධී බවට තීන්දුවක් ගත්තේය. කෙසේ නමුත් වීරසූරිය ප්‍රශ්නය ඇදෙන නිසා ආණ්ඩුව මාස 03 කින් පාර්ලිමේන්තුව නොකැඳවා කල් දැමීය. මෙම හේතුව නිසා හදිසි නීතිය සම්මත කරගැනීමට නොහැකිවිමෙන් හදිසි නීතිය ඉවත් විය. නැවත පාර්ලීමෙන්තුව කැඳවීමකින් තොරවම ආණ්ඩුව විසුරුවා හැරීම සිදුවිය. 1977 මාර්තු පමණ මෙසේ පාර්ලිමේන්තුව විසුරුවා හැර මහ මැතිවරණය 1977 මැයි 27 පවත්වන ලදී.

ඊට පෙර 1977 අප්‍රේල් මාසයේ මහ ශිෂ්‍ය සංගම් තිලවරණය පැවැත්විණි. විලච්චියේ චන්ද්‍රපාල සහෝදරයා මෙම නිළවරණයේ කලාපීඨයේ සභාපති වශයෙන් විශාල වැඩි ඡන්ද ප්‍රමාණයකින් තේරී පත් විය. ඔහු 71 අරගලයට වසර දෙකක් සිරගතව සිට පැමිණි අයෙකි.

ජ.වි.පෙ මධ්‍යම පුවත්පත වූ නියමුවා පළමු කලාපය නිකුත් වූයෙත් මේ දිනවලය. එහි ශීර්ෂ පාඨය වූයේ ''යදම් බිඳිව් යගුළු හරිව්'' යන්නයි. අප්‍රේල් සමරු කවි 18 කුත් එම පුවත්පතේ අඩංගු වී තිබුණි. අප්‍රේල් 04 රාත්‍රී සමරු කවි මුලු සරසවිය පුරාම ලියා අලවා තිබුණි. ඒ කවි සිසුන් හා ආචාර්ය වරුන්ගෙන් සියට 80 පමණ දෙනා පොරකකා බලන්නත්, සටහන් කර ගන්නත් උත්සුක විය. ඉහළ ප්‍රතිචාරායකුත් ලැබුණි. මේ කාලයේ සමාජවාදී ශිෂ්‍ය සංගමයේ සංවිධාන වැඩ කටයුතු කරන ලද්දේ ලලිත් සේනාරත්න සහෝදරයා විසිනි. ඔහු විද්‍යා පීඨයේ ඉගෙනුම ලැබූ අතර පූර්ණකාලීනවම ව්‍යාපාරය වෙනුවෙන් මැදිහත් විය.

සමාජවාදී ශිෂ්‍ය සංගමයේ නමින්ම කලාපීඨයේ නිලවරණයට ඉදිරිපත්විමට තින්දු කරණ ලදී. අපේක්ෂක වුනේ චන්ද්‍රපාල සහෝදරයාය. වැඩි ඡන්ද 700 නික් පමණ චන්ද්‍රපාල සහෝදරයා ජයගනු ලැබීය. ඉන් පසු චන්ද්‍රපාල සහෝදරයා ආකර්ෂණීය කතාවක් සිදුකළේය. ''සිරිමාවෝට 1971 අප්‍රේල් 05 උණ ගැනුණා. 1977 අප්‍රේල් 05 දායින් පසුවත් මැතිනියට උණ ගැනෙන ප්‍රතිඵලයක් ලැබී තිබෙනවා'' යනුවෙනි. විද්‍යා පියයේ කාණ්ඩායම ඉදිරිපත් වුයේ ස්වාධීනවය. ඔවුන්ගේ පීඨ සභාපති වුයේ ශාන්ත බණ්ඩාර සහෝදරයාය. ඔහු මහා ශිෂ්‍ය සංගමයේ ලේකම් විය. එම ජයග්‍රහණය අනෙකුත් සරසවි වලටත් බලපාන ලදි. ඒවායෙත් සමාජවාදී ශිෂ්‍ය සංගමය ජයග්‍රහණය ලැබීම ආරම්භ විය.

1977 මැයි 27 පැවැත්වුණු මහ මැතිවරණයේදී එ ජා පය ප්‍රධාන සටන් පාඨ බවට පත්කර ගත්තේ වීරසූරිය සිදුවීමයි. එ.ජා.ප.යේ සෑම රැස්වීමකම ''සිංහල ඉතිහාස පොතේ රන් අකුරෙන් ලියවුණා. එඩිතර හොඳ සරසවි පුතෙක් ලක්මෑණිට නැතිවුණා'' ලෙස ප්‍රසිද්ධ ගීතයක පද වෙනස් කර භාවිත කලරන ලදී. මැතිවරණයෙන් ශ්‍රිලනිපය ආසන 168න් 8 දක්වා අඩු වී අන්ත පාරාජයක් ලැබීය.

1977 නොවැම්බර් 12 වීරසූරිය සැමරුම පේරාදෙණිය සරසවියේ පැවැත්විණි. ඒ අවස්ථාවට රෝහණ වීජේවිර සහෝදරයාත්, ගමනායක සහෝදරයාත් පුෂ්පෝපහාරය සඳහා සහභාගී වුහ.

# 07. ධර්මිෂ්ඨ ලේබලයෙන් පැමිණි මර්දනයේ නව යුගය

1977 එ.ජා.ප.ය ශ්‍රීලනිපය ආසන 8කට බස්සවමින් 5/6 ක පාර්ලිමෙන්තු බලයක් සහිතව ආණ්ඩුව පිහිටුවිය. එ සමඟම එතෙක් පැවැති රාජ්‍ය ඒකාධිකාරි ධනවාදය වෙනුවට සෘජුවම විවෘත ආර්ථික මොඩලයට ගැලපෙන ලෙස ආර්ථිකය වෙනස් කිරිමට අදාල වෙනස්කම් ආරම්භ කරන ලදී. ඒ අනුව පොදුජන සුභසාධනයන් හා අයිතිවාසිකම් කප්පාදු කරන නීතිරීති, අණපනත් අවශ්‍ය විය. බලය තනිපුද්ගලයකු අත කේන්ද්‍රගත වන ඒකාධිපති බලතල අවශ්‍ය විය.

මේ අනුව ජේ.ආර්. ජයවර්ධන ප්‍රමුඛ එ.ජා.ප පාලනය නව ලිබරල්වාදී ක්‍රමයකට ආරම්භක වටපිටාව සකස් කරන ලදී. එහෙත් ජනතාව රැවටිමට ඔහු යෙදු ආදර්ශ පාඨය වුයේ ''ධර්මිෂ්ඨ සමාජයක්'' යන්නය. 5/6ක මැතිවරණ ජයග්‍රහණය නිසාත්, මැතිවරණයෙන් පසුවද විරුද්ධ පක්ෂ වල පිරිස් වලට හිරිහැර හා පහර දීම් සිදු කිරිම නිසාත් එ.ජා.ප.යේ අත්තනෝමතික, ජනතා විරෝධී ක්‍රියාමාර්ග වලට එරෙහිව පොදු ජනතාව පැත්තෙන් හඬක් මතුවුයේ නැත.

මේ කාලයේම දිලිඳු ජනතාවට ලබාදෙන හාල් පොත් සහනාධාරය කප්පාදු කිරිමටද ආණ්ඩුව පියවර ගනු ලැබීය.

1978 පෙබරවාරි 04 වැනාදා යු.එන්.පී. ආණ්ඩුව නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ගෙන එමට සූදානම් විය. මෙයට එරෙහිව පෙබරවාරි 02 පේරාදෙණිය මහා ශිෂ්‍ය සංගමය සංකේත පංති වර්ජනයක් ප්‍රකාශයට පත්කරන ලදී. මීට සමගාමිව තුල්හිරිය පේෂකර්ම ආයතනයේ ජ.වි.පෙ. වෘත්තිය සමිති හරහාත් විරෝධතා ව්‍යාපාරයක් මතු කරන ලදි.


දවස
සලාක පොත් අහිමිවිම
29 ද සිටයි
ස්ථිර සරසවි කොමිසමක්

සිසු සිසුවියන් පේරාදෙණිය සරසවි බිමේ සිට ගලහ හංදිය දක්වා විරෝධතා පෙළපාලියකින් ගමන් කරන ලදී.

එ.ජා.ප. සමවාදී ශිෂ්‍ය සංගමයට සරසවිය තුල පදනමක් නොතිබිනි. නමුත් ආණ්ඩු බලය තිබිම නිසා ඔවුහු කිහිපදෙනා සිසු විරෝධතාවයට විරුද්ධව විවිධ බධාකිරිම් කිරීමට උත්සාහ කරන ලදී. සිසු පෙළපාලිය එන අතර තුර සමවාදී ශිෂ්‍ය සංගමයේ 13 දෙනෙකු පාර හරස් කර බාධා කිරීමට උත්සාහ කළහ. එයින් ප්‍රකෝප වු සිසුන් මේ පිරිසට පහර දී පන්නා දමනු ලැබීය. මෙම සිදුවිම අදාල කර ගනිමින් එවකට මහා ශිෂ්‍ය සංගමයේ ලේකම් ශාන්ත බණ්ඩාර සහෝදරයා ඇතුලු සිසුන් 08 දෙනෙකුගේ පන්ති තහනම් කරන ලදී. චන්ද්‍රපාල, බෝධි, රිචඩ්, සුනිල් ශාන්ත, සුනිල් රත්නප්‍රිය, සරත් යන අය පන්ති තහනම් වු ඉතිරි 07 දෙනාය.

මෙයින් පසු ශාන්ත බණ්ඩාර සහෝදරයා පූර්ණකාලීනව

ශිෂ්‍ය සංගමයේ ක්‍රියාකාරි විය.

මේ කාලයේ සමාජවාදී ශිෂ්‍ය සංගමය සෑම විශ්වවිද්‍යාලයකම මහා ශිෂ්‍ය සංගම් වලට නායකත්වය ලබා දෙන මට්ටමට සිසුන් අතර තහවුරු වී පැවැතුණි. බොහෝ තැන්වල නිලවරණයෙන්ද, තවත් තැන්වල නිතරගයෙන් ද සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ක්‍රියාකාරින් ශිෂ්‍ය නියෝජිතයින් ලෙස පත් විය. මේ නිසා මහා ශිෂ්‍ය සංගම් එක් වී ගොඩනැගී තිබූ අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බල මණ්ඩලයට ද නායකත්වය සැපයුවේ සමාජවාදී ශිෂ්‍ය සංගමය විසිනි. ඒ අනුව අන්තරය හැම විටම පොදු ශිෂ්‍ය අවශ්‍යතා හඳුනාගනිමින්, එසේම අවශ්‍ය නිවැරදි සටන් ක්‍රියා මාර්ග වෙත මෙහෙයවීමේ දිසාවට යොමු විය.

## සරසවි වලට ඇඟිලි ගැසීමට පනතක්

1978 සැප්තැම්බර් 28 දා ''1978 අංක 16 දරණ විශ්වවිද්‍යාල සංශෝධන පනත'' ගෙන එන ලදී. ඊට අනුව ලංකා විශ්වවිද්‍යාලය හා එහි මණ්ඩප ලෙස පැවැති ව්‍යුහය වෙනුවට සෑම මණ්ඩපයක්ම ස්වාධීන විශ්වවිද්‍යාලයක් කරන ලදී. එසේම විශාල බලතල සහිත විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසම නම් ආයතනය පිහිටුවන ලදී.

පනතට අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සභාපති හා ඉතිරි සමාජිකයන් 04 දෙනාම පත්කිරීමේ බලය ජනාධිපති යටතට පවර ගන්නා ලදී. එසේම අධ්‍යාපනය භාර අමාත්‍යවරයා පනවනු ලබන ඕනෑම විධානයක් මෙම කොමිසම පිළිගත යුතු බවටද එහි සඳහන් වේ. යම්කිසි අවස්ථාවක යම් විශ්වවිද්‍යාලයක් සම්බන්ධයෙන් අමාත්‍යවරයා තීරණය කරන ඕනෑම ක්‍රියාමාර්ගයක් ගැනීමට මේ අනුව ඉඩකඩ ලබාදෙන ලදී.

විශ්වවිද්‍යාලයක පරිපාලන ව්‍යුහය උත්තර මණ්ඩලය, පාලක සභාව, සනාථන සභාව සහ පීඨ මණ්ඩල සහා ආයතන ලෙස සකස් කරනු ලැබීය. ඒ අතර නිල ශිෂ්‍ය සංගම් සතු අයිතිවාසිකම් ද බරපතළ

ලෙස අහෝසිකරන ලදී. එක් විශ්වවිද්‍යාලයක ශිෂ්‍ය සංගමයක්, වෙනත් විශ්වවිද්‍යාලයක් ශිෂ්‍ය සංගමයක් සමඟ ගනුදෙනු කිරීම පවා ඒ අනුව වරදක් සේ දක්වා තිබුනි.

වීරසූරිය සිසු ඝාතනය මැතිවරණ වේදිකාවල අලෙවි කරමින් බලයට පැමිණි එ.ජා. ප. ආණ්ඩුව සිසු අයිතීන් අහිමි කිරීමට පියවර ගත්තේ එසේය.

1978 සැප්තැම්බර් 01දා රුහුණ විශ්වවිද්‍යාලය ආරම්භ කරන ලදී. එහෙත් උසස් අධ්‍යාපනය සඳහා වන අවශ්‍යතාවය සම්පූර්ණ කිරීමට එය කිසිසේත්ම ප්‍රමාණවත් නොවීය.

## මැරයින්ට වැඩ වරදී

එ.ජා.ප.ය ගෙන යන ප්‍රතිපත්ති හා වැඩපිළිවෙළට එරෙහිව දිගටම සිසු උද්ඝෝෂණ ඇති විය. කැළණිය විශ්වවිද්‍යාලයේද මෙවැනි උද්ඝෝෂණ දියත් විය. මෙහිදී එක්සත් ජාතික පක්ෂයට සම්බන්ධ සමවාදී ශිෂ්‍ය පෙරමුණේ පිරිස් ආණ්ඩුවේ බලය ද ආරූඪ කරගනිමින් සිසු උද්ඝෝෂණ අඩපණ කිරීමට උත්සාහ කරන ලදී. මතවාදීව ජයග්‍රණය කිරිමට නොහැකි වූ කළ ඔවුන් ආණ්ඩුවේ මැරයන්ගෙන් උදව් ගැනිමට කටයුතු කළහ. වරින් වර සිසු ක්‍රියාකාරීන්ට පහර දීම්, තර්ජනය කිරීම් සිදු විය.

1978 මාර්තු මස 16 වන දා පෙරවරුවේ සිසුන් උද්ඝෝෂණ සඳහා සූදානම් වෙමින් සිටියහ. උද්ඝෝෂණ මැඩ පැවැත්වීමට සමවාදී ශිෂ්‍ය පෙරමුණේ පිරිස් පිටතින් එ.ජා.ප.යට සම්බන්ධ මැර පිරිස් ගෙන්වාගෙන තිබුණි. ඔව්හු කඩු, කිනිසි, පොලු, බයිසිකල් චේන් ආදියෙන් සන්නද්ධව සිටිහ. මෙයින් සිසුන්ද ප්‍රකෝප වූ අතර විශාල ගැටුමක් ඇතිවිය. ගැටුමේ එක් ප්‍රතිඵලයක් වුයේ පිටතින් පැමිණි මැරයකු වූ ''ක්‍රිස්ටොපර් ජයතිලක '' නැමැත්තා මරණයට පත් වීමය. මෙම සිදුවිමට සැකපිට විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය භික්ෂුවක් වූ බද්දේගම සමිත හිමි අත් අඩංගුවට ගන්න ලදි.

සිද්ධියට අදාල පොලීස් පරීක්ෂණ සිදුකරන ලද අතර සමවාදී ශිෂ්‍ය පෙරමුණේ විද්‍යාලංකාර මණ්ඩපයේ සභාපති වූ ආනන්ද

පෙරේරා දුන් සාක්ෂිය මෙසේය.

''එක්සත් ජාතික පක්ෂයට හිතවත් අන්තර් විශ්වවිද්‍යාලයීය සමවාදී ශිෂ්‍ය පෙරමුණ සංවිධානයේ හිටපු සභාපති මෙන්ම විද්‍යාලංකාර මණ්ඩපයේ සමවාදී ශිෂ්‍ය පෙරමුණේ සභාපතිද මමයි. මෙම සිද්ධිය වුණු දවසේ පෙරවරු 10ට පමණ කැළනියේ දලුගම උණපඳුර හන්දියේ මියගිය අය හා තවත් කිහිපදෙනෙකු සමග කතාකරමින් සිට විශ්වවිද්‍යාලීය භෝජනාගාරයට තේ බොන්නට ගියා. භෝජනාගාරයේ කොරිඩෝවේ අසලට යනවිට වේලාව පෙරවරු 10 පසු වී තිබුණා. අපි එහි යනවිට විශ්වවිද්‍යාල ශිෂ්‍ය කාණ්ඩායම් දෙකක් අතර ගැටුමක ස්භාවයක් තිබුණා. ළමයින් කෑකෝ ගසමින් ඒ මේ අත දුවමින් සිටියා. මේ අතර පුටුවලින් ගැටීමක් තිබුණා. එතන සිසුන් 500ක් පමණ සිටි බව කිව හැකියි. මේ සමගම ස්වාමීන්වහන්සේ නමක් පිටුපසින් පැමිණ, මියගිය ක්‍රිස්ටෝපර්ගේ ඔළුවට පොල්ලකින් ගැහුවා. ක්‍රිස්ටෝපර් බිම වැටුණා. ස්වාමීන්වහන්සේ ආවේ මොන පැත්තෙන්ද කියා දැක්කේ නැහැ. පොල්ල ඔසවන බවයි දැක්කේ. බිම වැටුණු ක්‍රිස්ටෝපර්ගේ හිසට නැවතත් පහර දෙක තුනක් ගැහුවා ඒවා ඔහුගේ ඔළුවට වැදුණු බව කිව හැකියි. එලෙස පහර දුන්නේ බද්දේගම සමිත ස්වාමීන්වහන්සේ බව මම හඳුනා ගත්තා. උන්වහන්සේ විශ්වවිද්‍යාල ශිෂ්‍යයෙක්. ඒ අවස්ථාවේ උන්වහන්සේ සිවුරු පොරවාගෙනයි සිටියේ. මේ හාමුදුරුවෝ වාමාංශික ශිෂ්‍ය සංගමයේ මණ්ඩපයේ උප සභාපති ධූරයට තරග කරලා පැරදිලයි සිටියේ. ඒ වාගේම මියගිය ක්‍රිස්ටෝපර් නිතර විශ්වවිද්‍යාලයට යන එන කෙනෙක් . ඔහු නිතරම විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් ආශ්‍රය කරනවා''

එස්.ඒ. ජයවීර නම් දෙවන වසර සිසුවාගේ සාක්ෂිය මෙසේය.

''මම දෙවන වසර සිසුවෙක් වුවත් විශ්වවිද්‍යාලය තුළ කිසිම දේශපාලන කටයුත්තක යෙදෙන්නේ නැහැ. සිද්ධිය වූ දා පෙරවරු 10.00ට පමණ මම යනවිට ශිෂ්‍ය මධ්‍යස්ථානය වටේ දෙදාහක පමණ ශිෂ්‍ය ශිෂ්‍යාවෝ සහ හාමුදුරුවරුන් රැස්ව සිටියා. විශ්වවිද්‍යාලයේ සමවාදී ශිෂ්‍ය පෙරමුණේ සහ කොමියුනිස්ට් පක්ෂයේ ශිෂ්‍යයන් අතර ගැටුමක් ඇතිවූ බව මට දැනගන්නට ලැබුණා. ඒ වෙලාවේ

කැන්ටිම තුළ ජනෙල් වීදුරු කැඩෙන හඬක් ඇහුණා. ඒ අවට රැස්ව සිටි පිරිස හූ කියමින් ඝෝෂා කරමින් නුවර පාර පැත්තට එක කට්ටියකුත් විශ්විද්‍යාල පැත්තට එක් පිරිසකුත් බෙදී හටියා. මෙම සිද්ධියෙන් මියගිය අය කඩුවක්ද අතේ ඇතිව ඇතුළු වුණා. ඒ සමඟම පැමිණි පිරිස අතර පොලු තිබුණා. ඒ පිරිස විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් නම් නෙවෙයි. ඒ පිරිස කෙලින් ම ඇවිත් ශිෂ්‍ය මධ්‍යස්ථානයේ ප්‍රධාන ගේට්ටුව තුළින් කැන්ටිමට ඇතුළු වුණා. එත් එක්ක ඇතුළෙන් කලබලයක සද්දේ ඇහුණා. විනාඩියකට පමණ පසු පොලු රැගෙන පැමිණි පිරිස ඒවා එහි දමා නුවර පාර පැත්තට දුවගෙන ගියා. මියගිය කෙනා ඊට පස්සේ හෙමින් හෙමින් කළුපාට කමිසයක් හැඳි පුද්ගලයකු සමඟ එලියට එනවා දැක්කා. ඔහුගේ මුහුණේ ලේ තැවැරි තියනවා මම දැක්කා. ඒ සමඟම ශිෂ්‍ය මධස්ථානයේ සිටි ශිෂ්‍යයෝද. පොලු රුගෙන ඔවුන් පසුපස එලවාගෙන ගියා. එවිට මියගිය අය සමඟ පැමිණි කළු කමිසයක් හැඳසිටි පුද්ගලයා ඔහුගේ ඉනේ රඳවාගෙන සිටි බෝතලයක් වැනි දෙයක් ගෙන ශිෂ්‍යයන්ට පෙන්වා එකෙක්වත් එළියට අවොත් බෝම්බ ගහනවා යැයි තර්ජනය කළා.

ඒ තර්ජනය නිසා ශිෂ්‍යයන් ආපසු ගියා. මියගිය අය පසුපසින් එළවමින් ඉදිරියට පැමිණි පිරිස් සමඟ හාමුදුරුවරුන්, ගැහැනු ළමුන් සහ පිරිමි ළමුන්ද සිටියා. බද්දේගම සමිත හිමියන් මම නමින් හඳුනන්නේ නැහැ. නමුත් දුටුවොත් හඳුනාගන්න පුළුවන්. ශිෂ්‍ය පිරිසට ආපසු දුවන්නට හැර තුවාලකරු සමඟ පැමිණ බෝම්බ ගසන බවට තර්ජනය කළ අය බෝම්බයක් දමා ගැසුවා. එය වැටුණේ විශ්වවිද්‍යාල පොත්හල ළඟටයි. ඒකෙන් කාට තුවාල වුණාදැයි මම දන්නේ නැහැ. එහෙත් විශාල ශබ්දයක් නැගුණා. මෙම ගැටුම තවදුරටත් පැතිර ගියහොත් ශිෂ්‍යන්ට අනතුරු සිදුවිය හැකිබව මට තේරුණ නිසා පොලීසියට යාම සඳහා බස්රථයක් එනතුරු මම රැඳී සිටියා. ඒ වනවිට හතළිහක පමණ ගම්මුන් පිරිසක් අවිආයුධ රැගෙන විශ්වවිද්‍යාල භූමිය වෙත දිව ගියා. ඒ ආයුධ රුගෙන ආ පිරිස විශ්වවිද්‍යාල සිසුන් නොවන බව මම දන්නවා. ඉන්පසු මම පැලියගොඩ පොලීසියට ගොස් මේ පිළිබඳව දන්වා සිටියා''

සිදුවීමත් සමග විශ්වවිද්‍යාලය වසාදමන ලද අතර මියගිය ක්‍රිස්ටෝපර්ගේ අවසන් කටයුතු 1978 මාර්තු 19 වන දා සිදුකරන ලදී. මෙම අවමඟුල් කටයුතු සඳහා ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන ද සහභාගී වීමෙන් සිදුවීමේ දේශපාලන සම්බන්ධය තවත් තහවුරු කරන ලදී. ක්‍රිස්ටොපර් ඇතුලු මැර කාණ්ඩායම සරසවි සිසුන්ට පහරදීමට එවා තිබුනේ එවකට කැළණිය ආසනයේ එ.ජා.ප ඇමතිවරයකු වූ සිරිල් මැතිව් විසිනි.

## අයතනික සටන් කිහිපයක්...

ආණ්ඩුවේ රැකීරක්‍ෂා හා යෞවන කටයුතු ඇමතිකම දරණ රනිල් වික්‍රමසිංහ 1979 ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට චාරිකාවක් සඳහා පැමිණීමට උත්සාහ කිරීම නිසා ඊට එරෙහිව සිසු විරෝධතා ඇතිවිය. එ අතර සුබ සාධක ගැටලු ද රැසක් පැවැතුණි. පාලකයින් කළේ අසාධාරණ ලෙස සිසු ක්‍රියාමාර්ග යටපත් කිරිමට උත්සාහ කිරිමයි. ඒ අනුව සිසුන් 135 කගේ පන්ති තහනම් කරන ලදී.

1979 මොරටුව විශ්වවිද්‍යාලයේ ද නවක වද සිදුවිමකට මුවාවී ශිෂ්‍ය සංගම් නියෝජිතයන්ගේ පන්ති තහනම් කිරිමට පාලකයෝ පියවර ගත්හ. මෙයට එරෙහිව මාරාන්තික උපවාසයකට වාඩිවිමට සිසු සංගම් තීරණය කළ අතර එය ක්‍රියාත්මක විය. දින ගණන් ඇදී ගිය අරගලය හමුවේ පාලකයින් පරාජය භාර ගන්නා ලදී.

පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ දුම්බර මණඩපයේ දී (කලා පීඨය පොල්ගොල්ලට ගෙන යන ලදී) සිසු ඉල්ලීම් සඳහා උද්ඝෝෂණ මතුවිය. නේවාසිකාගාර ප්‍රශ්නයද ඒ අතර විය. 1979 සමයේ පරිපාලනය විසින් ඒවා මැඩලීමට පියවර ගත් අතර සිසුන් 26 කගේ පමණ පන්ති තහතම් කරන ලදී. නමුත් එයින් සිදුවුයේ උද්ඝෝෂණ තවත් වර්ධනය වීමයි.

මේ සටන් ක්‍රියාමාර්ග වලින් සිසු ඉල්ලීම් රැසක් දිනා ගන්නා ලදි. 1980 වකවානුවේ අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලයේ සභාපති ලෙස ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ එච්. බී. හේරත් සහෝදරයාත් ලේකම් ලෙස පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ධර්මවර්ධන

මුණසිංහ සහෝදරයාත් කටයුතු කරන ලදී. 1981 අගෝස්තු 01දා නැගෙනහිර විශ්වවිද්‍යාලය ආරම්භ කරන ලදී.

## සමාජවාදී ශිෂ්‍ය සංගමයේ පළමු සමුළුව මුළුදෙයි

1981 පෙබරවාරි 25-26 දී සමාජවාදී ශිෂ්‍ය සංගමයේ මංගල මහා සමුළුව පවත්වා ශිෂ්‍ය ව්‍යාපාරයට විධිමත් සංවිධාන නායකත්වයක්ද තහවුරු කරනු ලැබිය. කොළඹ නව නගර ශාලාවේ පැවැත්වුනු මෙම සමුළුවට විශ්වවිද්‍යාල සියල්ලෙන්ම හා පාසල් අංශය නියෝජනය කරමින් සිසු සිසුවියන් විශාල පිරිසක් සම්බන්ධ විය. රෝහණ විජේවීර සහෝදරයා ප්‍රධාන දේශනය පවත්වමින් ශිෂ්‍ය ව්‍යාපාරයේ අභියෝගයන් පිළිබඳ පුළුල් පැහැදිලි කිරීමක් සිදුකරන ලදී. මෙහිදී සමාජවාදී ශිෂ්‍ය සංගමයට නව ජාතික කමිටුවක් පත්කරග න්නා ලදී. ඊට පේරාදෙණිය විශ්වවිද්‍යාලයෙන් ඩී. එම්. ආනන්ද, ධර්මවර්ධන මුණසිංහ ද ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයෙන් එච්. බී. හේරත් සහ පොන්වීර ද කැළණිය විශ්වවිද්‍යාලයෙන් සමන් පියසිරි ප්‍රනාන්දු ද ආදී වශයෙන් සහෝදර සහෝදරියන් පත්කර ගන්නා ලදී. මෙහි පැවති තවත් විශේෂත්වයක් වූයේ සමස්ත අරාබි විමුක්ති ව්‍යාපාරය (PAN ARAB LIBERATION ORGANIZATION) නියෝජනය කරමින් තිදෙනෙක් සුබ පැතුම් රැගෙන මෙම සමුළුවට සහභාගී වීමයි.

## අධ්‍යාපන ධවල පත්‍රිකාවේ ආගමනය

1952 පමණ එවකට එජාප ආණ්ඩුව අධ්‍යාපන ධවල පත්‍රිකාවක් ඉදිරිපත් කළ බව ඉහතින් සටහන් කරන ලදි. 1977 එජාපය බලයට පත්වීමත් සමඟ ආරම්භ කරන ලද නව ලිබරල්වාදී ආර්ථික ප්‍රතිපත්තියට අනුව නිදහස් අධ්‍යාපන අවස්ථා සීමා කරමින් පෞද්ගලික අංශයට අධ්‍යාපනයේ වගකීම් පැවරීම අවශ්‍ය විය. ඒ අරමුණ සහිතව අධ්‍යාපන නව ධවල පත්‍රිකාව සකස් වූ අතර අනෙකුත් කටයුතු මෙන්ම ආණ්ඩුවේ බලය යොදා ගනිමින් එය ක්‍රියාවට නැගීමට

සූදානම් විය.

ජයවර්ධන ආණ්ඩුව රටට හඳුන්වා දුන් ආර්ථික රටාව විවෘත ආර්ථිකයයි. එනම් බහුජාතික සමාගම් කරුවන්ට රිසිසේ අප රටේ සම්පත් කොල්ල කෑමට ඉඩ දීමයි. අත්‍යවශ්‍ය භාණ්ඩ සියල්ල පිටරටින් ආනයනය කිරීමත්, බහු ජාතික සමාගම් වලට අවශ්‍ය ලාභ ශ්‍රමය සැපයීමත් මුල් කරගත් ආර්ථිකයකට උගත් නිර්මාණශීලී මිනිසුන් අවශ්‍ය නැත. ඒ නිසා රට තුළ නිදහස් අධ්‍යාපනය දියුණු කිරීමක් තබා පවත්වා ගැනීම පවා අවශ්‍ය නැත. එබැවින් සාපේක්ෂව පුළුල් වූ අධ්‍යාපන අවස්ථා තවතවත් හැකිලිය යුතුය. 1981 ගෙන ආ අධ්‍යාපන ධවල ප්‍රත්‍රිකාවේ සැබෑ අරමුණ එයයි.

ඒහි යෝජනා වූ කරුණු අතර,

(1) අනිවාර්ය අධ්‍යාපන සීමා 10 ශ්‍රේණියේ සිට 08 ශ්‍රේණිය දක්වා පහත දැමීම හා 08 ශ්‍රේණියේ දී සහතිකයක් ලබා දීම.

(2) සාහිත්‍ය හා ඉතිහාසය පාසල් විෂය මාලාවෙන් ඉවත් කිරීම.

(3) පාසල් අධ්‍යාපනයට අඛණ්ඩ ඇගයීම් හඳුන්වා දීම.

(4) පාසල් අධ්‍යාපනයේ බර දෙමාපියන් මත පැවැරීම.

(5) පහ ශ්‍රේණියේ ශිෂ්‍යත්ව විභාගය අහෝසි කිරීම.

(6) පර්ෂද පාසල් හඳුවා දීම.

(7) පර්ෂද විදුහල්පතිවරු ලෙස දේශපාලන පත්වීම් හඳුන්වා දීම.

(8) මුදල් අයකරන පෞද්ගලික හා අර්ධ පෞද්ගලික පාසල්වලට අවසර දීම.

(9) සරසවි ප්‍රවේශයට ඉංග්‍රිසි අනිවාර්ය කරවීම.

යන අරමුණු අඩංගු වී තිබුණි.

මේ වන විට 1980 ජූලි මහා වැඩ වර්ජනය පොඩි පට්ටම් කර තිබූ ආණ්ඩුව, ඒ හැන්දෙන්ම ශිෂ්‍ය ව්‍යාපාරය සමගද ගනුදෙනු

බේරා ගැනීමට සැරසෙන බව පෙනෙන්නට තිබුණි. ජූලි වර්ජකයින් කෲර ලෙස මර්දනය කල අතර 1,14,000කගේ පමණ රැකියා අහිමි කරන ලදි. කම්කරු ව්‍යාපාරයට සෘජුව ම රටේ ආර්ථිකයට බලපෑම් කළ හැකි අතර, ඒ නිසා වැඩ වර්ජන ක්‍රියාමාර්ගයක් මගින් විශාල බලපෑමක් සිදු කළ හැකිය. එම බලපෑම කළ හැකි කම්කරු ප්‍රජාවගේ බලයද එසේම විශාලය. කම්කරු වර්ජනයක් සමඟ සසඳන විට ශිෂ්‍ය උද්ඝෝෂණයක් හෝ ශිෂ්‍ය පන්ති වර්ජනයක් මඟින් කළ හැකි බලපෑම ඉතා අවම බව පෙනී යයි. ඒ නිසා ශිෂ්‍ය උද්ඝෝෂණ කොතරම් මතු වුවත් තම අරමුණු ඉටු කර ගත හැකි වෙතැයි එ.ජා.ප. ආණ්ඩුවේ නායකයින් ගණන් බලන්නට ඇත.

මේ කාලය වන විට අන්තර් විශ්වවිද්‍යාලීය ශිෂ්‍ය බල මණ්ඩලය සමස්ත ශිෂ්‍ය ව්‍යාපාරයම මෙහෙය විය හැකි ලෙස ගොඩ නැගී තිබුණි. සමාජවාදී ශිෂ්‍ය සංගමය ඊට නිසි මඟ පෙන්වීම ලබා දෙමින් සටන් ක්‍රියාමාර්ගයන්හි ඉදිරියෙන්ම කටයුතු කරන ලදී. අ.වි.ශි.බ.ම.යේ සභාපති ලෙස වගකීම දැරුවේ ඩී.එම්. ආනන්ද සහෝදරයාය.

අධ්‍යාපන ධවල පත්‍රිකාව පිළිබඳවත් පුළුල් ලෙස පළමුව ශිෂ්‍ය ප්‍රජාවත්, විවිධ සමාජ ක්‍රියාකාරී බලවේගයනුත්, පොදු ජනතාවත් දැනුවත් කිරීමට වැඩසටහන් සකස් කරන ලදි. එසේම විරෝධතා ක්‍රියාමාර්ග විශ්වවිද්‍යාලවලට පමණක් සීමා නො කොට රට පුරා පැතිරුණු විරෝධතා ව්‍යාපාරයක් සැලසුම් කරනු ලැබීය.

සැලසුම් කළ පරිදිම 1982 මුල සිටම උද්ඝෝෂණ පාසල් දක්වාත්, කාර්මික විද්‍යාල ආදිය දක්වාත් ව්‍යාප්ත විය. ආණ්ඩුව පොලීසිය යොදවමින් උද්ඝෝෂණ මර්දනය කිරිමට උත්සාහ කළ ද ඒවා සාර්ථක නොවීය. ධවල පත්‍රිකාවට එරෙහිව රැස්වීම්, සාකච්ඡා රටපුරා පවත්වන ලදි.

1982 දී කොලඹ හයිඩ් පිටියේ අධ්‍යාපන ධවල පත්‍රිකාවට එරෙහි රැලියක් අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බල මණ්ඩලය මඟින් සංවිධානය කරන ලද අතර යාපනය විශ්වවිද්‍යාලය ද ඇතුළුව සියලු විශ්වවිද්‍යාල වලිනුත්, පාසල් හා අනෙකුත් අධ්‍යාපන ආයතන වලිනුත් සිසු සිසුවියන් විශාල පිරිසක් සම්බන්ධ විය.

මේ අතර ආණ්ඩුව මාධ්‍ය මගින් වහසිබස් ප්‍රකාශ කරමින්

කවුරු විරුද්ධ වුවත් පනත පාර්ලිමේන්තුවට ගෙන එන බවත් සම්මත කරගන්නා බවත් ප්‍රකාශ කළේය. ධවල පත්‍රිකාවට අදාල අධ්‍යාපන ප්‍රතිසංස්කරණ පනත පාර්ලිමේන්තුවට ගෙන ඒමට නියමිත දිනයේ අන්තරය විසින් පාර්ලිමේන්තුව වටලෑමේ උද්ඝෝෂණයක් සංවිධානය කරන ලදි. විශ්වවිද්‍යාල සියල්ල ම නියෝජනය කරමින් සිසු සිසුවියන් දහස් ගණනක් ඊට සහභාගී වීමට පැමිණි අතර උද්ඝෝෂණයේදී පොලීසිය විසින් අමානුෂික පහර දීමක් සිදු කරන ලදි. පොලීසියේ අශ්වාරෝහක පොලීසිය යොදා ගෙන පහර දුන් අතර බිම වැටුනු සිසුවියන් පවා අශ්වයින් ලවා පාගවන ලදි.

කෙසේ නමුත් මේ අමානුෂික මර්දනයත් සමඟ ආණ්ඩුවට විශාල අප්‍රසාදයක් එල්ල විය. ඒ වන විට ආණ්ඩුව නිදහස් අධ්‍යාපනය විනාශ කිරීමට සූදානම් වන බවට ප්‍රබල ජන මතයක් ගොඩනැගීමට අන්තරය සමත් වී තිබුණි. මේ සියලු හේතු නිසා පනත පාර්ලිමේන්තුවට ඉදිරිපත් කිරීම වැළකුණි. අධ්‍යාපන ධවල පත්‍රිකාවට එරෙහි සටන ලාංකීය ශිෂ්‍ය ව්‍යාපාරය ජයග්‍රහණය කළේය. 5/6 ක පාර්ලිමේන්තු බලයක් ද, ඒකාධිපති විධායක බලයක් ද සහිත, කම්කරු වැඩ වර්ජන පොඩි පට්ටම් කළ ආණ්ඩුවක් ශිෂ්‍ය ව්‍යාපාරය ඉදිරියේ දණ ගසනු ලැබීය.

ඒ අන් කිසිවක් නිසා නොව තම අරමුණු ජයග්‍රහණය කිරීමෙන් මෙපිට කිසිවක් බලාපොරොත්තු නො වන, පාවා නොදෙන අභීත නායකත්වයක් ශිෂ්‍ය ව්‍යාපාරය සතු වීමය. අවංක විප්ලවවාදී සිසු නායකයින් එය මෙහෙය වූ නිසාය. එමෙන්ම පොදු ජන මනෝභාවයන් හඳුනාගත්, ක්‍රියාමාර්ග නිවැරදව තක්සේරු කරමින් උපාය උපක්‍රම තේරීමට සමත් නායකත්වයක් ශිෂ්‍ය ව්‍යාපාරය සතු වීම ය.

## මර්දනය දිගටම

1980 වසරේ පේරාදෙණිය සරසවියේ සිදුවූ සිසු ගැටුමක් මුල්කරගෙන පරිපාලනය විසින් සිසුන් 60කගේ පමණ පන්ති තහනමක් සිදුකරන ලදී. ඔවුන්ගේ පන්ති තහනම ඉවත් කරන ලෙස ඉල්ලමින් සිසු උද්ඝෝෂණයක් මතු විය. පසුව එය මාරාන්තික උපවාසයක්

මට්ටමටම තල්ලු විය. එහෙත් පරිපාලනය මේ ප්‍රශ්නය නො දුටුවාක් මෙන් කටයුතු කළහ. මේනිසා උණුසුම් වටපිටාවක් ගොඩනැගුණු අතර වෙනත් විශ්වවිද්‍යාලවල සිසුන් ද සිසු සටනට සහාය පිණිස පේරාදෙණියට පැමිණ තිබුණි. මෙහිදී කිසියම් සිසු පිරිසක් විද්‍යා පීඨයේ පීඨාධිපති වූ ඩයස් මහතා බලහත්කාරයෙන් උපවාසය පැවති ස්ථානයට රැගෙන එන ලද අතර බලහත්කාරයෙන් එහි රඳවාගන්නා ලදී. මෙය ඉතා බරපතළ සිදුවීමක් වූ අතර මේ පිළිබඳ පරීක්ෂාකිරීමට විශ්‍රාමලත් ශ්‍රේෂ්ඨාධිකරණයේ අගවිනිසුරුවරයකු වූ සී. වී. උදලාගම මහතාගේ මූලිකත්වයෙන් කොමිෂමක් පිහිටුවන ලදී. එහි වාර්තාව 1983 දී පමණ නිකුත්වූ අතර එමගින් ශිෂ්‍ය ක්‍රියාකාරීන් විශාල පිරිසකගේ ශිෂ්‍ය භාවයන් අහෝසි කිරීම හා පන්ති තහනම් කිරීම් කරන ලදී. ඉංජිනේරු පීඨයේ රංජිතම් ගුණරත්නම් සහ ආනන්ද ඉඩමේගමත්, විද්‍යා පීඨයේ ලලිත් විජේරත්නත් යන සහෝදරවරුන්ගේ ශිෂ්‍යභාවයන් අහෝසිකරන ලද්දේ මෙමගිනි.

## හොර වෙද කඩය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල සංශෝධන පනතේ පැවැති නීතිමය ප්‍රතිපාදන යොදාගනිමින් 1981 දී ආණ්ඩුව ගැසට් නිවේදනයක් නිකුත්කර ''උතුරු කොළඹ වෛද්‍ය විද්‍යාලය '' නමින් පෞද්ගලික ආයතනයක් පිහිටුවීය. 1981 ඔක්තෝබර් මස පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයේ අධ්‍යයන කටයුතු කොළඹ නාලන්දා විද්‍යාලයේ ගොඩනැගිලිවල ආරම්භ කරන ලදී.

නව ලිබරල් ආර්ථික ප්‍රතිපත්තිය ක්‍රියාවට නගන විට අධ්‍යාපනය ද ලාභ උපයන මාධ්‍යයක් බවට පත් කර ගතයුතුය. එහිදී වෛද්‍ය අධ්‍යාපනය යනු ඉහළින්ම මිල කළ හැකි වෙළඳ භාණ්ඩයකි. ඒ සඳහා පාර කපාගැනීම ආණ්ඩුවේ අරමුණ වු බව පැහැදිලිය. පෞද්ගලික වෛද්‍ය උපාධි පිරිනමන උසස් අධ්‍යාපන ආයතන පිහිටුවීම ඒ අනුව අවශ්‍ය විය.

තෝරාගන්නා ලද භූමි භාගයේ කිසිදු ගොඩනැගිල්ලක් ඉදිකර නොමැතිව, අයදුම් කිරිමේ ක්‍රියාපටිපාටියත්, අඥාපනතේ වගන්තිත්

උල්ලංඝනය කරමින් ගැසට් නිවේදනය නිකුත් කිරීමෙන් ආණ්ඩුවට මේ සඳහා පැවැති ''හදිසිය'' පැහැදිලිවෙයි.

ආරම්භයේදී ම අන්තරයේ මූලිකත්වයෙන් මීට එරෙහිව උද්ඝෝෂණ සිදුකරන ලදී. එහෙත් වෛද්‍ය පීඨවල ඒ වන විට අධ්‍යාපනය ලබමින් සිටි සිසු සසුවියන් ගෙන් ඊට හොඳම දායකත්වයක් ලබාගත හැකි වූයේ නැත. එහෙත් අන්තරය දැනුවත් කිරීම් හා උද්ඝෝෂණ දිගටම කරගෙන යන ලදී.

## ජේ.ආර්. මැතිවරණ සිතියම අකුලයි

1982 ජනාධිපතිවරණය පවත්වා විධායක පුටුවේ බලය තහවුරු කරගත් ජේ.ආර්. ජයවර්ධන 1983 පැවැත්වීමට නියමිත මහමැතිවරණය වෙනුවට, මහ මැතිවරණයක් අවශ්‍යද? නැද්ද? යන්න විමසන ජනමත විචාරණයක් කැඳවන ලදී. මෙය සිදු කලේ පැහැදිලිවම පාර්ලිමේන්තුවේ 5/6 බලය දිගටම රැකගැනීමටත්, නැගෙමින් පැවැති ජනතා විරෝධය යටපත් කිරීමත්, විශේෂයෙන් ජනතා විමුක්ති පෙරමුණට පාර්ලිමේන්තුවට පැමිණීමේ ඉඩ අහෝසි කිරීමටත් ය. ඒ අනුව ලාම්පු, කළගෙඩි මැතිවරණය පැවැත්වූ අතර සියලු ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රම භාවිත කරමින් ඒ.ජා.ප.ය ජය ගන්නා ලදී.

එසේම 1983 කළු ජූලිය නිර්මාණය කර, එයට මුවා වී ජනතා විමුක්ති පෙරමුණ ඉතාම අයුක්ති සහගත ලෙස තහනම් කරන ලදී. මේ සමග ම නව සමසමාජ පක්ෂයත්, කොමියුනිස්ට් පක්ෂයත් තහනම් කලද ඉක්මණින්ම එවායේ තහනම ඉවත්කරන ලදී.

## ශිෂ්‍ය සභා තහනම්

මෙයට සමගාමීව විශ්වවිද්‍යාලවල නිල ශිෂ්‍ය සංගම් ද හදිසි නීතියෙන් තහනම් කරන ලදී. මේ අනුව ආණ්ඩුවේ අරමුණ පැහැදිලිය. එනම් තම ජනතා විරෝධී ගමනට බාධා කරන බලවේග සම්පූර්ණයෙන් මර්දනය කිරීමය. එපමණකින් නොනැවතුණු ආණ්ඩුව ශිෂ්‍ය සංගම් නියෝජිතයන් රැසක් ද අත් අඩංගුවට ගන්නා ලදී.

එහෙත් මේ කිසිවකින් ශිෂ්‍ය ක්‍රියාකාරිත්වය අඩපණ කළ නො හැකි වුයේ සමාජවාදී ශිෂ්‍ය සංගමය ශිෂ්‍ය ව්‍යාපාරයට නිසි මඟපෙන්විම ලබා දෙමින් සිටි නිසාය. අවශ්‍ය ධෛර්යය සපයමින් සිටි නිසාය. නිල ශිෂ්‍ය සංගම් වෙනුවට ''ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටු'' ගොඩනැගුණේ ඒ අනුවය. ඒ අනුව ක්‍රියාකාරි කමිටු හරහා ශිෂ්‍ය බලවේගය යළිත් එක මිටකට සංවිධානය කිරීමට හැකි විය. ඒ අනුව අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලය ක්‍රියාත්මක වුයේ ඒ ඒ විශ්වවිද්‍යාවල ගොඩනගන ලද ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටු හරහාය.

1983 වසරේ පෞද්ගලික වෛද්‍යවිද්‍යාලයේ සිසුන්, කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ විභාගයටම වාඩි කිරීමට එරෙහිව වෛද්‍ය පීඨ සිසුන්ගේ පෙළගැස්මක් ඇතිවිය. එහෙත් ඔවුහු එයට පුළුල් පොදු ජන සටනක් ලෙස මුහුණ දෙනවා වෙනුවට නීතිඥ කොල්වින් ආර්. ද සිල්වා සහ නීතිඥ බැටී වීරකෝන් මගින් උසාවි වාරණ නියෝගයක් ගැනීමට උත්සාහ කලහ. එහෙත් එය ආසාර්ථක විය. ඉන් පසු සිසුන් පංති වර්ජනයකට සුදානම් වුව ද වෛද්‍ය පීඨ සිසුන්ගේ දෙමාපියන් යැයි ඉදිරිපත් වු පිරිසක් විසින් ඔවුන්ගේ ප්‍රශ්නය බේරාදෙන බව පවසා එම සිසු ක්‍රියා මාර්ගය ද දියකර හරින ලදී.

මේ තත්වය විසින් පෙන්වා දුන්නේ වෛදය පීඨ සටන සඳහා සැබෑ නායකත්වයක, මඟපෙන්වීමේ අවශ්‍යතාවයයි.

# 08. හන්තානේ ලේ ගලයි

1983 අග වන විට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ සිසු සිසුවියන් 63 දෙනෙකුගේ ශිෂ්‍ය භාවයන් පරිපාලනය විසින් අහෝසි කර දමා තිබුණි. ඔවුන් වැඩිදෙනා සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ක්‍රියාකාරිකයන් විය. ආණ්ඩුවට අවශ්‍යව ඇත්තේ දැඩි සිසු මර්දනයක් බව පෙනෙන්නට විය. ඒ අනුව 1983 දෙසැම්බර් 27 දා පේරාදෙණිය සරසවි භූමියේ පොලීසියක් පිහිටුවන ලදි.

උපකුලපතිවරයා ප්‍රකාශ කලේ බාහිර කරදරවලින් තොරව පොලිස් ආරක්ෂාව සහිතව දැන් සිසුන්ට අධ්‍යාපන කටයුතු කරගෙන යා හැකි බවයි.


ලංකාවේ පමණක් නොව මෙය ලෝකයේම සරසවියක් තුළ පොලීසියක් පිහිට වූ මුල් අවස්ථාව බව පෙන්වා දුන් අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලය එයට දැඩි විරෝධය පළ කර සිටියේය. ආණ්ඩුව සිසු විරෝධය සමනය කිරීමට මෙය ''සුහද පොලීසියක්'' ලෙස හැඳින්විය. ඒහෙත් පොලීසියේ සුහද කම වැඩිකල් පැවැතුනේ නැත. 1984 ජුනි 19 දා වෛද්‍ය පීඨයේ සිසුන් පිරිසක් පොලීසිය අසලින් යමින් සිටියදී එක් සිසුවකුගේ අත පොලීසියේ ජනේලයක වැදීමේ සිද්ධියක් මුල්කරගෙන පොලීස්

නිලධාරීන් විසින් වෛද්‍ය සිසුන් දෙදෙනකුට පහරදෙන ලදී. ඒ සමඟම දැඩි ශිෂ්‍ය නොසන්සුන්තාවයක් හටගත් අතර එය විශාල සිසු උද්ඝෝෂණයක් බවට පත් විය. මෙහිදී පොලීසිය අමානුෂික ලෙස සිසුන්ට පහරදෙන ලද අතර ඉන් නොනැවතී වෙඩි ප්‍රහාරයක්ද එල්ල කරන ලදී. මෙයින් වෛද්‍ය සිසුවකු වූ පද්මසිරි අබේසේකර මිය ගිය අතර තවත් දෙදෙනකුට බරපතළ තුවාලද, විශාල පිරිසකට සුළු තුවාලද සිදුවිය.

මෙය දෙවන සරසවි සිසු ජීවිත බිලිගැනීම විය. මෙම අමානුෂික ප්‍රහාරයත් සමඟ අනෙකුත් විශ්වවිද්‍යාලයන්හි ද දැවැන්ත උද්ඝෝෂණ ආරම්භවිය. ජුනි 20 හා 21 දිනවලද සියලු සරසවි වල උද්ඝෝෂණ පැවැත්වුණු අතර පොලීසිය උද්ඝෝෂණ කල සිසුන්ට පහර දෙන ලදී. ජුනි 21 කොළඹ විශ්වවිද්‍යාලයේ සිසු උද්ඝෝෂණයට පොලීසිය වෙඩි තැබීම නිසා රෝහණ රත්නායක ශිෂ්‍යයා මිය ගියේය. තවත් විශාල පිරිසකට තුවාල සිදුවිය.



**පද්මසිරි අබේසේකර සහෝදරයා**



**රෝහණ රත්නායක සහෝදරයා**

රෝහණ රත්නායක ඝාතනය පාලකයින්ගේ තුන්වන සරසවි සිසු ඝාතනය විය. ආණ්ඩුව පොලීසිය ලවා සිදුකරන සිසු ඝාතනයන්ට

රට පුරා විරෝධතා එල්ල වූ අතර, උද්ඝෝෂණ පාසල් හා අනෙකුත් අධ්‍යාපන ආයතන දක්වා ගෙන එමට අන්තරය ඉක්මනින් සංවිධාන කටයුතු යොදවන ලදී. ආණ්ඩුව මිය ගිය සිසුන්ගේ අවමඟුල් කටයුතුවලට පවා බාධා කිරීමට ඉදිරිපත් විය. කෙසේ නමුත් රටපුරා නැගි විරෝධතා නිසා ආණ්ඩුවට පේරාදෙණිය සරසවියේ පිහිට වූ පොලීසිය ඉවත් කර ගැනීමට සිදු විය.

ජේ.ආර්. ජයවර්ධනගේ ප්‍රජාතන්ත්‍ර විරෝධී, පාලනයට එරෙහිව ශිෂ්‍ය ව්‍යාපාරය ලබාගත් ඓතිහාසික ජයග්‍රහණයක් ලෙස එය ඉතිහාසයට එක් විය. ඒ වෙනුවෙන් දැවැන්ත සටනකුත්, සිසු ජීවිත දෙකකුත් කැප කිරීමට ලාංකීය ශිෂ්‍ය ව්‍යාපාරයට සිදුවිය.

මුළු මහත් ජනතාවම බියෙන් ත්‍රස්ත කරමින්, ජනතා විරෝධී පාලනයක් ගෙන ගිය එ.ජා.ප ආණ්ඩුවට එරෙහිව සටන් කර ආණ්ඩුවේ ක්‍රියාමාර්ග ආපසු හැරවිය හැකි බවට බරපතළ සාක්ෂියක් මේ හරහා සනිටුහන් කිරීමට අවශ්‍ය ධෛර්යය, ශක්තිය සැපයිමට හැකිවිමද ශිෂ්‍ය ව්‍යාපාරය සිය වගකීම් ඉටුකිරීමක් විය.

දිවි පිදූ සිසු විරුවන්ට ගරුකිරීමක් වශයෙන් ජූනි 20 දිනය ''ජාතික ශිෂ්‍ය වීර දිනය'' ලෙස නම් කරන ලද්දේ මෙම සිදුවීම් පදනම් කරගෙනය. ජූනි 19 පේරාදෙණියේත්, ජූනි 21 කොළඹ සරසවියෙත් සිසු ඝාතන සිදුවූ නිසා ජූනි 20 දිනය තෝරාගන්නා ලදී. මේ සියල්ල නිසා 1984 පේරාදෙණිය සරසවියෙන් ඇරඹි පොලීසියට එරෙහි අරගලය ලාංකීය ශිෂ්‍ය ව්‍යාපාරයේ ඉතිහාසයේ නො මැකෙන සංධිස්ථානයක් වෙයි.

## ආණ්ඩුවෙන් ශිෂ්‍ය සම්බන්ධතා සභා

විශ්වවිද්‍යාල ශිෂ්‍ය ක්‍රියාකාරිත්වය යටපත් කිරිමට ආණ්ඩුව නව උපක්‍රම අත්හදා බලන්නට විය. 1985 පෙබරවාරි 12 වන දා ''1985 අංක 07 දරණ විශ්වවිද්‍යාල සංශෝධන පනත'' නමින් පනතක් ගෙන එනු ලැබීය. මෙය 1978 විශ්වවිද්‍යාල පනත සංශෝධනය කිරීමක් විය.

මේ අනුව විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමට බලපෑම්

කිරීමට ඇමතිවරයාට සම්පූර්ණ ඉඩකඩ සැලසිමද, විශ්වවිද්‍යාල වල විද්‍යායතන නියමයන් වෙනස් කිරීමේ බලතල ඇමැතිවරයාට පැවැරිමත්, පෞද්ගලික උපාධි ආයතන පිහිටුවිමට ඉඩකඩ විවරකර ගැනීමත්, උපකුලපතිවරු පත්කර ගැනීමේදී ජනාධිපති මැදීහත්විම වැඩි කිරීමත්, උපකුලපති ඉවත්කිරිමේ බලය ජනාධිපතිට පැවැරිමත් සිදුකරන ලදී.

මෙම සංශෝධන හරහා ගෙන ආ තවත් බරපතළ කරුණක් නම් ශිෂ්‍ය සභා පිහිටුවිමේ අයිතිය අහෝසි කිරීමයි. ඒ වෙනුවට ''ශිෂ්‍ය සම්බන්ධතා සභා'' යනුවෙන් වර්ගයක් යෝජනාකර තිබූ අතර , ඒවාට කලින් ශිෂ්‍ය සභා සතු වූ බලතල කිසිවක් හිමි නොවන පරිදි සංශෝධනය කර තිබුණි. ඒ අනුව ශිෂ්‍ය සම්බන්ධතා සභාවලට හැකි වන්නේ ශිෂ්‍ය සුභසාධක ගැටලු පරිපාලනයට ඉදිරිපත් කිරීම පමණි. 1982 අධ්‍යාපන ධවල පත්‍රිකාවට විශාල විරෝධයක් මතු වී හකුලා ගැනීමට සිදුවූ නිසා 1985 සංශෝධන පනත ගෙන එන්නේ හොර රහසේය. එය පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන තුරුත් විපක්ෂයේ මන්ත්‍රිවරුවත් දැක තිබුණේ නැත. පනත පාර්ලිමේන්තුවේ දී සම්මත කර ගත්තද එයට එරෙහිව දැවැන්ත උද්ඝෝෂණ දියත් කිරීමට අන්තර් විශ්වවිද්‍යාලීය ශිෂ්‍ය බල මණ්ඩලය කටයුතු කරන ලදී.

දහස් සංඛ්‍යාත සිසුන්ගේ සහභාගිත්වයෙන් කොළඹ නගරයේ උද්ඝෝෂණ පෙළපාළි පවත්වන ලදී. මේ නිසා ආණ්ඩුවේ සිවිල් පරිපාලන කටයුතු පවා අඩාලවිය. 1985 පෙබරවාරි 25 ජාතික විරෝධතා දිනයක් ලෙස නම් කළ අතර දිවයින පුරා පාසල් 1000 ක පමණ සිසුන් ද විරෝධතාවයට එක්විය.

මේ අතර පනත පිළිබඳ විවාදයක් සඳහා එවකට ජාතික ආරක්ෂක ඇමැතිවරයාව සිටි ලලිත් ඇතුලත්මුදලි විසින් කරනු ලැබූ අභියෝගය අන්තරය විසින් භාර ගනු ලැබුණි. නමුත් විවාදයේදී හිමිවිය යුතු අවම ප්‍රජාතන්ත්‍රවාදී කොන්දෙසි පිළිබඳව එකඟතාවක් ඇති කරගත නොහැකිවිමෙන් පසුව ශිෂ්‍ය ව්‍යාපාරය පැත්තෙන් ප්‍රතික්ෂේප කරන ලදී.

අනතුරුව ආණ්ඩුවට ඉතාම වාසිදායක කොන්දෙසි යටතේ විවාදයට ඉදිරිපත් වීමට නව සමසමාජ පක්ෂයේ නායක වික්‍රමබාහු

කරුණාරත්න තීරණය කිරීම නිසා විශාල ව්‍යාකූලත්වයක් ඇති විය. විශාල ශිෂ්‍ය හා ජනතා අරගලයක් හුදු විවාදයකට ලඝු කර සටන් ක්‍රියාමාර්ග බොඳකර දැමීමේ උත්සාහයක් ඒ තුළ පැවැතුණි.

කෙසේ නමුත් රට පුරා නැගුණු විරෝධතා හේතුවෙන් ''ශිෂ්‍ය සම්බන්ධතා සභා'' ආදී පනතේ බොහෝ කරුණු ක්‍රියාවට නැගීමට ආණ්ඩුවට නොහැකි විය.

කරුණාසේන කොඩිතුවක්කු වැනි අය ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ උපකුලපති ලෙස පත් කරනු ලැබුවේ මේ පනතේ කරුණු වලට ආවරණය වීමෙනි.

# 09. රට අනතුරක

වර්ධනය වෙමින් පැවති ජාතික හා ජාත්‍යන්තර දේශපාලන තත්ත්වයක් අනුව සංකීර්ණ දේශපාලන වටපිටාවක් නිර්මාණය වෙමින් පැවතිණි. රට තුළ ජාතික ප්‍රශ්නය පදනම්කරගෙන වර්ධනය වන ප්‍රවණතා දක්නට හැකිවිය. ජේ.ආර්. ගේ එ.ජා.ප. පාලනය දැඩි ඇමෙරිකානු ගැති ප්‍රතිපත්තියක පිහිටමින් කටයුතු කිරීමත්, එය අසල්වැසි ඉන්දියාවට විශාල කනස්සල්ලකට හේතු වී තිබීමත් ,උතුරේ වර්ධනය වෙමින් පැවති දෙමළ ඊලාම් ව්‍යාපාරය මේ ප්‍රතිවිරෝධයන්ගේ බලපෑම තුල කළමනාකරණයට ලක්වීමත් යන මේ සියලු තත්ත්වයන් පිළිබඳ පුළුල් විශ්ලේෂණයක් ජනතා විමුක්ති පෙරමුණේ රෝහණ විජේවීරයන් විසින් සම්පාදිත ''දෙමළ ඊලාම් අරගලයට විසඳුම කුමක්ද?" යන කෘතියෙන් පැහැදිලි කරනු ලැබීය.

අනාගතය පිළිබඳව පෙර දැක්මක්ද සහිතව ඉදිරිපත් වූ මෙමගින් ඉක්මන් ඉන්දීය ආක්‍රමණයක අනතුර පවා පෙන්වා දෙනු ලැබුණි. ඒ මත පදනම්ව එක්සත් ජාතික පක්ෂ පාලනයටත්, ඇමෙරිකානු මෙන්ම ඉන්දීය අධිරාජ්‍යවාදයටත්, ඊලාම් බෙදුම්වාදයටත් එරෙහි පුළුල් දේශප්‍රේමී අරගලයක අවශ්‍යතාවය අවධාරණය කෙරුණි. ජනතාවගේ සැබෑ නිදහස දිනාගත හැකි මාවත වැටී තිබුණේ

ඒ ඔස්සේය. ඒ අනුව එවැනි අරගලයක් සඳහා සමාජ බලවේග පෙළගැස්වීමේ වගකීම ලාංකේය නිර්ධන පන්ති පක්ෂය ලෙස ජනතා විමුක්ති පෙරමුණේ වගකීම බවට පත්ව තිබුණි.

සමාජවාදී ශිෂ්‍ය සංගමයට මෙහිදී බරපතළ වගකීමක් පැවරුණු අතර පොදු ශිෂ්‍ය ව්‍යාපාරය තුළ ප්‍රතිගාමී මතවාද පරදවා මෙකී නිවැරදි මතය තහවුරු කිරීමේ අභියෝගය පැවතුණි.

ඒ සඳහා ශිෂ්‍ය ව්‍යාපාරය තුළ ද පුළුල් සංවාදයක් ඇතිකරන ලද අතර ඒ සඳහා අප්‍රතිහත වෙහෙසක් දැරීමට සිදුවිය. එහෙත් ප්‍රතිගාමී ශිෂ්‍ය කණ්ඩායම් ප්‍රතිගාමී දේශපාලන බලවේග සමග සම්බන්ධ වී ක්‍රියාත්මක වීම ද දිගටම දක්නට ලැබුණි.

විශේෂයෙන් දේශපාලන පක්ෂ වලට සම්බන්ධ නැති බව කියමින් ස්වාධීන ශිෂ්‍ය ව්‍යාපාරයක් අවශ්‍ය බවට කටමැත දෙඩවූ ව්‍යාජ සිසු නායකයින් සිසුන් මුළා කිරීමට උත්සහ ගන්නා අයුරු දැකගත හැකිවිය. කොළඹ විශ්වවිද්‍යාලයේ ස්වාධීන ශිෂ්‍ය සංගමය මෙයට කදිම උදාහරණයකි.

මතවාදී තලයේදී සෘජුවම ඊලාම් බෙදුම්වාදී සටන සාධාරණය කරමින් පෙනීසිටි ඔවුන් තම කටයුතු මතවාදී සීමාවෙන් ඔබ්බට එකී ප්‍රතිගාමී දේශපාලන බලවේග සමග එක්ව ක්‍රියාකාරීවන තත්ත්වයක් ද දැකගත හැකි විය.

මෙවැනි වටපිටාවක සැබෑ අධිරාජ්‍ය විරෝධී අරගලයක අවශ්‍යතාවය මතු වූ අතර ඒ සඳහා දේශප්‍රේමී බලවේග ඒකරාශී කරන ලදි. ඒ අනුව ශිෂ්‍ය ව්‍යාපාරය තුළ ද ඒ සඳහා පුළුල් අරගලයක් සිදුකෙරුණු අතර දේශප්‍රේමී ශිෂ්‍ය ව්‍යාපාරය ගොඩ නැගෙන්නේ මේ පසුබිම තුළයි. ඒ මගින් ඇමෙරිකානු රූකඩ එ.ජා.ප. පාලනයටත් ඉන්දීය මැදිහත්වීම් වලටත් බෙදුම්වාදයටත් එරෙහිව ප්‍රගතිශීලී සිසු බලවේග පෙළගැස්වීමට කටයුතු කරන ලදී. 1986 සිට ම සියලු විශ්වවිද්‍යාල වල දේශප්‍රේමී ශිෂ්‍ය ව්‍යාපාරය ගොඩ නගන ලදී.

විවිධාකාරයේ ජාතිවාදී බලවේගයන් ද, අතිශය ප්‍රතිගාමී කණ්ඩායම් ද, දැඩි මර්දනකාරී දේශපාලන පරිසරයක් ද හමුවේ ශිෂ්‍ය ව්‍යාපාරය මෙහෙයවීමේ බරපතළ අභියෝගය ජයගැනීමට සමාජවාදී ශිෂ්‍ය සංගමයට හැකිවිය. ඊට හේතු වූයේ ඉතා නිවැරදි දැක්මත්,

එසේම ඒ මත පදනම් වූ අවංක හා එඩිතර නායකත්වයකුත් එය සතුවීම නිසාය.

1985-86 වකවානුවේ විශ්වවිද්‍යාල ආයතනික ප්‍රශ්න සම්බන්ධ අරගල ද විශාල ප්‍රමාණයක් පැවති අතර ඒවාට අන්තරය මගින් මඟ පෙන්වීම හා නායකත්වය ලබාදෙන ලදී.


ශිෂ්‍ය ක්‍රියාකාරීත්වය කිසිඳු ක්‍රමයකින් අඩපණ කිරීමට අසමත් වූ ජේ.ආර්. පාලනය තව තවත් උපක්‍රම තෝරන බව පෙනෙන්නට විය. ජනාධිපති ජේ.ආර්. ජයවර්ධන වරෙක ප්‍රකාශ කළේ සියලු විශ්වවිද්‍යාල විසුරුවාහැර ඒවා විවෘත විශ්වවිද්‍යාල බවට හරවන බවයි.

විශ්වවිද්‍යාල අහෝසි කිරීමේ තර්ජනය ඒ තුළ පැවති අතර 1986 මහාචාර්ය අයි. බාලසූරියගේ මූලිකත්වයෙන් විශ්වවිද්‍යාල විමධ්‍යගතකරණය නමින් වාර්තාවක් නිකුත් වූයේ මේ අරමුණ සහිතවය. නමුත් ආචාර්ය සිසු විරෝධතා නිසා මේවා හකුළා ගැනුණි.

මේ වකවානුවේ ඉස්මතු වූ තවත් ප්‍රබල ශිෂ්‍ය සටනක් වූයේ කැළනිය විශ්වවිද්‍යාලයේ භික්ෂු නේවාසිකාගාර සටනයි. අන්තර් විශ්වවිද්‍යාල භික්ෂු බලමණ්ඩලය මෙහි සටන් ක්‍රියාමාර්ග මෙහෙයවන ලද අතර අන්තරයේ පූර්ණ සහයෝගය එයට හිමිවිය. ශිෂ්‍ය භික්ෂූන් විසින් විශ්වවිද්‍යාල ගොඩනැගිල්ලක් අත්පත්කරගනු ලැබූ අතර, එහි සිටිමින් දින ගණනක අරගලයක් ගෙනයන ලදි. අවසානයේ සටන ජයග්‍රහණය කළ අතර එය ශිෂ්‍ය ව්‍යාපාරයට දැවැන්ත ශක්තියක් ද විය.

1987 අප්‍රේල් 21 දා පිටකොටුවේ බෝධිය අසලදී එල්.ටී.ටී.ඊ සංවිධානය විසින් බෝම්බයක් පුපුරවා හරින ලද අතර ඉන් විශාල විනාශයක් සිදුවිය. සිවිල් වැසියන් 114ක් මරු මුවට පත් විය. මෙහිදී ආණ්ඩුව ඇඳිරි නීතිය යොදන ලද අතර ශිෂ්‍ය ව්‍යාපාරය ආණ්ඩුවට විරෝධය පලකරමින් කොළඹ මහ රෝහලේ සිට ජනාධිපති මන්දිරයට පෙළපාලියක් පවත්වන ලදි.

# ලේ හැළුනු මැයි දිනය



කිත්සිරි මෙවන් රණවක සහෝදරයා

මර්දන වැඩ පිළිවෙළ තවත් වේගවත් කළ ආණ්ඩුව 1987 මැයි දිනය තහනම් කරන ලදි. මෙකී බරපතල ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාමාර්ගයට එරෙහිව අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලයේ මූලිකත්වයෙන් අනෙකුත් වෘත්තීය සමිති සහ බහුජන සංවිධාන එක්කරගනිමින් නාරාහේන්පිට අභයාරාමයේ මැයි දින සැමරුමක් පැවැත්වීමට කටයුතු සංවිධානය කරන ලදී. එයට විශාල සිසු, කම්කරු සහභාගීත්වයක් පැවති අතර ආණ්ඩුව පොලිසිය යොදවා අමානුෂික ලෙස පිරිසට පහර දෙන ලදි. මෙහිදී පොලිසිය වෙඩි තැබීම නිසා ශ්‍රී ජයවර්ධනපුර විශ්ව විද්‍යාලයේ කිත්සිරිමෙවන් රණවක සොයුරා සහ සපුගස්කන්ද ඛනිජ තෙල් පිරිපහදුවේ සේවය කළ ලෙස්ලි ආනන්ද ලාල් සොයුරා ඝාතනයට ලක්විය.


ශිෂ්‍ය ව්‍යාපාරය පැත්තෙන් ගත් කළ මෙය පාලකයින් සිදුකළ සිව්වන සිසු ඝාතනය වූ අතර මෙයට එරෙහිව විශාල සිසු විරෝධයක් මතුකරන ලදී. රණවක සොයුරාගේ දේහය විශ්වවිද්‍යාලයටද ගෙනවිත් උපරිම සිසු උත්තමාචාර සහිතව අවසන් කටයුතු සිදුකරනු ලැබීය.

# ජේ.ආර් රට පාවා දෙයි

ආණ්ඩුවේ ඇමරිකන් ගැති ප්‍රතිපත්තිය හමුවේ උදහස් වූ ඉන්දියාව ලාංකාව තම ග්‍රහණයට ගැනීමට ඉක්මන් විය. ඒ අනුව ලාංකාවේ ගුවන් සීමා උල්ලංඝනය කරමින් යාපනයට ගුවනින් පරිප්පු දැමූ අතර ජේ.ආර්. ට බලපෑම් කොට ඉන්දු -ලංකා ගිවිසුමකට සුදානම්

විය. ආණ්ඩුව මෙය රටට හෙලි නොකළ අතර රහසිගතව සියල්ල සිදු වෙමින් පවැතුණි.

එහෙත් මේ වැනි රට පාවා දීමකට රටේ දේශප්‍රේමි ප්‍රගතිශීලී බලවේග ඉඩ නොදෙන බව දැන සිටි ආණ්ඩුව විශේෂයෙන් ශිෂ්‍ය ව්‍යාපාරයෙන් මතුවිය හැකි විරෝධය යටපත් කිරීමට කුමන්ත්‍රණයක් සැලසුම් කරනු ලැබීය. එනම් 1987 ජුනි 22 දා රාත්‍රියේ දීප ව්‍යාප්තව සිදුකරන ලද වැටලීමක් මගින් ශිෂ්‍ය ක්‍රියාකරින් 310ක් අත් අඩංගුවට ගැනීමට සැලසුම් කිරීමයි. මෙම වැටලීම ඒ පරිදිම සිදුවු නමුත් පොලීසියට අත්අඩංගුවට ගැනීමට හැකි වුයේ සිසුන් 88 දෙනෙකු පමණි. මෙයින් 71 දෙනෙකුම කොළඹ මැගසින් බන්ධනාගාරයේ රඳවනු ලැබීය.




(1987 ජුලි මස 30 වන දා ඉන්දීය අගමැති රජිව් ගාන්ධි ලංකාවට පැමිණ ජේ.ආර්.ජයවර්ධන ජනාධිපතිවරයා සමඟ ඉන්දු ලංකා ගිවිසුමට අත්සන් කරන ලදී.)

රට පාවාදීමේ ඉන්දු ලංකා ගිවිසුමට එරෙහිව රට පුරා දේශප්‍රේමි ජනතාව දැවැන්ත විරෝධතා පවත්වනු ලැබීය. පිටකොටුව බෝ ගස අසළ භික්ෂුන්වහන්සේලා , ශිෂ්‍ය ක්‍රියාකාරීන් හා බහුජන සංවිධාන නායකයින් උපවාසයක් ද ආරම්භ කරන ලදහ. ආණ්ඩුව


ඇඳිරි නීතිය පැනවූ අතර ජනතාව ඒවා නොතකා පෙළපාළි දක්වමින් උද්ඝෝෂණ කළහ. පොලීසිය ජනතාවට පහර දීමට පැමිණි විට පෙරලා ජනතාවද ප්‍රකෝප වී ප්‍රතිචාර දැක්වූ අතර ඒවා වඩාත් ප්‍රචණ්ඩ විය. ජනතාව විසින් රට පුරා පාරවල් අවහිර කරනු ලැබූ අතර ලංගම බස් රථ ඇතුළු රාජ්‍ය දේපල ලෙස සැලකුනු බොහෝ ඒවා ගිනි තබා විනාශ කරනු ලැබීය.

ශිෂ්‍ය ව්‍යාපාරය ද ජනතා උද්ඝෝෂණ වල පෙරමුණ ගෙන සටන් කරන ලදී. විශ්වවිද්‍යාල ඉදිරිපිට උපවාස ආරම්භ කරන ලදි. ජුලි 28 කොළඹ නගරයට පෙළපාළී වලින් පැමිණේද්දී, ඒවාට පොලිස් ප්‍රහාර එල්ල කෙරුණි. රට පුරා උද්ඝෝෂණ වලට එල්ල වූ පොලිස් ප්‍රහාර වලින් 147 ක් ඝාතනය කෙරුණු අතර එයට සරසවි සිසුන් ද ඇතුළත් විය.

මොරටුව විශ්වවිද්‍යාලයේ ක්ලිෆඩ් පෙරේරා සහ නිමල් ලියනගේ යන සොහොයුරන් ඉන් දෙදෙනකි.



**ක්ලිෆඩ් පෙරේරා සහෝදරයා**



**නිමල් ලියනගේ සහෝදරයා**

ඉන්දු ලංකා ගිවිසුම ලාංකේය දේශපාලනයේ විශේෂ කඩඉමක් බවට විය. ඊට හේතුව නම් එම ගිවිසුමට පක්ෂවූවන් හා එයට එරෙහි වූවන් ලෙස පැහැදිලි බෙදීමක් සිදුවූ නිසාය. පැරණි වම හා වමේ යැයි කියා ගන්නා බොහෝ අවස්ථාවාදී කණ්ඩායම් ද, පාලක එ.ජා.ප

ආණ්ඩුව ද එක පෙළට අත්වැල් බැඳගන්නා ලදී.

ඉන්දු ලංකා ගිවිසුමට පක්ෂ වූවන් දේශද්‍රෝහීන් ලෙස ද ගිවිසුමට විරුද්ධ බලවේග දේශප්‍රේමීන් ලෙස ද පැහැදිලි බෙදීමක් ඇතිවිය.

විශ්වවිද්‍යාල තුළ ඊනියා ''ස්වාධීන '' ලේබල් වලට මුවා වී සිටි අවස්ථාවාදී ශිෂ්‍ය කණ්ඩායම් මේ තත්ත්වය තුළ සම්පූර්ණයෙන් හෙළිදරව්වන්නට වූ අතර පොදුවේ ශිෂ්‍ය ප්‍රජාවගේ පිළිකුලටද භාජනය විය.

මේ තත්වය යටතේ රට තුළ දේශප්‍රේමී ජනතා අරගලයකට පදනම සකස් වු අතර ඒ සඳහා බලවේග පෙළ ගැස්සවීමේ භාරදූර කාර්යභාරයට ජනතා විමුක්ති පෙරමුණ මඟපෙන් වීම සපයනු ලැබීය. දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය ගොඩනැගුණේ ඒ අනුවය.

# 10. අධ්‍යාපන අයිතිය උදුරාගැනීමේ තවත් තැතක්

## කිංස්ලි සිල්වා වාර්තාව

මේ අතර ආණ්ඩුව තවදුරටත් අධ්‍යාපන පෞද්ගලීකරණ වැඩපිළිවෙළ ඉදිරියට ගැනිමට උත්සාහ කරන ලදී. 1987 දී ඉදිරිපත් වු මෙම වාර්තාවෙන් විශ්වවිද්‍යාල ප්‍රවේශය පිළිබඳ යෝජනා ඉදිරිපත් කරන ලදී. මූලික වෙනස් කම් 04 ක් ඉදිරිපත් විය.

1. සරසවි ප්‍රවේශය සඳහා අවම ලකුණු මට්ටම වු 180 යන්න 200 දක්වා ඉහළ දැමීම.
2. විශ්වවිද්‍යාල ප්‍රවේශයේදී පදනම් වු දිස්ත්‍රික් පදනම (65%) අහෝසි කිරීම.
3. උසස් පෙළ විභාගයට පෙනී සිටිය හැකි වාර ගණන වූ වාර 03 වාර 02කට අඩු කිරිම.
4. ඉංජිනේරු හා වෛද්‍ය පීඨ වලට ඇතුළුවීමට නම් ඉංග්‍රිසි විෂය අනිවාර්ය කිරීම.

මෙම යෝජනාවන්ගේ අරමුණ වුයේ කුමක්දැයි බැලුබැල්මට

පැහැදිලිය. එක් පැත්තකින් විශ්වවිද්‍යාල සඳහා සුදුසු කම් ලබන සියලු දෙනාට විශ්වවිද්‍යාල වරම් ලාබාදීමට අලුතින් විශ්වවිද්‍යාල ආරම්භ කරනවා වෙනුවට ආණ්ඩුව උත්සාහ කළේ විශ්වවිද්‍යාල වරම් ලබන ප්‍රමාණය කප්පාදු කිරීමටය. අවම ලකුණු සීමාව 180-200 කිරීමේ අරමුණ එයයි. මෙය ක්‍රියාත්මක වූයේ නම් ලංකාවේ දිස්ත්‍රික්ක ගණනාවක සිසු සිසුවියන්ට සරසවි ප්‍රවේශය සිහිනයක් පමණක් වීම වැළැක්විය නොහැකිය. දිස්ත්‍රික් පදනම අහෝසි කිරීම තුළ ද ඇත්තේ එම වුවමනාවමය.

උසස් පෙළ විභාගයට පෙනී සිටීමේ වාර ගණන කප්පාදු කිරීමේ අරමුණ තුළ ඇත්තේ ද සුදුසුකම් ලබන පිරිස අඩු කිරීමය. අනෙක් අතට පාසල් අධ්‍යාපනය තුළ ඉංග්‍රිසි අධ්‍යාපනය ඉතා දුබල මට්ටමක පැවැති තත්ත්වය යටතේ දුප්පත් දෙමාපියන් ගේ දරුවන් ඉංග්‍රිසි භාෂා අධ්‍යාපනයෙන් දුරස් කර තිබුණි. උදාහරණයක් ලෙස ගන්නේ නම් 1997 ජනාධිපති කාර්ය සාධන වාර්තාවට අනුව අ.පො.ස සාමාන්‍ය පෙළ විභාගයේ දී මොනරාගල දිස්ත්‍රික්කයේ ඉංග්‍රීසි විෂය අසමත් වීමේ ප්‍රතිශතය 90.47% විය. එය කොළඹ දිස්ත්‍රික්ක වල පවා 41.61% ක් තරම් ඉහළ අගයක් විය. රට පුරා පාසල් වල ඉංග්‍රිසි ගුරු හිඟය තවමත් බලවත් ගැටලුවක් ලෙස පවතී. මේ තත්ත්වය තුළ ඒ සඳහා වැඩපිළිවෙළක් යොදනවා වෙනුවට ආණ්ඩුව උත්සාහ කළේ කප්පාදු කිරීමේ වැඩපිළිවෙළකට යාමටය.

මේ වන විට රට පුරාම විශාල ආණ්ඩු විරෝධයක් වර්ධනය වී තිබූ තත්ත්වයක් යටතේ කිංස්ලි සිල්වා වාර්තාව වැනි ඒවාට ශිෂ්‍ය ව්‍යාපාරය තුළින් බලවත් විරෝධයක් එල්ල විම බලාපොරොත්තු විය යුක්තකි. විශ්වවිද්‍යාල, පාසල්, කාර්මික විද්‍යාල ඇතුළු සෑම තැනකම මතු වු අරගලයේ සටන් පාඨ අතර කිංස්ලි සිල්වා වාර්තාවට එල්ල වූ විරෝධය අති මහත්ය.

මේ නිසා ආණ්ඩුවට මේ වාර්තාවේ යෝජනා ක්‍රියාත්මක කිරීමට නොහැකි විය. මෙය ලාංකේය ශිෂ්‍ය ව්‍යාපාරය ලද තවත් අතිවිශිෂ්ට ජයග්‍රහණයක් ලෙස ඉතිහාසයට එක් විය.

ආණ්ඩුවේ ප්‍රජාතන්ත්‍ර විරෝධී, ජනතා ද්‍රෝහි වැඩ පිළිවෙලට ප්‍රබලතම විරෝධයක් එල්ලවන්නේ ශිෂ්‍ය ව්‍යාපාරය පැත්තෙන් බව දන

සිටි ජේ.ආර්. පාලනය විශ්වවිද්‍යාල තුළ පැවැති අවම ප්‍රජාතන්ත්‍රවාදී පරිසරයත් හකුලා දැමීමට''අතුරු නීති'' නමින් මර්දනකාරී නීති පද්ධතියක් හඳුන්වා දෙන ලදී. ඒවා නම්,

1. විශ්වවිද්‍යාල භූමිය තුළ සිසුන් 05 දෙනෙකුට වඩා එකතු වී කතා කිරීම තහනම්ය.
2. විශ්වවිද්‍යාල තුළ පෝස්ටර්, පත්‍රිකා, බිත්ති පුවත්පත් හා කවි සංකල්පනා ප්‍රදර්ශනය තහනම්ය.
3. විශ්වවිද්‍යාලයේ අභ්‍යන්තර ප්‍රවෘත්ති ජනමාධ්‍යන්ට හෝ වෙනත් බාහිර පුද්ගලයන්ට දීම තහනම්ය.
4. කුමන කරුණක් නිසා හෝ පුණ්‍යාධාර, මුදල්, එකතු කිරීම් දඬුවම් ලැබිය හැකි වරදකි.
5. සිසුන්ට සති 02ක පන්ති තහනමේ සිට ශිෂ්‍ය භාවය අහෝසි කිරීම දක්වා දඬුවම් දීමේ බලතල උපකුලපතිට පැවරීම.
6. පන්ති වර්ජන හා උද්ඝෝෂණ වලට සහභාගී වන සියලු සිසු සිසුවියන්ගේ මහපොළ, ශිෂ්‍යාධාර අහෝසි කෙරේ.

යන ඒවාය.

නමුත් සෑම විශ්වවිද්‍යාලයකම මෙම නීති සිසු සිසුවියන් ප්‍රසිද්ධියේම කඩ කරන ලද නිසා ඒවායේ වලංගුභාවය අහෝසි විය. මතු වූ දැඩි උද්ඝෝෂණික වටපිටාවක් සමඟ 1987 දෙසැම්බර් 22 වන විට මුළු විශ්වවිද්‍යාල පද්ධතියම දින නියමයක් නැතිව වසා දැමීමට ආණ්ඩුව පියවර ගත්තේය.

එවකට ශිෂ්‍ය ව්‍යාපාරය අභිමුව පැවති අභියෝග සම්බන්ධයෙන් අ.වි.ශි.බ.ම. විසින් 1987 ජුලි මස 20 වන දින රට පුරා බෙදා හරින ලද අත් පත්‍රිකාවක සඳහන් වූ කරුණු පහත දැක්වේ.

## විශ්වවිද්‍යාල විනාශයි සිසුනි, නිදහස් අධ්‍යාපනය රැකගැනීමට සටන් වදිව්!

නිදහස් අධ්‍යාපනයේ මුදුන් මල්කඩ වන විශ්වවිද්‍යාල විනාශ කිරීමට යූ. ඇන්. පී. ආණ්ඩුව දස අවුරුද්දක් ම වලි කෑවේය. 1983 හදිසි නීතිය පැනවූ දින පටන් හිරගෙදර සරසවි සිසුවෙක් නොවූ දිනයක් ගෙවී ගියේ නැත. දැන් සරසවි ආචාර්යවරයෙක්, හිමිවරු 10ක් හා වෛද්‍ය ශිෂ්‍යාවක් ඇතුළු සිසු සිසුවියන් 91ක් මාසයකට ආසන්න කාලයක් වැලිකඩ හිරගෙදර ගාල් කරගෙන සිටී. තවත් විශාල පිරිසක් තැන තැන පොලිස් ස්ථානවල රදවාගෙන ඇත. ආණ්ඩුව එසේ කරද්දී සරසවි පාලකයින් ද ආණ්ඩුව පරයා යමින් විශ්වවිද්‍යාලවල මාරයන් බවට පත්ව තිබේ. 1985 දෙසැම්බර් වල සිට රුහුණු සරසවියේ අධ්‍යයන කටයුතු ඇණහිට ඇත. පේරාදෙණියත්, ජයවර්ධනපුරත් ගෙවුණු නිවාඩුවෙන් පසු ආරම්භ කළේම නැත. විවෘත කළ සරසවි වල එකද ප්‍රශ්නයක් දෙස හෝ සාධාරණව බැලීම වෙනුවට පාලකයෝ මර්දනයේ අවිය අතට ගෙන සිටිති.

දැන් රුහුණු සරසවියේ ශිෂ්‍ය නායකයින් 25 දෙනෙකුටත්, පේරාදෙණියේ ශිෂ්‍ය නායකයින් 30 කටත්, ජයවර්ධනපුර ශිෂ්‍ය නායකයින් 4 කටත් සරසවියේ පස් පෑගීම තහනම් කර ඇත. පොලීසිය සිසු දඩයම ගෙන යන්නේද සරසවි පාලකයින්ගෙන් ලබාගත් ඔත්තු වලට අනුවය.

විශ්වවිද්‍යාල විනාශ කිරීමේ අලුත්ම වෑයම ඒවාට සිසුන් බදවා ගැනීමේදී කරන දූෂණයයි. පහසුකම් හා ඉඩකඩ අතින් දිවයිනේ හොඳම විශ්වවිද්‍යාලය පේරාදෙණියයි. ඒ අතින් නරකම තැන ගන්නේ කොළඹයි. එහෙත් අද පේරාදෙණිය සරසවියේ දේශන ශාලා, පුස්තකාල කාමර වවුලන්ගේ හා මකුළුවන්ගේ රජ දහන් වෙද්දී වැඩිම ශිෂ්‍ය සංඛ්‍යාවක් ගාල්කර ඇති සරසවිය කොළඹයි. ජයවර්ධනපුර සරසවියට මෙවර බදවාගෙන ඇති වැඩිම පිරිස කාන්තාවන් වී ඇති අතර කොළඹ සරසවියෙන් භික්ෂූන් වහන්සේ තුරන් කිරීම සඳහා යොදා ඇති කුට උත්සහයේ තරම ඊට මෙවර ඇතුළත් කර ඇත්තේ

භික්ෂූන් වහන්සේලා 4 නමක් පමණක් වීමෙන් පෙනේ.

**උපාධි, දක්ෂයින්ට නොවේ. මුදල් ඇති අයටයි.**

වසර හයක් තිස්සේ සිසු විරෝධතාවන්ට මර්දන පොල්ල එල්ල කරමින් පවත්වාගෙන ආ පෞද්ගලික විශ්වවිද්‍යාලය අද විශ්වවිද්‍යාල පමණක් නොව මුළු සෞඛ්‍ය සේවය ම අර්බුදයට ලක්කර ඇත. එහෙත් ආණ්ඩුව තම පැලැන්තියේ වුන් ආරක්ෂා කිරීම සඳහා එක පයින් සිට පෞද්ගලික විශ්වවිද්‍යාලයේ මුදලට උපාධි විකිණීමට විරුද්ධව පැන නැගී ඇති උද්ඝෝෂණය මහා මර්දනයකින් විනාශ කිරීමට පිඹුරුපත් සකසමින් සිටී.

**පාසැල් අධ්‍යාපනය මුලින්ම වනසා ඇත.**

අගනුවර අධ්‍යාපන තරගයෙන් ජය ලැබිය හැක්කේ පෞද්ගලික හෝ සුපිරි පාසැල් දරුවනට පමණි. එනම් මුදල් ඇති අයට පමණි. පගාව හෝ පන්දම නැතිව ඇතුළත් විය හැකිව ඇතිතේ ගව ගාල්වලට පමණි.

උතුරේ හා නැගෙනහිරත්, උතුරුමැදත් පාසැල් විශාල සංඛ්‍යාවක ශිෂ්‍ය ශිෂ්‍යාවන්ගේ අධ්‍යාපනය සම්පූර්ණයෙන්ම ඇණහිට ඇත. ඔවුහු දැන් උපන් ගම හැර විවිධ තැන්වල පදිංචි වී ජීවත්වීමේ සටනේ නියැලෙති.

වරෙක උතුරට හා නැගෙනහිරට පමණක් සීමා වූ පාසැල් හමුදා හෝ කොටි කඳවුරු බවට පත්කර ගැනීම දැන් දිවයින පුරා ව්‍යාප්ත වෙමින් පවතී. මෙසේ දැන් පාසැල් ගණනාවක් සෙසු පළාත්වල ද වැසී ඇත. පොලිස් රාජ්‍යයක් ගොඩනගා ඇති ආණ්ඩුව මෙසේ ඊළග පරපුරේ අධ්‍යාපනය කපා දමා හමුදා කඳවුරු පිහිටුවමින් යන්නේ හමුදා රාජ්‍යයක් ගොඩනගනු පිණිසය.

පාසැල් පර්ෂද ක්‍රමය හරහා හයිකාරයින්ට, බලපුළුවන් කාරයින්ට හොඳ පාසැල් ලබා දීම කරගෙන යයි. ඈත පිටිසර දුෂ්කර පාසැල්වලට ඊනියා පාසැල් පර්ෂද තුළ කුඩම්මාගේ සැලකිල්ල හිමිවීම නිසා අධ්‍යාපන තරගයේ දිළිඳු දරුවන් නිකම්ම මුළුගැන්වෙමින් සිටී.

නව අධ්‍යාපන ක්‍රමය නැමැති ප්‍රෝඩාව හරහා අඛණ්ඩ ඇගයීම් නැමැති ගිනිගෙඩිය මගින් වාරයකට පරීක්ෂණ තුන බැගින් පවත්වයි. නියගය, වැස්ස, ගුරු හිගය ආදිය නිසා මාස ගණන් අධ්‍යාපනය

අඩාලවන හැටි දරුවන්ගේ අඛණ්ඩ වාර්තා පොත් මේ අනුව ඍණ ලකුණුවලින් පිරී යද්දී නාගරික වරප්‍රසාද ලත් කොටස් පමණක් මේ අනුව සුදුස්සන් ලෙස වර්ග කෙරෙනු ඇත.

## අපේ දෑස් අන්ධ කිරීමට එරෙහිව සටන් වදිමු!

ආදරණීය සොහොයුර, සොහොයුරිය

ඉහළිනුත්, පහළිනුත්, මැදිනුත් හැමතැනින්ම මෙසේ ඇසෙන්නේ අධ්‍යාපනයේ මර ලතෝනියයි. ගුරු හිගය, උපකරණ හිගය, පාසැල් සිසුන් මත්ද්‍රව්‍ය වෙළඳාමට යොදා ගැනීම, සංචාරකයින්ගේ සමලිංගික සහායකයින් ලෙස යොදා ගැනීම යනාදියයි. මේ තත්වයට එරෙහිව වහ වහා නැගී සිටීම අද අත්‍යාවශය කටයුත්ත බවට පත්ව ඇත. දස අවුරුද්දක් තිස්සේ ජනතා බලවේග මර්දනය කරමින් අවස්ථාව ලද හැම විටකම නිදහස් අධ්‍යාපනයට මරු පහර එල්ල කළ හා එල්ල කරමින් සිටින ආණ්ඩුවක් කෙරෙහි තවත් සොච්චමක තරම්වත් බලාපොරොත්තුවක් තැබිය හැකි ව ඇද්ද? රටේ බාල පරපුර නූගත් කමේ ගිල්වා සදාචාර විනාශයටත්, දාමරික හා හොර ජාවාරම්වලටත් ඇදීමට සලස්වා හිරගෙවල් අරවා ලොකු ලොක්කෝ රට පුරා මඟුල් කති. රටේ සංවර්ධනය යැයි කියමින් තමන්ගේ සංවර්ධනය ගැන පම්පෝර් ගසති. ප්‍රදර්ශන පවත්වති.

දැනට සිදුවෙමින් පවතින දේ එබඳුය. මෙය ඔබේත් අපේත්, අපේ ඊළග පරපුරේත් ගෙල සිඳ දමනු පිණිස දුෂ්ට පාලකයින් විසින් හිතා මතාම ගෙනයන කූට කුමන්ත්‍රණයකි. මෙය පරාජය කළ යුතුය. එය කළ නොහැක්කක් නොවේ. කළ හැකිය. ඒ සඳහා අවශ්‍යව ඇත්තේ මුළුමහත් ශිෂ්‍ය පරපුරේ එක්සත් කමයි. සමගියයි.

අපි සමගි වෙමු ! අපි එක්සත් වෙමු !!
නිදහස් අධ්‍යාපනය රැකගැනීම සඳහා සටන් වදිමු !
මර්දනය පරාජය කරමු ! විනාශකාරී පාලකයින්ගෙන් පාසැල් හා සරසවි රැකගනිමු !! මර්දනය පරදවමු !!!
නිදහස් අධ්‍යාපනයත්, ඊට හිමි නිසි තැනත් රැකගැනීම සඳහා වහ වහා එක් වව් ! සටන් වදිව් !!

**අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බල මණ්ඩලය**

1987-ජූලි-20

# 11. වෛද්‍ය පීඨ අරගලය පෙරටම

1987 වන විට උතුරු කොළඹ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයට එරෙහි සටන ද උණුසුම් විය. මීට ප්‍රධාන හේතුව වුයේ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයට පළමුව ඇතුළත් වු සිසුන් කාණ්ඩායම තම අධ්‍යාපන කාලය අවසන් කර කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ සිසු කණ්ඩායම සමඟම එකට අවසන් වසර විභාගයට වාඩිවීමට සුදානම් විමය. එය යෙදී තිබුණේ ජුලි 31 වන දාටය. මෙසේ එකම විභාගයට පෙනී සිටියහොත් ඉන්පසු සීමාවාසික පත්වීම් ද රජයේ වෛද්‍ය සිසුන්ට ලබාදෙන පදනමින්ම ලබා දීමට හැකි බව පාලකයින් දැන සිටියහ.

රජයේ වෛද්‍ය පීඨ වලින් සිසුන් 510 ක් පිට වීමට සිටි අතර සීමාවාසික පත්වීම් තිබුණේ 370 ක් පමණය . වෛද්‍ය පීඨ වල සිසුන් උද්ඝෝෂණ වලට පෙළඹුණේ මේ තත්වයත් සමඟය. කොළඹ වෛද්‍ය පීඨ ආචාර්ය මණ්ඩලයද ,පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයේ සිසුන්ටත්, වෛද්‍ය පීඨයේ සිසුන්ටත් එකම විභාගයක් ලබා දීමට විරුද්ධත්වය ප්‍රකාශ කරන ලදී. 1987 අප්‍රේල් මාසයේ රජයේ වෛද්‍යවරුන්ගේ සංගමයද ආණ්ඩුවේ පිළිවෙතට එරෙහිව ඉල්ලීම් කිහිපයක් සම්මත කරන ලදී.

වෛද්‍ය පීඨ ශිෂ්‍ය ක්‍රියාකාරීහු තව තවත් බහුජන සංවිධාන වල සහය ලබාගැනීමට පියවර ගත්හ. ජූලි මාසයේ සිසු සිසුවියෝ කළු පටි පැළඳීමට තීරණය කළහ. එවකට විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිසමේ සභාපති ස්ටැන්ලි කල්පගේ සමඟ රජයේ වෛද්‍යවරුන්ගේ සංගමය සාකච්ඡා කළ අතර එවා ආසාර්ථක විය. ජූලි 15 සිට ඔවුහු වැඩ වර්ජනයක් ක්‍රියාත්මක කළහ. ජූලි 16 එයට දන්ත වෛද්‍ය නිලධාරීන්ගේ සංගමයද එක් විය. උද්ඝෝෂණයට සහය පිණිස සෞඛ්‍ය සේවා වෘත්තීය සමිති 17 ක් එක්කොට සෞඛ්‍ය සේවා එකාබද්ධ කමිටුවක් ගොඩනගන ලදී. වෛද්‍ය වැඩ වර්ජනය දින 27 ඇදී ගිය අතර, ප්‍රශ්නය පිළිබඳ සොයාබැලීමට කමිටුවක් පත්කරීමේ එකඟතාවය මත වර්ජනය අතහැර දැමුණි.

වෛද්‍ය පීඨ ප්‍රශ්නය විසඳගැනීමට නම් වඩා පුළුල් පොදු ජන අරගලයක අවශ්‍යතාව මෙයින් තහවුරු කෙරුණි. ඒ සඳහා ''පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය ස්වාධින ආයතනයක් කරවීම'' යන දියාරු සටන් පාඨය වෙනුවට සැබෑ ජනතාවාදී සටන් පාඨයක් වූ ''පෞද්ගලික වෛද්‍ය විද්‍යාල ජනසතු කරව්'' යන සටන් පාඨයට අරගලය වෙනස් කරගත යුතු විය. මෙහිදී අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලයේ මඟපෙන්වීම යටතේ වෛද්‍ය පීඨ ශිෂ්‍ය ක්‍රියාකාරි කමිටුව අරගලය සඳහා මෙම සටන් පාඨය තහවුරු කිරීමට සමත් විය.

වෛද්‍ය ශිෂ්‍ය කමිටුව, ආචාර්ය සංගමය, රජයේ වෛද්‍ය සංගමය, දන්ත වෛද්‍ය සංගමය එක් කොට තනි කමිටුවක් ගොඩනගන ලදී. සියලු වෛද්‍ය පීඨ ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටු එක් කොට අන්තර් වෛද්‍ය පීඨ ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටුව ගොඩනගන ලදී.


පොදු ජනතාවට ප්‍රශ්නය පැහැදිලි කිරීම සඳහා සම්මන්ත්‍රණ මාලාවක් පවත්වන ලදී. 1987 අගෝස්තු 11දා කොළඹ නව නගර ශාලාවේ ආරම්භක සම්මන්ත්‍රණය පවත්වන ලදී. ඒවා ගම්පහ, බදුල්ල, කුරුණෑගල, කලුතර, මීගමුව, නුගේගොඩ, ගාල්ල, මාතර, නුවර, කෑගල්ල යන නගර වලදී පවත්වන ලදී.

සම්මන්ත්‍රණ වලට පැය කිහිපයකට පෙර වෛද්‍ය පීඨ වල සිසුන් එම නගර වලට ගොස් ජනතාව අතර පුළුල් ප්‍රචාරයකින් දැනුවත්

කිරීම් සිදුකරන ලදී. පාසල් සිසුන්ද දැනුවත් කරනු ලැබුණි.

1987 සැප්තැම්බර් සිට''වෙද සිසු හඬ'' නමින් පුවත්පතක් ආරම්භ කරන ලද අතර එය රට පුරා බෙදාහැරිනි. කොළඹ වෛද්‍ය පීඨ සිසුන් ජූලි මස සිට අඛණ්ඩ පංති වර්ජනයක් ක්‍රියාත්මක කළ අතර අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලයද සිය ප්‍රධාන සටන් පාඨ අතරටම ''පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය ජනසතු කරව්!'' යන්න එක් කර ගන්නා ලදී.

## ඇදුරු දඩයම




කථිකාචාර්ය සත්‍යපාල වන්නිගම


සරසවි ආචාර්යවරු අතර සිටි ප්‍රගතිශීලී ආචාර්‍යවරු සිසු අරගලයට නොමද සහයක් ලබා දුන්හ. එවැනි ප්‍රගතිශීලී ඇදුරුතුමකු වූයේ රුහුණු විශ්වවිද්‍යාලයේ කථිකාචාර්ය සත්‍යපාල වන්නිගමය. තමන් විශ්වාස කල යහපත් සමාජයක් නිර්මාණය කිරීමේ අරගලය වෙනුවෙන් නොබියව කැපවී කටයුතු කල වන්නිගම ඇදුරුතුමා 1987 නොවැම්බර් 13 දා අත්අඩංගුවට ගනු ලැබුණි. ඉන් පසු විවිධ වධ බන්දනවලට ලක් කරමින් රඳවා තබාගෙන සිට 1988 ජනවාරි 06වෙනිදා ඔහුව අමානුශික ලෙස ඝාතනය කොට සිරුර හම්බන්තොට වැටිය ප්‍රදේශයේ ගෙනවිත් දමා තිබුණි.

## පළමු පාසල් සිසු ඝාතනය

ශිෂ්‍ය උද්ඝෝෂණ ව්‍යාපාරය පාසල් දක්වාද ව්‍යාප්ත වී ගියේය. විශේෂයෙන් පාසල් අධ්‍යාපනය පෞද්ගලීකරණය කිරීම සඳහා ආණ්ඩුව යෝජනා ගෙනවිත් තිබූ අතර ඒවාට එරෙහිවත් පොදු ශිෂ්‍ය අරගලය සමඟ ඒකාබද්ධ වීමට පාසල් සිසුන් පෙරටම පැමිණියේය. පාසල් මට්ටමින් ශිෂ්‍ය උද්ඝෝෂණ ඇතිවිය.

ආණ්ඩුව පාසල් සිසුන් බියගන්වා මර්දනය කිරීමට උත්සාහ කළේය. 1988 මාර්තු මාසයේ 27 වෙනි දා තංගල්ල මහා විද්‍යාලයේ උසස් පෙළ පන්තිවල ඉගෙනුම ලැබූ වසන්ත වීරසිංහ හා ප්‍රසන්න වනිගසිංහ යන පාසල් සිසුන් දෙදෙනා රාත්‍රියේ නිවෙස් වලින් පැහැරගෙන ගොස් ආරක්ෂක අංශ විසින් මරා දමන ලදී. මෙම කෲර ඝාතනයන්ට එරෙහිව යළිත් පාසල්, කාර්මික විද්‍යාල ඇතුළු සියලු





**වසන්ත වීරසිංහ සහෝදරයා** **ප්‍රසන්න වනිගසිංහ සහෝදරයා**

උසස් අධ්‍යාපන ආයතන වල උද්ඝෝෂණ වර්ධනය විය.

මතුවෙමින් පැවැති තත්ත්වය විසින් ඉල්ලා සිටිනු ලැබුවේ

තව තවත් සංවිධානය වීමටය. සමාජවාදී ශිෂ්‍ය සංගමය ඉක්මනින්ම ලාංකේය ශිෂ්‍ය ව්‍යාපාරය මෙහෙය වීමට අවශ්‍ය සංවිධාන මඟ පෙන්වීම නිසි පරිදි සිදු කරන ලදී. සමාජවාදී ශිෂ්‍ය සංගමය 1986 සිට 1988 මැද දක්වා ප්‍රධාන ලේකම් ලෙස කටයුතු කළේ ආනන්ද ඉඩමේගම සහෝදරයාය. අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලයේ කැඳවුම්කරු වගකීම 1986 සිට 1987 දෙසැම්බර් දක්වා දරුවේ බී. සේනාරත්න සහෝදරයායි. 1987 දෙසැම්බර් සිට 1988 මැයි 08 දක්වා අන්තරේ කැඳවුම්කරු වගකීම දරුවේ නිමල් බාලසූරිය සහෝදරයාය. සමාජවාදී ශිෂ්‍ය සංගමයේ මූලික සංවිධානයේ වගකීම් ඉටුකරමින් වෛද්‍ය පීඨ අරගලයට නායකත්වය සැපයුවේ වෙනුර එදිරිසිංහ සහෝදරයා ය.

# 12. ජාතික ශිෂ්‍ය සටන් මධ්‍යස්ථානය ගොඩනැගේ

සරසවි පද්ධතිය වසා දැමීමත් සමග සියලු විශ්වවිද්‍යාල වල සිසු ක්‍රියාකාරීන් මැදිහත් වී දිස්ත්‍රික් සරසවි සිසු දෙමාපිය සංගම් පිහිටුවනු ලැබුණි. ඉන්පසු ඒවා ඒකාබද්ධ කොට ''සමස්ත ලංකා සරසවි සිසු දෙමාපිය සංගමය" ගොඩනගන ලදී. වෛද්‍ය පීඨ ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටුව ද මැදිහත් වී දිස්ත්‍රික් මට්ටමින් වෛද්‍ය ශිෂ්‍ය කමිටු ගොඩනගන ලදී. කාර්මික විද්‍යාල මට්ටමින් ද, උසස් තාක්‍ෂණ ආයතන මට්ටමින් ද සිසුන් සංවිධානය වෙමින් පැවතුණි. අන්තර් විශ්වවිද්‍යාල භික්‍ෂු බලමණ්ඩලය ද විශාල වැඩකොටසක් කරමින් සිටියේය. මේ සියල්ල ඒකාබද්ධ කරන සංවිධානයක අවශ්‍යතාවය ඇති වූයේ ඒ අනුවය. "ජාතික ශිෂ්‍ය සටන් මධ්‍යස්ථානය" ගොඩනැගෙන්නේ ඒ අනුවය.

1988 මැයි මස 08 වෙනිදා කොළඹ වැල්ලවත්තේ දී පාරේ ගමන් කරමින් සිටියදී අ.වි.ශි.බ.ම. කැදවුම්කරු නිමල් බාලසූරිය සහෝදරයාට බෝම්බ ප්‍රහාරයක් එල්ල කර ඔහුව ඝාතනය කරන ලදී. ශිෂ්‍ය ව්‍යාපාරයට නායකත්වය සපයමින් සිටියදී සිදු කරන ලද මෙම අමානුෂික ඝාතනයට එරෙහිවද රට පුරා සිසු විරෝධතා අලුත් වටයකින් ඇවිල යන්නට විය.

1988 ජූනි 20 ශිෂ්‍ය වීර දිනයේ රට පුරා පාසල් ඇතුළු අධ්‍යාපන ආයතන වල විරු සමරු වැඩසටහන් හා උද්ඝෝෂණ පැවැත්වුණි. මාතර දික්වැල්ල විජිත මහා විද්‍යාලයේදී සිසු උද්ඝෝෂණයක් පැවති අතර පොලීසිය ඊට වෙඩි තබන ලදී. නිශාන්ත ජයවර්ධන සිසුවා වෙඩි වැදීමෙන් මරණයට පත් විය.

1988 ජූලි පමණ වනවිට වෛද්‍ය පීඨ අරගලයට ද වසරක් පිරෙමින් පැවති අතර පාලකයින් තවදුරටත් බිහිරි අලින් සේ කටයුතු කරනු දක්නා ලදී. ''වෛද්‍ය අධ්‍යාපනය නැවතී වසරයි! පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය ජනසතු කරව්!! " යනුවෙන් රට පුරා පෝස්ටර් ඇලවීමට අන්තර් වෛද්‍ය පීඨ ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටුව කටයුතු කරන ලදී.

පෝස්ටර් අලවමින් සිටි වෙනුර එදිරිසිංහ සහෝදරයා අත් අඩංගුවට ගනු ලැබුණි. වෛද්‍ය සිසුන් හා ආචාර්ය මණ්ඩලය ඉදිරිපත් වී කළ උද්ඝෝෂණ නිසා ඔහුව නිදහස් කිරීමට ආණ්ඩුවට සිදු විය.

ඉන් පසු රාගම පෞද්ගලික වෛද්‍ය විද්‍යාල තාප්පයේ "හොර වෙද කඩය - උපාධි විකිණීමට තිබේ" යන සටන් පාඨය ලියමින් සිටියදී වෙනුර සහෝදරයා යළිත් අත්අඩංගුවට ගන්නා ලදී. එහිදී පොලිස් සිර මැදිරියේ මාරාන්තික උපවාසයක් ආරම්භ කිරීම නිසා මෙවර ද වෙනුර සහෝදරයා නිදහස් කිරීමට පාලකයන්ට සිදු විය.

මේ දිනවලම එනම් ජූලි 29 හා 30 ඉන්දු-ලංකා ගිවිසුමින් රට පාවා දී වසරක් පිරීම නිමිති කර ගනිමින් දේශප්‍රේමී ජනතා ව්‍යාපාරය විසින් මුළු රට පුරා දැවැන්ත විරෝධතා ව්‍යාපාරයක් ප්‍රකාශයට පත් කර ක්‍රියාවට නැගූ අතර එහිදී ශිෂ්‍ය ව්‍යාපාරය පැත්තෙන් පෙරටුගාමී කාර්යභාරයක් ඉටු විය.

මේ අතර පෙළගැසෙමින් පැවති ආණ්ඩුවේ ජනතා ද්‍රෝහී වැඩපිළිවෙලට එරෙහිව ජාතික දේශපාලනය තුළ ප්‍රගතිශීලී බලවේග එක්තැන් කිරීමට ජනතා විමුක්ති පෙරමුණ කටයුතු කළ අතර ඒ සඳහා ජාතිය ගලවාගැනීමේ වැඩපිළිවෙළක් සකස් කරන ලදී. එය වගන්ති 45කින් යුක්ත විය. මේ වැඩපිළිවෙළ සමග වෘත්තීය සමිති, බහුජන සංවිධාන එක් වූ අතර ශිෂ්‍ය ව්‍යාපාරය ද එයත් සමග පෙළ ගැසුනි. මේ සඳහා සාකච්ඡා වට ගණනාවක් පැවැත්වුණි. පොදු වැඩපිළිවෙළ

සමග තව තවත් සංවිධාන එක්කර ගැනීමට ශිෂ්‍ය ක්‍රියාකාරීන් සැලකිය යුතු වැඩ කොටසක් ඉටු කළහ.

1988 ඔක්තෝබර් 18 දා දේශපාලන පක්ෂ 08ක් අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බල මණ්ඩලය සමග ඒකාබද්ධ ප්‍රකාශයක් නිකුත් කරන ලදී. ඒවා නම් ජනතා විමුක්ති පෙරමුණ, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය, මහජන එක්සත් පෙරමුණ, මුස්ලිම් කොංග්‍රසය, ප්‍රජාතන්ත්‍රවාදී කම්කරු සංගමය, ලිබරල් පක්‍ෂය, ද්‍රවිඩ සංගමය හා එක්සත් ලංකා ජනතා පක්ෂයයි.

එහිදී මූලිකවම ඉල්ලා සිටිනු ලැබුයේ, පාර්ලිමේන්තුව විසුරුවා හැර භාරකාර රජයක් යටතේ ජනාධිපතිවරණයක් හා මහ මැතිවරණයක් පැවැත්විය යුතු බවය. විධායක ජනාධිපතිධූරය හිස් කිරීමත්, පළාත් සභා විසුරුවා හැරීමත්, ජයවර්ධන-රජීව් ගිවිසුම අහෝසි කිරීමත් ආදී කරුණු ද ඊට ඇතුළත් විය.

මේ සඳහා මල්වතු හා අස්ගිරි මහානායක හිමිවරු ද සහය පළකරමින් ප්‍රකාශයක් නිකුත් කළහ. එසේම ප්‍රධාන වෘත්තීය සමිති හා සංවිධාන 20ක් මේ සමග පෙළ ගැසී ආණ්ඩුවට බලකිරීමට එක් විය.

රාජ්‍ය මර්දනය අනුක්‍රමයෙන් ඉහළ යමින් පැවති අතර නිල හමුදා හා පොලීසි වලට අමතරව විවිධ රාජ්‍ය මැර කල්ලි නිර්මාණය වන්නට විය. ප්‍රා, ස්‍රා, කහ බළල්ලු ආදී විවිධ නම් වලින් ඒවා හැඳින්වුනු අතර ආණ්ඩු විරෝධී ක්‍රියාකාරීන් පැහැරගෙන ගොස් වධ දී ඝාතනය කිරීම ඔවුන්ගේ කොන්ත්‍රාත්තුව විය. මෙහිදී ''ප්‍රා'' සංවිධානය ගොඩනැගීමේ දී පැරණි වමේ කණ්ඩායම් මූලික වූ අතර විශ්වවිද්‍යාලවල ස්වාධීන ලේබල් යටතේ ක්‍රියාත්මක වූ අවස්ථාවාදී ශිෂ්‍ය කණ්ඩායම්ද ඒවාට එක් විය. රාජ්‍ය මර්දන යන්ත්‍රය සමග එක් වූ ඔවුන් ප්‍රගතිශීලී බලවේග මර්දනය කිරීමටත්, තම සැබෑ පංතිය වූ ධනපති පංතියට සේවය කිරීමටත් එළිපිටම පටන් ගත්හ.

මර්දනය තව තවත් උත්සන්න විය. වෛද්‍ය පීඨ කමිටුවේ රත්නපුර ශාඛාවේ ප්‍රධානියා වූ ද සමාජවාදී ශිෂ්‍ය සංගමයේ රත්නපුර දිස්ත්‍රික් සංවිධායක සහෝදරයාද වූ පද්මසිරි ත්‍රිමා විතාන ඇතුළු තවත් සහෝදරවරු දෙදෙනෙක් (රංජිත් හා බන්දුවර්ධන) පැහැරගෙන

ගොස් අමානුෂික වධ දී මරා දමන ලදී. මෙම සිදුවීම සිදුවන්නේ 1988 ඔක්තෝබර් මාසයේ දීය. එවකට රත්නපුර එ.ජා.ප. මැර ඇමතියෙකු වූ සුසන්ත පුංචි නිලමේ හා ඔහුගේ මැරවරයන් මේ කෲර ඝාතනය සිදුකර තිබූ අතර කොතෙක් වධයට ලක්කර තිබුණේද යත් හිස්වලට පරාල ඇණ ගසා තිබුණි.


ආණ්ඩුව උත්සාහ කළේ මළ සිරුරු අදාල නිවෙස්වලට යවා රහසේම අවමගුල් කටයුතු සිදු කිරීමටය. එහෙත් වෛද්‍ය පීඨ ශිෂ්‍ය කමිටුවේ මතය වූයේ සිරුරු වෛද්‍ය පීඨයට ලබාදිය යුතු බවත් එහිදී අවසන් ගෞරව දැක්වීමට අවස්ථාව දියයුතු බවත්ය. එහෙත් ආණ්ඩුව එය ප්‍රතික්ෂේප කළේය.



ත්‍රිමා විතාන
සහෝදරයා



බන්දුවර්ධන
සහෝදරයා



රංජිත් පෙරේරා
සහෝදරයා

මේ තත්ත්වය තුළ සිය සහෝදර සිසුවාගේ ඝාතනයෙන් කෝපයට පත් සිසුහු කොළඹ මහ රෝහලේ වහල මත නැගී මාරාන්තික උපවාසයක් ආරම්භ කළහ. එසේම සිරුර ලබා නොදුන්නහොත් පීඨය තුළ ගිනි තබා ගන්නා බවට ද සිසුහු අනතුරු ඇඟවූහ. මේ තත්ත්වය තුළ ත්‍රිමා විතාන සහෝදරයාගේ සිරුර සිසුන්ට බාරදෙනවා හැර ආණ්ඩුවට වෙන කිසිවක් කළ නොහැකි විය.

සිසුන් සිරුර ලබාගැනීමේදී ඉදිරිපත් කළ, ආණ්ඩුව එකඟ වූ කොන්දේසි කිහිපයකි. එනම් සිසුන් තීරණය කරන දින ගණනක් අවසන් ගෞරව දැක්වීම සඳහා මෘත ශරීරය වෛද්‍ය පීඨයේ

තබාගන්නා බවටත්, අවමගුල් පෙරහැර කොළඹ වීදි හරහා ගෙන යන බවටත්, ඇඳිරි නීතිය පනවා ජනතාව රැස්වීම වැළැක්වුවහොත් ඇඳිරි නීතිය අවසන් වනතුරු අවසන් කටයුතු සිදු නොකොට තබාගන්නා බවටත් යන කොන්දේසීන්ය.

දින ගණනක් තිස්සේ ලක්ෂ ගණනක් ජනතාව මේ කෲර සිසු ඝාතනය දැක ගැනීමට පැමිණෙන ලදී. 1988 නොවැම්බර් 03 වෙනිදා ලක්ෂ ගණනක සිසු, ජන සහභාගීත්වයෙන් බොරැල්ල කනත්ත දක්වා ගිය අවමගුල් පෙරහරකින් ත්‍රිමා විතාන සහෝදරයාගේ අවමංගල්‍ය කටයුතු සිදුකරන ලදී.

මේ සමග මතු වූ දැඩි ආණ්ඩු විරෝධය නිසා පාලකයින්ට පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය තවදුරටත් එසේ පවත්වාගෙන යාමේ හැකියාවක් නොතිබුණි. ඒ නිසා ලාංකේය ශිෂ්‍ය ව්‍යාපාරය වසර ගණනාවක් තිස්සේ බොහෝ පරිත්‍යාගයන් හා කැපකිරීම් සිදු කළ එක් අරගලයක් ඓතිහාසික ලෙස ජයග්‍රහණය කරන ලදී. ඒ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය ජනසතු කිරීමට පාලකයින්ට තීන්දු කිරීමට සිදුවීමත් සමගය. අද කැළණිය විශ්වවිද්‍යාලයට අනුබද්ධකොට රාගම පවතින වෛද්‍ය පීඨය නිදහස් අධ්‍යාපන වරප්‍රසාදයක් බවට පත් වූයේ ඒ අන්දමටය.

## ආණ්ඩුවෙන් මැතිවරණ උගුලක්

සංවිධාන ගණනාවක් ඒකාබද්ධ වී ඇතිකරගන්නා ලද ප්‍රතිපත්ති රාමුව මත හිඳිමින් ආණ්ඩුවට බලපෑම් කළයුතු වුවත් ශ්‍රී.ල.නි.ප.ය පැත්තෙන් ප්‍රදර්ශනය වූයේ සිරිමාවෝ බණ්ඩාරනායකව ජනාධිපතිවරණයට ඉදිරිපත් කිරීමේ වුවමනාවයි. මේ තත්ත්වය තුළ රාජ්‍ය ත්‍රස්තවාදය සහිතව පවත්වන ජනාධිවතිවරණයකට ඉදිරිපත්වීමට ශ්‍රී ලනිපය තීන්දු කිරීමෙන් ඇතිකරගත් පොදු එකඟතාව බිඳ වැටුණි. ඒ අනුව දේශප්‍රේමී බලවේග සියල්ල මැතිවරණය වර්ජනය කිරීමට තීන්දු කළ අතර 1988 නොවැම්බර් 10 පැවති ජනාධිපතිවරණයට ආණ්ඩුවෙන් හිටපු අගමැති ප්‍රේමදාසත් ශ්‍රීලනිපයෙන් සිරිමා බණ්ඩාරණායකත් එක්සත් සමාජවාදී පෙරමුණින් ඔසී අබේගුණසේකරත් ඉදිරිපත්

වූහ.

එම මැතිවරණය සහමුලින්ම ආණ්ඩුවේ හමුදා හා පොලීසිත්, මැර කල්ලිත්, එජාප මැති ඇමතිවරුත් එක්ව රිසි සේ ඡන්ද පෙට්ටි පුරවන ලද අතිශය දූෂිත මැතිවරණයක් විය. දේශප්‍රේමී ජනතා ව්‍යාපාරයේ මෙහෙයවීමෙන් මැතිවරණ වර්ජන ව්‍යාපාරයක් ක්‍රියාත්මක වූ අතර අතිශය බහුතරයක් දෙනා ඡන්ද පොලවල් වලට ගියේ නැත.

මෙම ජනාධිපතිවරණයෙන් ප්‍රේමදාස 27.4%ක ප්‍රතිශතයක් ලබාගෙන ජනාධිපති වූ අතර රාජ්‍ය මැර හමුදා හා මිනීමරු කල්ලි එලෙසම තබාගනිමින් මතුපිටින් ජනතාව රැවටීමට හදිසිනීතිය ඉවත් කිරීමත් දේශපාලන රැඳවියන් ප්‍රමාණයක් නිදහස් කිරීමත් සිදු කළේය.

1989 පෙබරවාරි 15 මහමැතිවරණයක්ද පවත්වන ලද අතර දේශප්‍රේමී බලවේග එය වර්ජනය කිරීමට තීන්දු කළේ මුල් ප්‍රතිපත්තියේ ම සිටිමිනි. එහෙත් ශ්‍රීලනිපය එයට ඉදිරිපත් වීමට තීන්දු කරන ලදී. මහමැතිවරණය ජනාධිපතිවරණය මෙන්ම දූෂිත වූ අතර එ.ජා.ප.ය ජයගන්නා ලදී.

## ගිනි දැල් මැදින් සටන පෙරට ම

ඉඩමේගම සහෝදරයාගෙන් පසුව 1988 මැද භාගයේ සිට 1989 සැප්තැම්බර් පමණ දක්වා සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ප්‍රධාන ලේකම් තනතුර දැරුවේ ඩී. ආර්. නිශ්ශංක සහෝදරයාය. 1988 මැයි නිමල් බාලසූරිය සහෝදරයාගේ ඝාතනයෙන් පසු අන්තරේ කැඳවුම්කරු වගකීම දරන ලද්දේ වෙනුර එදිරිසිංහ සහෝදරයා විසිනි. 1989 සැප්තැම්බර් දක්වාම ඔහු ඒ වගකීම දැරුවේය.

මෙම වකවානුවේ පැවති අධික රාජ්‍ය මර්දනය නිසා වැඩකටයුතු සිදුකිරීමට සිදුවූයේ විශාල අවදානම්කාරී වටපිටාවක් තුළදී ය. මේ නිසා ශිෂ්‍ය ක්‍රියාකාරීත්වයට ද විවිධ උපක්‍රම භාවිත කිරීමට සිදුවිය, අතිශය දුෂ්කර පරිසරයක් තුළ වුවත් පාසල් හා අනෙකුත් අධ්‍යාපන ආයතන දක්වා ම විහිදුණු දැවැන්ත සංවිධාන

ජාලයක් ගොඩනැගීමට සමාජවාදී ශිෂ්‍ය සංගමයට හැකි වී තිබුණි. රට තුළ මතුව පැවති දේශප්‍රේමී උද්ඝෝෂණය ආණ්ඩුවට එරෙහිවත් ඉන්දියානු ආක්‍රමණයට එරෙහිවත් පෙළ ගැසී තිබුණි. මේ සටන තුළ ශිෂ්‍ය ව්‍යාපාරය සිය වගකීම් කොටස නොපිරිහෙළා ඉටු කරමින් අවදානම්කාරී පරිසරය තුළ පවා උද්ඝෝෂකයාගේ කාර්යභාරයට උරදී සිටියේ ය.

1989 ජූනි මස 06 වෙනිදා එසේ පෙළගස්වා ගත් විවිධ සංවිධාන එක වේදිකාවකට ගෙන එමින් නුගේගොඩදී දැවැන්ත විරෝධතා රැළියක් සංවිධානය කරන ලදී. ''ඉන්දියානු ආක්‍රමණිකයාගෙන් මවුබිම බේරා ගනිමු'' යන තේමාව යටතේ මෙය පැවැත්විනි. සහභාගී වූ සංවිධාන වූයේ

* අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලය
* අන්තර් විශ්වවිද්‍යාල භික්ෂු බලමණ්ඩලය
* සමස්ත ලංකා විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ගේ දෙමාපිය සම්මේලනය
* එක්සත් ලංකා ජනතා පක්ෂය
* ශ්‍රී ලංකා ප්‍රගතිශීලී පෙරමුණ

යන ඒවාය.

මෙහිදී අන්තර් විශ්වවිද්‍යාල ශිෂ්‍ය බලමණ්ඩලය නියෝජනය කරමින් කතා කළේ එස්. එම්. නිෂ්මි සහෝදරයා වූ අතර ඉන්දියන් ආක්‍රමණිකයාගෙන් මවුබිම නිදහස් කරගැනීමටත් ජනතා ද්‍රෝහී පාලනයටත් එරෙහිව ජයග්‍රහණය දක්වාම සටන් කරන බව පැයක පමණ වේගවත් කතාවක් කරමින් කියා සිටියේ ය. භික්ෂූන් වහන්සේලා, සරසවි සිසු සිසුවියන්, පාසැල් සිසු සිසුවියන්, දෙමාපියන් ඇතුළු දේශප්‍රේමී ජනතාවගෙන් රැළියේ භූමිය හා අවට මහාමාර්ග අතුරු සිදුරු නැතිව පිරීගොස් තිබුණි. මෙහිදී අන්තර් විශ්වවිද්‍යාලයීය භික්ෂු බලමණ්ඩලය වෙනුවෙන් බලහරුවේ සෝම හිමියන්ද, ආයුර්වේද නිමල්, තිලක් කරුණාරත්න, එස්. ඩී. බණ්ඩාරණායක, ආරිය බුලේගොඩ, රුක්මන් සේනානායක හා දොස්තර විජේසේකර යන අයද මෙහිදී කතා පැවැත්වූහ.

# අලුගෝසුවන්ගේ හෝරාව

1989 ජූලි මස 12වෙනිදා හමුදාව සහ පොලීසිය එක්ව මුළු පේරාදෙණිය සරසවියම වටකරන ලදී. ඒ සිසු නායකයින් කිහිපදෙනෙකු අත්අඩංගුවට ගැනීම සඳහාය. හෙලිකොප්ටර් යානා ද යොදාගත් මෙම මෙහෙයුමට හමුදාවේ හා පොලීසියේ 5000ක් පමණ යොදාගත් බව ප්‍රකාශ වේ. සිසුන්ගේ හැඳුනුම්පත් ආදිය පරීක්ෂා කිරීමට සිසුන් විරෝධය පළ කරනු ලැබූ අතර මේ වන විට සරසවියේ සිටි නිශ්මි හා උපුල් නානායක්කාර ඇතුළු සිසු නායකයින් කිහිප දෙනෙක්ම සිසුන් විසින් උපක්‍රමශීලිව සරසවියෙන් පිටකරනු ලැබීය. ඒ නිසා මෙම මෙහෙයුමින් ආණ්ඩුව බලාපොරොත්තු වූ කිසිවකු අත්අඩංගුවට ගැනීමට හැකිවූයේ නැත.

මෙසේ රාජ්‍ය මර්දනය තව තවත් උත්සන්න කරන ලදී. ජනතා උද්ඝෝෂණ හා පෙළපාලි වලට දරුණු පොලිස් ප්‍රහාරයන් එල්ල විය. වෙඩිතබා සිය ගණන් ජනතාව ඝාතනය කරන ලදී. ඒ අතර නිල නොවන රාජ්‍ය ත්‍රස්ත කල්ලි දේශප්‍රේමීන් පැහැරගෙන යමින් වධයට ලක්කරමින් ඝාතනය කරන්නට වූහ. පාරවල්වල ටයර් දමා පිලිස්සුණු සිරුරු ද, ගංගාවල පාකරන ලද මළ සිරුරුද සහිත අතිශය භීෂණකාරී පරිසරයක් ආණ්ඩුව විසින් නිර්මාණය කරන ලදී. වධ කඳවුරු රට පුරා පිහිටුවා තිබුණි.

ආණ්ඩුවේ පැහැරගැනීම් අතුරුදන් කරවීම් ඇතුළු බරපතළ ප්‍රජාතන්ත්‍ර විරෝධී ක්‍රියාවලියට එරෙහිව කටයුතු කිරීමට ''මානව හිමිකම් සුරැකීමේ ශිෂ්‍ය සංවිධානය'' (STUDENT FOR HUMAN RIGHTS) පිහිටුවා ගනු ලැබුණි. මෙහි ප්‍රමුඛ පෙළේ කාර්යභාරයට උරදුන්නේ කැළණිය විශ්වවිද්‍යාලයේ ගැමුණු යසස් සෙනෙවිරත්න හෙවත් ගයාන් සහෝදරයාත්, පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ උදේනි බන්දුල දිසානායක සහෝදරයාත් ය.

1989 සැප්තැම්බර් සිට නිශ්ශංක සහෝදරයාගෙන් පසු කෙටි කලකට කේ.ටී. නිමල්සිරි සහෝදරයා සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ප්‍රධාන ලේකම් වගකීම දරන ලදී. ඉන්පසු 1990 ජනවාරි පමණ දක්වා උපුල් නානායක්කාර සහෝදරයාත්, 1990 ජනවාරි සිට මාර්තු දක්වා

අතුල සේනාරත්න සහෝදරයාත් සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ප්‍රධාන ලේකම් වගකීම දරන ලදී.

1989 ඔක්තෝම්බර් සිට අන්තර් විශ්වවිද්‍යාලීය ශිෂ්‍ය බලමණ්ඩලයේ කැඳවුම්කරු වගකීම උදේනි බන්දුල දිසානායක සහෝදරයා විසින් දරන ලද අතර, 1990 ජනවාරියෙන් පසු අතුල සේනාරත්න සහෝදරයාත්, ඉන්පසු සිසිර කීර්ති ජයවර්ධන සහෝදරයාත් එම වගකීම දරන ලදී.

ශිෂ්‍ය නායකයින් ද, ක්‍රියාකාරකයින් ද විශාල පිරිසක් මෙකී රාජ්‍ය මර්දනයට ගොදුරු විය. කුරිරු වධ වේදනාවන්ට ලක් විය. ඔවුහු සිය අමිල දිවි කුසුම් නිදහස් අධ්‍යාපනයත් පොදු ජනතාවගේ අයිතිවාසිකම් හා නිදහස වෙනුවෙන් කැප කරන ලදහ.

විශ්වවිද්‍යාල, පාසල් හා අනෙකුත් අධ්‍යාපන ආයතනවල සිය දහස් ගණනක් සිසු සිසුවියන් හා භික්ෂූන් මෙසේ ජීවිත පරිත්‍යාග කරන ලද අතර දරුණු භීෂණකාරී වටපිටාවක් නිසාත් ක්‍රියාකාරීන් බොහෝ ගණනක් ජීවිත පරිත්‍යාග කළ නිසාත්, ඔවුන් පිළිබඳ ඉතිරිව ඇති තොරතුරු අතිශය සීමිතය. එහෙයින් තොරතුරු දන්නා කිහිපදෙනෙකුගේ පමණක් තොරතුරු ඉදිරිපත් කිරීමට සිදුවී තිබේ.

# ශාන්ත බණ්ඩාර සහෝදරයා



ශාන්ත බණ්ඩාර සහෝදරයා කොළඹ කෝට්ටේ ප්‍රදේශයේය. 1975 දී පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයට ඇතුළත් විය. වීරසූරිය ඝාතනයත් සමඟ ප්‍රගතිශීලී ශිෂ්‍ය බලවේගයේ ඉදිරිපෙළ ක්‍රියාකාරිකයකු වූ ශාන්ත බණ්ඩාර සහෝදරයා විද්‍යා පීඨයේ සභාපති ද, මහා ශිෂ්‍ය සංගමයේ ලේකම් ද බවට පත්විය. එසේම ඔහු සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ක්‍රියාකාරිකයකු විය.

1978 හාල් පොත් කැපීමටත්, ඒකාධිපති ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවටත් එරෙහිව උද්ඝෝෂණය සම්බන්ධ සිදුවීමේ දී ශිෂ්‍ය භාවය අත්හිටුවන ලද අයගෙන් එක් අයෙක් වූයේ ශාන්ත බණ්ඩාර සහෝදරයාය. ඉන්පසුව පූර්ණකාලීනව ශිෂ්‍ය ව්‍යාපාරය තුළ වැඩ කටයුතු ඇරඹූ ඔහු 1978 හා 1979 වසර වල අන්තර් විශ්වවිද්‍යාලීය ශිෂ්‍ය බලමණ්ඩලයේ කැඳවුම්කරු ද විය. 1980 වකවානුවේ සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ප්‍රධාන ලේකම් වගකීම පැවරුණේද ශාන්ත බණ්ඩාර සහෝදරයාටය.

අධ්‍යාපන ධවල පත්‍රිකාවට එරෙහි අරගලයේ දී මාතරදී හා වැල්ලවායේදී ඔහුව අත් අඩංගුවට ගන්නා ලදී. තම මුළු මහත් ජීවිත කාලයම ශිෂ්‍ය ව්‍යාපාරය වෙනුවෙන් කැප කළ ඔහු ජ.වි.පෙ. මධ්‍යම කමිටු සාමාජිකයකු බවටද පත්විය. 1983 ජ.වි.පෙ. තහනමින් පසුව එහි 1984 දී දේශපාලන මණ්ඩලය පුළුල් කල අතර ඒ සඳහා ශාන්ත බණ්ඩාර සහෝදරයාද එක්කර ගනු ලැබුණි. ඉතාම දක්ෂ සංවිධායෙකුද, උද්ඝෝෂකයෙකු ද, කථිකයෙකු ද වූ ඔහු විවිධ ක්ෂේත්‍රවල වැඩ කටයුතු කළේය.


1987 දී අඟුරුවාතොට පොලීසිය විසින් අත් අඩංගුවට ගනු ලැබූ අතර එදිනම කොළඹ ත්‍රස්ත විමර්ශන ඒකකයට ගෙන එනු ලැබුණි. එදින රාත්‍රියේ ඔහුගේ මුරට සිටි භටයින් දෙදෙනා සමඟ

දිගටම කතාකරමින් සිට අතර රාත්‍රි ඔවුන්ට නින්ද ගිය පසු මාංචුව අතින් පන්නාගෙන (ඔහුගේ අත්වල තිබූ විශේෂ ස්වභාවය නිසා මේ හැකියාව ලැබුණි) පැන යන ලදි. ඉන්පසුව 1988 හම්බන්තොට නාකුලුගමුවේදි යලිත් අත්අඩංගුවට ගනු ලැබූ අතර මාස කිහිපයකට පසු යලිත් නිදහස් විය.

යළිත් ක්‍රියාකාරී දේශපාලනයේ නියලුනු අතර 88-89 දේශප්‍රේමී අරගලයේ ඉදිරිපෙළ නියමුවෙක් විය. 1989 රෝහණ විජේවීර සහෝදරයාත්, ගමනායක සහෝදරයාත් ඝාතනය කරනු ලැබූ වටපිටාවක පවා යළි පක්ෂය සංවිධානය කිරීමට කටයුතු කළේය. 1990 මුල කාලයේ රත්නපුර ප්‍රදේශයේදී රාජ්‍ය හමුදා මගින් අත් අඩංගුවට ගෙන මත්තේගොඩ කඳවුරට ගෙනවිත් ඝාතනය කර ඇත.

අතිශයින්ම නිර්භීත සටන් නායකු වූ ශාන්ත බණ්ඩාර සහෝදරයා මත්තේගොඩ කඳවුරේ රඳවා සිටියදී පවා විමුක්ති ගී ගයමින් සිටි බව එහි සිටි අනෙක් සහෝදරවරු පවසා තිබේ. නිසැක ලෙසම තමාව මරා දමන බව දැන සිටියත් ඒ පිළිබඳව කිසිදු බියක් පළකොට නැති අතර රඳවා සිටි අනෙකුත් අයට ද උපරිම ධෛර්ය සපයා තිබේ. එහි අහම්බෙන් හමුවූ අයකුට පවසා තිබුනේ නිදහස් වී ගියහොත් ''කිසිවෙක් පවා නොදී තමා මිය ගියබව පක්ෂයට දැනුම් දෙන ලෙසය.''

## එච්. බී. හේරත් සහෝදරයා.




අනුරාධපුර මැදවච්චිය ප්‍රදේශයෙන් ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට පැමිණි හේරත් සහෝදරයා එහි ඉදිරි පෙළ ශිෂ්‍ය ක්‍රියාකාරිකයකු විය. සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ක්‍රියාකාරිකයෙකි. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මහා ශිෂ්‍ය සංගමයේ සභාපති බවට පත්විය. ඉන්පසුව අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බලමණ්ඩලයේ කැඳවුම්කරු

බවට පත්විය. මෙම වකවානුවේ අධ්‍යාපන ධවල පත්‍රිකාවට එරෙහි සටන පැන නැගි කාලය වු අතර එහිදී හේරත් සහෝදරයාගේ මැදිහත්විම කැපි පෙනුණි.

පසුව සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ප්‍රධාන ලේකම් වගකීම ද දැරූ හේරත් සහෝදරයා, මුළු මහත් දිවියම ජනතාව වෙනුවෙන් කැපකළ අභීත නායකයෙකි. ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කමිටුවද, පසුව දේශපාලන මණ්ඩලයද නියෝජනය කළ අතර දේශප්‍රේමි අරගලයේ දී විශාල කාර්යභාරයකට උර දුන්නේය. 1989 නොවැම්බර් මාසයේ අත් අඩංගුවට ගෙන ඝාතනය කරන ලදී.

## උපාලි ජයවීර සහෝදරයා



උපාලි ජයවීර සහෝදරයා මොණරාගල ඔඩුමුල්ල ප්‍රදේශයේය. 1981 මාර්තු මස කැලණිය විශ්වවිද්‍යාලයට ඇතුලු වු උපාලි ජයවීර සහෝදරයා ඉතාමත් කඩිසර ශිෂ්‍ය ක්‍රියාකාරිකයකු විය. පොදු ශිෂ්‍යයන් අතර ජනප්‍රිය සිසු නායකයකු වු හෙතෙම මහා ශිෂ්‍ය සංගමයේ සභාපති ලෙසද පත්විය. ධවල පත්‍රිකා සටනේ දී 1981 දෙසැම්බර් මොණරාගල පොලීසිය මගින් අත් අඩංගුවට ගෙන මසක පමණ කාලයක් රඳවා ගනු ලැබීය.

1983 පසු නිල ශිෂ්‍ය සංගම් තහනම් කළ තත්ත්වය යටතේ විශ්වවිද්‍යාල ක්‍රියාකාරී කමිටු ගොඩ නගමින් වැඩ කිරීමට සිදුවී තිබුණි. 1983 හා 1984 මුල දී මේ සියලු අභියෝගවලට මුහුණ දෙමින් අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු වගකීම දැරුවේ ද උපාලි ජයවීර සහෝදරයාය.

පසුව 1984 දී සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ප්‍රධාන ලේකම් වගකිම පැවැරුණේද උපාලි ජයවීර සහෝදරයාටය. ඒ අතර ඔහුද මුළු ජීවිත කාලයම සමාජ විප්ලවීය අරමුණ වෙනුවෙන් කැප කළේය.

1985 සැප්තැම්බර් මාසයේ යළිත් අත් අඩංගුවට ගනු ලැබූ අතර මාස 04ක් පමණ රඳවා ගන්නා ලදී. 1986 ජූලි මස යළිත් වරක් ගාල්ලේ දී ද අත් අඩංගුවට ගනු ලැබ ටික දිනක් රඳවා ගනු ලැබිය. ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කමිටුව ද, පසුව දේශපාලන මණ්ඩලය ද නියෝජනය කළේය.

1990 ජනවාරි 02 නුවරඑළියේ දී රාජ්‍ය මැර හමුදා මගින් අත් අඩංගුවට ගෙන කඳවුරු කිහිපයක රඳවා තබා වද දී ඝාතනය කර ඇත.

## ලලිත් විජේරත්න සහෝදරයා




ලලිත් විජේරත්න සහෝදරයා ගම්පහ මීරිගම ප්‍රදේශයේය. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයට ඇතුළත් විය. විශ්ව විද්‍යාලය තුළ සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ක්‍රියාකාරිකයෙකු විය. ධවල පත්‍රිකා වට එරෙහි සටන ඇතුළු ඒ වකවානුවේ පැවති සෑම සිසු අරගලයකටම විශාල මැදිහත්වීමක් කරන ලදී.

උදලාගම කොමිසමේ මර්දන හස්තයට හසුවූ ලලිත් විජේරත්න සහෝදරයාගේ ද ශිෂ්‍ය භාවය අහෝසි කරන ලදි. ශිෂ්‍ය ව්‍යාපාරය වෙනුවෙන් පූර්ණ කාලීනවම කැප වී කටයුතු කරන ලද ලලිත් සහෝදරයා සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ප්‍රධාන ලේකම් වගකීමට ද පත්විය.


ඔහුද තම ජීවිත කාලයම පොදු ජනතාව වෙනුවෙන් යහපත් ලෝකයක් තැනීමේ අති උතුම් අරමුණ වෙනුවෙන් කැප කළ අතර ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කමිටුව ද පසුව දේශපාලන මණ්ඩලය ද නියෝජනය කළේය. 1989 සමයේ රාජ්‍ය හමුදාවන් විසින් අත් අඩංගුවට ගෙන ඝාතනය කරන ලදී.

## කේ. ටී. නිමල්සිරි සහෝදරයා



කේ. ටී. නිමල්සිරි සහෝදරයා හම්බන්තොට දෙබරවැව ප්‍රදේශයේය. දෙබරවැව මධ්‍ය මහා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය හැදෑරූ ඔහු අනතුරුව රුහුණු විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයට ඇතුළු විය. සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ඉදිරිපෙළ ක්‍රියාකාරිකයකු විය. ඔහු ද තම ජීවිත කාලයම පොදු ජනතාවගේ යහපත් හෙට දවසක් තනා ගැනීමේ උතුම් අරමුණ වෙනුවෙන් කැප කළ අතර 1989 සැප්තැම්බර් කාලයේ සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ප්‍රධාන ලේකම් ධුරයද දැරුවේය. 1991 පෙබරවාරි 27 ඇහැලියගොඩ දී අත් අඩංගුවට ගෙන පසුව රඳවා තබාගෙන සිට ඝාතනය කර ඇතැයි විශ්වාස කෙරේ.

## උපුල් නානායක්කාර සහෝදරයා



උපුල් නානයක්කාර සහෝදරයා "ලෙනෝරා" ලෙසත් හැඳින්විණි. ඔහුගේ උපන් ගම අනුරාධපුරය වන අතර අනුරාධපුර මධ්‍ය මහා විද්‍යාලයෙන් මූලික අධ්‍යාපනය හැදෑරූ ඔහු 1984/85 අධ්‍යයන වර්ෂ සඳහා ශ්‍රී ජයවර්ධනපුර සරසවියේ කළමණාකරණ අධ්‍යන හා වාණිජ විද්‍යා පීඨයට ඇතුලත් විය.

සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ද්විතික අංශයේ කලක් වැඩ කර ඇති උපුල් නානායක්කාර සහෝදරයා න්‍යායික දේට වඩා ප්‍රායෝගික පැත්තට උන්නදු වූ, පිළිවෙළකට සංවිධාන වැඩ කළ සහෝදරයෙකු ලෙස සැලකේ. ඔහු ජයවර්ධනපුර සරසවියේ දේශප්‍රේමී ශිෂ්‍ය ව්‍යාපාරයේ ක්‍රියාකාරිකයකු විය. ඒසේම 1989 ඔක්තෝම්බර් සිට 1990 ජනවාරි දක්වා සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ප්‍රධාන ලේකම් ධුරය දැරුවේය. හමුදා බුද්ධි අංශ මගින් අත් අඩංගුවට ගෙන ඝාතනය කළ බව විශ්වාස කෙරේ.

## අතුල සේනාරත්න සහෝදරයා



අතුල සේනාරත්න සහෝදරයා කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයේ ශිෂ්‍යයෙකි. වෛද්‍ය පීඨ ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටුවේ මූලිකයකු වූ අතුල සේනාරත්න සහෝදරයා පෞද්ගලික වෛද්‍ය විද්‍යාලයට එරෙහි සටනේ අඛණ්ඩව සිටි ඉදිරිපෙළ ක්‍රියාකාරිකයකු වූ අතර ''වෙද සිසු හඬ'' පුවත්පතේ සංස්කාරවරයෙකු ද විය. වෙනුර සහෝදරයාගෙන් පසු අන්තර් විශ්වවිද්‍යාලීය ශිෂ්‍ය බල මණ්ඩලයේ වගකීමට පත් වූ අතුල සහෝදරයා 1990 ජනවාරි සිට මාස කීපයක් එහි වගකීම් දැරීය. ඒසේම මෙම කාලය තුළ දී සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ප්‍රධාන ලේකම් ධුරය ද දැරුවේ ඔහුය. ඉතාම මර්දනකාරී වටපිටාවක මෙකල කටයුතු කිරීමට සිදුවිය. 1990 අගෝස්තු මස අත් අඩංගුවට ගෙන ඝාතනය කළ බව සැලකෙන අතර, ඒ දක්වාම ලාංකේය ශිෂ්‍ය ව්‍යාපාරය වෙනුවෙන් කටයුතු කළේය.


# ඩී. එම්. ආනන්ද සහෝදරයා

ඩී. එම්. ආනන්ද සහෝදරයා 1977 දී පමණ පේරාදෙණිය සරසවියේ කලා පීඨයට ඇතුළත් වුයේ භික්ෂුවක් ලෙසය. දිගටම ශිෂ්‍ය ක්‍රියාකරකම් සමඟ සම්බන්ධ වු අතර පසුව උපැවිදි විය. දක්ෂ කථිකයකු ද, සංවිධායකයකු ද වු ආනන්ද සහෝදරයා 1980 පේරාදෙණිය මහා ශිෂ්‍ය සංගමයේ සභාපති ලෙස පත්විය.

එසේම එච්. බී. හේරත් සහෝදරයාගෙන් පසු අන්තර් විශ්වවිද්‍යාලීය ශිෂ්‍ය බල මණ්ඩලයේ සභාපති ද විය. 1981 අධ්‍යාපන ධවල පත්‍රිකාවට එරෙහිව අරගලය සිදුවුයේ ඔහු අ.වි.ශි.බ.ම. සභාපති වගකීම දරණ වකවානුවේය.

සමාජවාදී ශිෂ්‍ය සංගමයේ මුල්පෙළ ක්‍රියාකාරිකයකු වු ආනන්ද සහෝදරයා පසුව ජනතා විමුක්ති පෙරමුණේ මධ්‍යම කමිටුවේ ද, දේශපාලන මණ්ඩලයේ ද වගකීම් දරන ලද අතර මුළු ජීවිතයම සමාජ විමුක්තිය උදෙසා කැප කරන ලදී. 88-89 දේශප්‍රේමී අරගලයේ විශාල කොටසකට උරදුන් අතර 1989 නොවැම්බරයේ දී රජයේ හමුදා මගින් අත් අඩංගුවට ගෙන ඝාතනය කර ඇත.

# රංජිතම් ගුණරත්නම් සහෝදරයා




කෑගල්ල ප්‍රදේශයෙන් පේරාදෙණිය ඉංජිනේරු පීඨයට පැමිණි රංජිතම් ගුණරත්නම් සහෝදරයා සරසවිය තුළ සමාජවාදී ශිෂ්‍ය සංගමයේ මුල් පෙල ක්‍රියාකාරිකයෙක් විය. ඔහුගේ පියා දෙමළ ද, මව සිංහල ද වීම විශේෂත්වයක් විය. උදාලගම කොමිසමේ සිසු මර්දනයට

රංජිතම් ගුණරත්නම් සහෝදරයා ද හසු කරගනු ලැබූ අතර ශිෂ්‍ය භාවය අහෝසි කරන ලදී. පූර්ණ කාලීනව ශිෂ්‍ය ව්‍යාපාරයේ වැඩ කටයුතු වලට රංජිතම් සහෝදරයා ද මැදිහත් වූ අතර 1985 අප්‍රේල් සිට නොවැම්බර් දක්වාත් ඉන්පසු 1986 ඔක්තෝම්බර් සිට නොවැම්බර් දක්වාත් එහි කැඳවුම්කරු වගකීම් දරණ ලදී.

1985 හා 1986 මුල දක්වා කාලයේ සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ප්‍රධාන ලේකම් වගකීම දරන ලද්දේ ද රංජිතම් ගුණරත්නම් සහෝදරයා වන අතර තම මුළු දිවියම පොදු ජන විමුක්තිය උදෙසා කැප කරන ලදී. ජ.වි.පෙ. මධ්‍යම කමිටුවද පසුව දේශපාලන මණ්ඩලයටද නියෝජනය කරමින් 1988-1989 දේශප්‍රේමී අරගලයේ ද ප්‍රධාන වැඩ කොටසකට උර දුන්නෙය. 1990 කාලයේ රජයේ හමුදා මගින් අත් අඩංගුවට ගෙන ඝාතනය කරන ලදී.

## ආනන්ද ඉඩමේගම සහෝදරයා




බදුල්ල හාලි ඇල ප්‍රදේශයෙන් ඉඩමේගම සහෝදරයා පේරාදෙණිය ඉංජිනේරු පීඨයට පැමිණියේය. පේරාදෙණිය සරසවිය තුළ සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ක්‍රියාකාරිකයකු වූ ඉඩමේගම සහෝදරයා ද උදාලගම කොමිසමේ සිසු මර්දනයට හසු කරගනු ලැබූ ශිෂ්‍ය භාවය අහෝසි කරන ලද සහෝදරයෙකි. ශිෂ්‍ය ව්‍යාපාරය වෙනුවෙන් පූර්ණ කාලීනව මැදිහත් වූ ඉඩමේගම සහෝදරයා අධ්‍යාපන හා න්‍යායික කරුණු ගැන මහත් උනන්දුවක් දැක් වූ සහෝදරයෙකි.

1986 සිට 1988 මැයි දක්වා සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ප්‍රධාන ලේකම් වගකීම දරන ලදී. ජ.වි.පෙ. මධ්‍යම කමිටුවද පසුව දේශපාලන මණ්ඩලය ද නියෝජනය කළ ඉඩමේගම සහෝදරයා දේශප්‍රේමී අරගලයේ දී බහුජන හා දේශපාලන පක්ෂ සමඟ සාකච්ඡා වලට ද සම්බන්ධ විය.

1989 මාතලේ ප්‍රදේශයේ රජයේ හමුදා මගින් අත්අඩංගුවට ගෙන ඝාතනය කර ඇත.


## ඩී.ආර්. නිශ්ශංක සහෝදරයා



රත්නපුර ගොඩකවෙල ප්‍රදේශයෙන් රුහුණු විශ්වවිද්‍යාලයේ වානිජ පීඨයයට ඇතුළත් වූ නිශ්ශංක සහෝදරයා විශාල කාලයක් සමාජවාදී ශිෂ්‍ය සංගමයේ මූලික සංවිධාන නියෝජනය කළ සහෝදරයෙකි. ශිෂ්‍ය ව්‍යාපාරයේ සංවිධාන කටයුතුවල විවධ තැන්වල නියැලුණු ඔහු තරමක් අඩුවෙන් කතා කල, එහෙත් පිළිවෙලට හා විධිමත්ව වැඩ පවත්වාගෙන ගිය සංවිධායකයෙකි.


1988 ජුනි සිට 1989 සැප්තැම්බර් දක්වා ම සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ප්‍රධාන ලේකම් වගකීම දරන ලදී. මුළු මහත් කාලය ම පොදුජන විමුක්තිය වෙනුවෙන් කැප කළ නිශ්ෂංක සහෝදරයා 1990 වසරේ ආණ්ඩුවේ මැර හමුදා මගින් අත් අඩංගුවට ගෙන ඝාතනය කර ඇත.

# බී. එම්. සේනාරත්න සහෝදරයා



අනුරාධපුරයෙන් කැලණිය විශ්වවිද්‍යාලයට පැමිණි සේනාරත්න සහෝදරයා කලා පීඨයේ අධ්‍යාපනය ලැබූ අතර ශිෂ්‍ය ක්‍රියාකාරකම් වලට ක්‍රියාකාරීව දායක විය. සමාජවාදී ශිෂ්‍ය සංගමයේ සහෝදරයකු වූ ඔහුව වැඩි දෙනෙක් ඇමතතුවේ ''සේන'' ලෙසය. 1986 සිට 1987 අග දක්වා අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු විය. 1986 අවසාන කාලයේ අත් අඩංගුවට ද ගනු ලැබ යළි නිදහස් කළේය. 1987 දෙසැම්බර් මාසයේදී යළිත් අත් අඩංගුවට ගෙන දින 14 ක් රඳවා ගන්නා ලදී. 1987 මැයි දින තහනමට එරෙහිව ද, ඉන්දු ලංකා ගිවිසුමට එරෙහිව ද ශිෂ්‍ය ව්‍යාපාරය මෙහෙයවීමට විශාල මැදිහත්වීමක් සිදු කළ සේනාරත්න සහෝදරයා මුළු දිවියම කැප කරන ලද්දේ ජනතාවගේ විමුක්තිය උදෙසාය. 1989 අවසානයේ රාජ්‍ය මැර හමුදා මගින් අත් අඩංගුවට ගෙන ඝාතනය කළ බවට විශ්වාස කෙරේ.


# නිමල් බාලසූරිය සහෝදරයා



කුරුණෑගල හෙට්ටිපොළ, බාලසූරිය සහෝදරයාගේ ගම් ප්‍රදේශයයි. මොරටුව විශ්වවිද්‍යාලයේ තාක්ෂණ විද්‍යා ජාතික ඩිප්ලෝමා පාඨමාලාවට පළමුව ඇතුළත් වූ බාලෙ සහෝදරයා පළමු වසරින් පසු ඉංජිනේරු පීඨයට


තේරී ඇතුලත් විය. අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බල මණ්ඩලය තුළ විශාල කාර්යභාරයකට මුල පටන් උර දුන් බාලේ සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ද වගකීම් දැරීය. 1987 දෙසැම්බර් සිට 1988 මැයි 08 දා වැල්ලවත්තේ දී ඔහුව ඝාතනය කරන තුරුම අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු වගකීම දැරීය.

## වෙනුර එදිරිසිංහ සහෝදරයා




මීගමුව ශාන්ත පීතර මහා විද්‍යාලයෙන් කොළඹ රාජකීය විද්‍යාලයට ඇතුළත් වූ වෙනුර සහෝදරයා උසස් පෙළ සමත්ව කොළඹ විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට තේරිපත් විය. ඔහු පාසලේදීත් විශ්වවිද්‍යාලයේදීත් ඉගෙනීමට අති දක්ෂයෙක් වීම විශේෂත්වයකි. උතුරු කොළඹ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය ජනසතු කිරීමේ අරගලය වෙනුවෙන් විශාල වැඩ කොටසක් ඉටු කළ ඔහු සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ද ඉදිරිපෙළ ක්‍රියාකාරිකයෙකි. ඔහුට දැඩි මර්දන වටපිටාවක වැඩ කිරීමට සිදුව තිබූ අතර දෙවරක්ම අත් අඩංගුවට ගනු ලැබුණි. බාලේගේ ඝාතනයෙන් පසු එනම් 1988 මැයි සිට 1989 සැප්තැම්බර් දක්වා අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු ලෙස වෙනුර සහෝදරයා කටයුතු කලේය. ඝාතනයට ලක් වූ මාධ්‍යවේදී රිචඩ් ද සොයිසාගේ නිවසට ගොස් එමින් සිටියදී කොල්ලුපිටියේ දී ඔහුව රාජ්‍ය හමුදා මගින් 1989 ඔක්තෝම්බර් 21 පැහැරගෙන යන ලදුව අමානුෂික ලෙස වධ දී ඝාතනය කර ඇත.

## උදේනි බන්දුල දිසානායක සහෝදරයා



කෑගල්ල ප්‍රදේශයෙන් පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයට ඇතුළත් වූ උදේනි බන්දුල දිසානායක සහෝදරයා ශිෂ්‍ය ව්‍යාපාරය වෙනුවෙන් සක්‍රීයවම දායක වූ සහෝදරයෙකි. මානව හිමිකම් කටයුතු වෙනුවෙන්ද උපරිම ලෙස මැදිහත්විය. අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු ලෙස වෙනුර ගෙන් පසුව (1989 සැප්තැම්බර් සිට 1990 ජනවාරි) කටයුතු කළේය. සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ද ඉදිරිපෙළ ක්‍රියාකාරිකයෙක් වූ උදේනි බන්දුල සහෝදරයා 1990 මුල රාජ්‍ය හමුදා මඟින් අත් අඩංගුවට ගෙන ඝාතනය කළ බවට විශ්වාස කරේ.


## සිසිර කීර්ති ජයවර්ධන සහෝදරයා



කොළඹ ආනන්ද විද්‍යාලයෙන් කොළඹ වෛද්‍ය පීඨයට ඇතුළත් වූ සිසිර කීර්ති සහෝදරයා පදිංචිව සිටියේ පන්නිපිටිය ප්‍රදේශයේය. 1984 වසරේ උසස්පෙළ විභාගයෙන් ලංකාවෙන් 5 වන ස්ථානයට වැඩි ලකුණු ලබාගත් අතර දක්ෂ ලේඛකයෙක් ද විය. පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය ජනසතු කිරීමේ අරගලයේ විශාල කාර්යභාරයකට උරදුන් අතර ''වෙද සිසු හඬ'' පුවත්

පත් සංස්කාරක ලෙසද කටයුතු කළේය. සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ද වගකීම් දරු සිසිර සහෝදරයා 1990 වසරේ අන්තර් විශ්වවිද්‍යාලයීය ශිෂ්‍ය බල මණ්ඩලයේ කැඳවුම්කරු වගකීම උරමතට ගත්තේ ය. 1990 මැද දී රාජ්‍ය හමුදා මගින් අත් අඩංගුවට ගෙන ඝාතන කළ බව විශ්වාස කෙරේ.

## ඥාණසිරි පල්ලියගුරු සහෝදරයා



තිස්සමහාරාමයෙන් රුහුණු විශ්වවිද්‍යාලයේ කෘෂි පීඨයට පැමිණි ඥාණසිරි සහෝදරයා සමාජවාදී ශිෂ්‍ය සංගමයේ පූර්ණකාලීනව විශාල කාලයක් සංවිධාන වගකීම් දරමින් වැඩකළ සහෝදරයෙකි. දේශප්‍රේමී අරගලයේ දී ශිෂ්‍ය ව්‍යාපාරයේ දායකත්වය ලබාදීමට විශාල මෙහෙයක් ඉටුකළේය. රාජ්‍ය මැර හමුදා විසින් 1989න් පසු කළුතරදී අත්අඩංගුවට ගෙන ඝාතනය කර තිබේ.

## රවීන්ද්‍ර සහෝදරයා

රවීන්ද්‍ර සහෝදරයා බෙලිඅත්ත ප්‍රදේශයෙන් රුහුණු විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයට ඇතුළත් විය. සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ඉදිරිපෙළ වගකීම් දැරූ රවීන්ද්‍ර සහෝදරයා මවුබිමේ නිදහස උදෙසාත්, ජනතාවගේ විමුක්තිය වෙනුවෙනුත් අරගල කිරීමට මුළු ජීවිතය ම කැප කළේය. 1990 ජනවාරියේ පමණ රාජ්‍ය හමුදා මගින් නුවරඑළියේදී අත්අඩංගුවට ගෙන ඝාතනය කරන ලදැයි සැලකේ.

## එස්. එම්. නිශ්මි සහෝදරයා



නිශ්මි සහෝදරයා රත්නපුර ඇලෝසියස් විද්‍යාලයෙන් 1984 දී පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ඇතුළත් වුණි. ශිෂ්‍ය සටන් තුළ නිශ්මි සහෝදරයා ඉදිරියෙන් ම සිටි අතර අතර දක්ෂ කථිකයකු ද විය. සරසවියට පැමිණීමට පෙර සිට ම සමාජවාදී ශිෂ්‍ය සංගමයට සම්බන්ධ වී සිටියේය. නුගේගොඩ අන්තරයේ මූලිකත්වයෙන් පැවති ඓතිහාසික රැළියේ ප්‍රධාන කතාව පැවැත්වූයේ නිශ්මි සහෝදරයාය. 1989 අවසානය වනතුරුත් ශිෂ්‍ය ව්‍යාපාරයේ වැඩකටයුතු කළේය.

## උපාලි ගමගේ (මහානාම) සහෝදරයා

සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ද්විතියික අංශයේ මුලින් වැඩ කළ සහෝදරයෙකි. කෙටි සාහිත්‍යමය යෙදුම් උපහාසයක් ද සහිතව නිතර භාවිතා කිරීම මහානාම සහෝදරයාගේ විශේෂත්වයක් විය. ප්‍රචාරක වැඩවලට වැඩිපුර උනන්දු විය. පූර්ණකාලීනව ම ශිෂ්‍ය ව්‍යාපාරය වෙනුවෙන් කැපවූ ඔහු පසුව සමාජවාදී ශිෂ්‍ය සංගමයේ මූලික වගකීම්වලට පත්කරගන්නා ලදී. මාක්ස් ලෙනින්වාදය වලංගු නොවන බවට ශිෂ්‍ය ප්‍රජාව තුළට පැමිණි විවිධ වැරදි ප්‍රවණතා පරාජය කිරීම වෙනුවෙන් මතවාදී තලයේ විශාල උද්ඝෝෂණයක් ගෙනයාමට වෙහෙසුනේය. "නිර්මාණ සංවාද කුලකය" නම් බහුජන සංවිධානයද ඒ සඳහා යොදාගන්නා ලදී. 1989න් පසු රාජ්‍ය මැර හමුදා මගින් අත් අඩංගුවට ගෙන ඝාතනය කරන්නට ඇතැයි විශ්වාස කෙරේ.

## ජය ශ්‍රී සහෝදරයා

ජය ශ්‍රී සහෝදරයා නාවලපිටියේය. පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වෛද්‍ය පීඨයට ඇතුළත් වූ ඔහු සමාජවාදී ශිෂ්‍ය සංගමයේ පූර්ණ කාලීනව වැඩ කළ ඉදිරිපෙළ ක්‍රියාකාරිකයෙකි. ජනතාවගේ උස් නිදහස වෙනුවෙන් මුළු දිවිය ම කැපකළ ජය ශ්‍රී සහෝදරයා දේශප්‍රේමී අරගලය තුළ ශිෂ්‍ය ව්‍යාපාරයේ වගකීම් ඉටු කළ අයෙකි. 1990 දී පමණ රාජ්‍ය මැර හමුදා මගින් අත්අඩංගුවට ගෙන ඝාතනය කළ බවට විශ්වාස කෙරේ.

## සේනක සහෝදරයා

සේනක සහෝදරයා වැලිමඩ මීරගහවත්ත ප්‍රදේශයේය. සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ඉදිරිපෙළ වගකීම්වල පූර්ණ කාලීනව ම වැඩිකාලයක් කටයුතු කළේය. 1989 කාලයේ අත් අඩංගුවට ගනු ලැබ කොළඹ මහ රෝහලේ පොලිස් ආරක්ෂාව යොදා රඳවාගෙන සිටියදී ශිෂ්‍ය සංගමයේ සහෝදරවරුන් මැදිහත් වී ඔහුව බේරාගන්නා ලදී. පීඩාවට පත් මිනිසුන් උදෙසා යහපත් ලෝකයක් නිර්මාණය කිරීමේ උතුම් අරමුණ වෙනුවෙන් ජීවිතය ම කැපකොට තිබුණි. 1989 න් පසුව නුවර ප්‍රදේශයේදී රාජ්‍ය හමුදා මගින් අඩංගුවට ගෙන ඝාතනය කළ බවට විශ්වාස කෙරේ.

## සම්පත් ශ්‍රී වර්ධන මුණසිංහ සහෝදරයා

හම්බන්තොට බඳගිරියෙන් මොරටුව විශ්වවිද්‍යාලයේ ඉංජිනේරු පීඨයට පැමිණි සම්පත් සහෝදරයා සමාජවාදී ශිෂ්‍ය සංගමයේ ඉදිරිපෙළ ක්‍රියාකාරිකයෙකි. දේශප්‍රේමී ජනතා ව්‍යාපාරයේ

කටයුතු වෙනුවෙන්ද උපරිම කැපවීමෙන් හා වගකීමෙන් වැඩකලේය. මච්ඡිම පාවාදුන් ජනතා ද්‍රෝහීන්ට එරෙහිව දිවි පරදුවට තබා අරගල කරමින් අනාගත පරපුරට යහපත් ලොවක් තැනීම සඳහා ජීවිතය කැප කලේය. 1989න් පසු රාජ්‍ය මැර හමුදා මගින් අත්අඩංගුවට ගෙන ඝාතනය කරන ලද බව විශ්වාස කෙරේ.

## ලලිත් සහෝදරයා

ශිෂ්‍ය ව්‍යාපාරය සංවිධානය කිරීම වෙනුවෙන් වෙහෙස වී වැඩ කළ සමාජවාදී ශිෂ්‍ය සංගමයේ සහෝදරයෙකි. 1989 අවසාන කාලයේ එහි ඉදිරිපෙළ වගකීම්වලට ද පත්වූ ලලිත් සහෝදරයා අනාගත පරපුරට වඩා යහපත් ලොවක් තැනීම වෙනුවෙන් සිය ජීවිතය කැප කලේය. 1990 පෙබරවාරියේ පමණ මහරගම පිළිකා රෝහල අසල දී රාජ්‍ය මැර හමුදා මගින් අත්අඩංගුවට ගන්නා ලද අතර එහිදී ඝාතනය කරන්නට ඇතැයි සැලකේ.


## පද්මසිරි ත්‍රිමාවිතාන සහෝදරයා



අම්බලන්ගොඩ ධර්මාශෝක විද්‍යාලයෙන් කොළඹ වෛද්‍ය පීඨයට පැමිණි ත්‍රිමාවිතාන සහෝදරයා පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය ජනසතු කිරීමේ අරගලයේ පෙරමුණේම සිටි ක්‍රියාකාරිකයෙකි. සමාජවාදී ශිෂ්‍ය සංගමයේද සංවිධාන ක්ෂේත්‍රයේ වැඩවලට උරදී කටයුතු කල අතර රත්නපුර දිස්ත්‍රික්කයේ වැඩකරන අතරතුර තවත් දෙදෙනෙකු සමග


පැහැරගැනීමට ලක්විය. අමානුශික ලෙස වධ දී ඝාතනය කර තිබූ අතර එයට එරෙහි දැවැන්ත සිසු ජන විරෝධතා ව්‍යාපාරයක් ඇතිවිය.

## සුනිල් සේනාරත්න මාරසිංහ සහෝදරයා



ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යා පීඨ ශිෂ්‍යයෙක් ලෙස සිටි මාරසිංහ සහෝදරයා කුරුණෑගල, හෙට්ටිපොල ප්‍රදේශයෙන් විශ්වවිද්‍යාලයට ඇතුළත් වුවෙකි. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටුවේ ක්‍රියාකාරී නායකයෙක් විය. රණවක ඝාතනයෙන් පසු රණවක අනුස්මරණ පදනම බිහිකිරීමට පුරෝගාමී විය. 1989 මැයි මස 10 වන දින අත් අඩංගුවට ගෙන අතුරුදහන් කර ඇත.


## සරත් කොල්ලුරේ සහෝදරයා



ගම්පහ වතුරුගම ප්‍රදේශයෙන් කොළඹ වෛද්‍ය පීඨයට ඇතුළත් වූ සරත් සහෝදරයා පළමු වසරේ සිට ම ශිෂ්‍ය නියෝජිතයෙක් ලෙස ක්‍රියා කරන ලදී. උතුරු කොළඹ පෞද්ගලික වෛද්‍ය විද්‍යාලය ජනසතු කිරීමේ අරගලය තීව්‍ර වූ අවස්ථාවක කොළඹ වෛද්‍ය පීඨ ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටුවේ සභාපති ලෙස එහි භාරදූර වැඩ කොටසක් ඔහු

විසින් ඉටු කරන ලදී. සරත් සහෝදරයා ත්‍රිමාගේ මරණින් පසු විශ්වවිද්‍යාලයේ සිසු දෙමාපිය සංවිධානය පිහිටුවීමට ද මුල් විය. මේ හේතුවෙන් ඔහුගේ පවුලේ අයට පවා දිගින් දිගටම මරණ තර්ජන එල්ල වූ අතර වරක් ආරක්ෂක අංශ විසින් ඔහුගේ මව ප්‍රාණ ඇප කරුවෙකු ලෙස තබාගෙන සරත් සහෝදරයාට භාර වන ලෙස පවසා තිබුණි. 1989 නොවැම්බර් 02 දින මාතලේ වැවල ප්‍රදේශයේ දී වෙඩි තබා ඝාතනය කර තිබුණි.

## ගාමිණී මාලසිංහ සහෝදරයා



පාසල් අවධියේ සිටම නිදහස් අධ්‍යාපනය ආරක්ෂා කිරීමේ අරගලයේ සිටි ගාමිණී සහෝදරයා ද්විතීක අධ්‍යාපනය හැදෑරුවේ ශාන්ත ජෝසප් වාස් විද්‍යාලයෙනි. 1982 ධවල පත්‍රිකා සටනේ දී පාසල් සිසුවෙක් ලෙස නායකත්ව කාර්යභාරයක් ඉටු කිරීම නිසා පොලීස් අත් අඩංගුවට ද පත්විය. ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යන හා වාණිජ පීඨයට ඇතුලත් වන ගාමිණී මාරසිංහ සහෝදරයා පළමු වසරේ සිටම ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටුවේ සිටි අතර ශ්‍රී ජයවර්ධනපුර විශ්විද්‍යාලයෙන් එවකට අ.වි.ශි.බ.ම. නියෝජනය කළ නියෝජිතයා ද විය. 1988 දෙසැම්බර් පැහැර ගෙන ගොස් අතුරුදහන් කර ඇත.

## ගැමුණු යසස් සෙනෙවිරත්න (ගායාන්) සහෝදරයා



ගැමුණු යසස් සෙනෙවිරත්න සහෝදරයාගේ ගම ගාල්ල හපුගලය. කැළණිය විශ්වවිද්‍යාලයේ විද්‍යා පීඨයේ ශිෂයෙකි. මානව හිමිකම් සුරැකීමේ ශිෂ්‍ය සංවිධානයේ ලේකම්වරයා ලෙස 80 දශකයේ අග භාගයේදී කටයුතු කලේය. ශිෂ්‍යයන් පැහැර ගැනීම්, අතුරුදහන් කරවීම් හා ඝාතනයන්ට විරුද්ධව සමස්ත ලාංකේය ශිෂ්‍ය ප්‍රජාවම වෙනුවෙන් ජාතිකවත් ජාත්‍යන්තරවත් හඬ නඟන ලද සිසු නායකයෙකි. 1989 දෙසැම්බර් 09 ආරක්ෂ අංශ මගින් පැහැරගෙන ගෙන ගොස් අතුරුදහන් කර ඇත.


## ඉරේෂා පොල්ගම්පොල සහෝදරිය



ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ ව්‍යවහාරික විද්‍යාපීඨයේ ශිෂ්‍යාවක් වූ ඉරේෂා පොල්ගම්පොල සහෝදරියගේ ගම කෑගල්ල ගලිගමුවයි. විශ්වවිද්‍යාලය තුළත් ඉන් පිටතත් ශිෂ්‍ය නායිකාවක් ලෙස නිදහස් අධ්‍යාපනයත් මවුබිමේ නිදහසත් රැකගැනීමේ අරගලයේ ඉදිරියෙන් ම සිටි සහෝදරියකි. විශ්වවිද්‍යාලයේ ශිෂ්‍ය ක්‍රියාකාරී කමිටුවේ සාමාජිකාවක් වූ ඇය


1989.12.30 වන දින මොරටුව විශ්වවිද්‍යාලය අසලදී පැහැරගෙන ගොස් අතුරුදන් කර ඇත.

## නිශාන්ත ජයවර්ධන සහෝදරයා



දික්වැල්ල විජිත මහ විද්‍යාලයේ ශිෂ්‍යයෙකි. ඔහුගේ ගම මාතර රත්මලේ ප්‍රදේශයයි. දිගින් දිගටම සරසවි සිසුන් මෙන්ම පාසල් සිසුන් ද ඉලක්ක කරගනිමින් රජය විසින් ගෙන ගිය කෲර මර්දනයට විරෝධය පෑමක් ලෙස විජිත මහ විද්‍යාලයේ සිසුහු ද උද්ඝෝෂණයක් සූදානම් කළහ. ඒ 1988 ජූනි මස 20 වන දිනයි. එහිදී පාසල තුළ සිටි සිසුන්ට ආරක්ෂක අංශ විසින් සිදු කල වෙඩි තැබීමේදී නිශාන්ත සහෝදරයා ජීවිතක්ෂයට පත්විය.

## ප්‍රදීප් කරුණාරත්න



බදුල්ල, කරුණගම ප්‍රදේශයේ ශිෂ්‍යයෙක් වූ ප්‍රදීප් සහෝදරයා ඌව මහා විද්‍යාලයේ කලා අංශයෙන් උසස් පෙළ හදාරන ලදී. 1989 සැප්තැම්බර් 13 වන දින ''ජාතික ශිෂ්‍ය මධ්‍යස්ථානය'' විසින් පාසල් කිහිපයකම සිසුන් එක්කර ඒකාබද්ධ උද්ඝෝෂණයක් සූදානම් කරන ලදී. එහිදී ඌව මහා විද්‍යාලයේ

ක්‍රීඩාංගනයට එක් රැස්වෙමින් සිටි සිසුන් වෙත පොලීසිය විසින් වෙඩි ප්‍රහාරයක් එල්ල කළ අතර එම ප්‍රහාරයෙන් ප්‍රදීප් සහෝදරයා ඝාතනයට ලක්විය.

## අළු දූලි මතින්

ලාංකේය ශිෂ්‍ය ව්‍යාපාරය ලෙයින් යකඩින් මර්දනය කර දැමූ පාලකයෝ කල්පනා කලේ සියල්ල අඩපණ වනු ඇති බවය. එහෙත් මරණය පෙනි පෙනී පවා සටන් වැදුනු විරු පරපුරක් අනාගත පරපුර වෙනුවෙන් බොහෝ දේ ඉතිරිකර ගියෝ ය. අධිෂ්ඨානය, ධෛර්යය වීරත්වය, ශක්තිය මේ සියල්ල අනාගත පරපුරට දායාද කරමින් ඔවුහු සටන් බිම දී මරණය තෝරා ගත්හ.

තම තමන් ම තනි තනිව පෞද්ගලිකව අනාගත සුබ සිහින මන්දිර දකිනවා වෙනුවට කෝටි ගණනක් දුක්විඳින මිනිසුන් වෙනුවෙන් වඩා යහපත් ලෝකයක් නිර්මාණය කිරීමේ ශ්‍රේෂ්ඨ අරමුණින් ඔවුහු අරගලය තෝරාගත්හ. අනාගත පරපුරේ අධ්‍යාපනය ලැබීමේ අයිතිය වෙනුවෙන් නිදහස් අධ්‍යාපනය තව තවත් පුළුල් කළ සැබෑ අධ්‍යාපනයක් දිනාගැනීම වෙනුවෙන් ඔවුහු අරගලය තෝරාගත්හ.

අයුක්තියට, අසාධාරණයට, පීඩනයට එරෙහිව අභීතව නැගී සිටියහ. මව්බිමේ උස් නිදහසත්, ජනතාවගේ විමුක්තියත් වෙනුවෙන් සටන් වැදුනහ. ඒ සියල්ල වෙනුවෙන් තම අති උතුම් වස්තුව වූ දිවි කුසුම පුදකළහ. දුක් විඳින මිනිසුන් වෙනුවෙන් කළ හැකි ශ්‍රේෂ්ඨතම පරිත්‍යාගය කළහ.

මිනිසුන් මරා දැමුවද ඔවුනගේ අරමුණු මරාදැමිය හැකි නොවේ. ඔවුන්ගේ වීරත්වයන් මරාදැමිය හැකි නොවේ. ඔවුන්ගේ අධිෂ්ඨානයන් විනාශ කළ හැකි නොවේ. ඔවුන්ගෙන් ගිළිහුණු ධජය බිම වැටීමට ඉඩ නො තබා යළි ලාංකේය ශිෂ්‍ය ව්‍යාපාරය පෙර ගමන් ඇරඹුවේ ඒ නිසාය. තලා වනසා දමා ලාංකීය ශිෂ්‍ය ව්‍යාපාරය වැනසිය නොහැකි බව ඉතා කෙටි කලකින්ම පෙන්වීමට විරුවන්ගේ මග තෝරාගත් සිසු පරපුර පෙන්වා දුන්හ.

1991 පටන් ම යළි සංවිධානය වෙමින්, දිවි පිදූ විරුවන් සිහිකරමින්, සමරු ප්‍රදර්ශනයන් විශ්වවිද්‍යාල මට්ටමින් සංවිධානය කරමින් ශිෂ්‍ය ව්‍යාපාරය යළි ගමන් අරඹන ලදී.


## පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ රෝහණ වීරසූරිය සමරුවක් 1980





ධවල පත්‍රිකාවට එරෙහි සටන් අවස්ථාවක පොලීසියෙන් සිදු කළ බාධා කිරීමට එරෙහි වෙමින් ( එච්. බී. හේරත් සහෝදරයා)

# 1980 ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ මහා ශිෂ්‍ය සංගම් නියෝජිතයින්



මෙහි ඉදිරි පෙළ දකුණු පස සිට තෙවැනියට සිටින්නේ එච්. බී. හේරත් සහෝදරයායි. ඉදිරි පෙළ දකුණුපස කෙළවරේ සිටින්නේ එස්. පොන්වීර සහෝදරයායි.

## එච්. බී. හේරත් සහෝදරයා ලියූ ලිපියක්

### සියතින් ගෙල මිරිකාගත්තා ධනේශ්වර ප්‍රජාතන්ත්‍රවාදී නිදහස

**එච්. බී. හේරත්**

යුරෝපාකාරයේ පැවැති වැඩවසම් ක්‍රමය විනාශ කරමින් ඒ තුළ වර්ධනය වෙමින් පැවති ධනේශ්වර නිෂ්පාදන ක්‍රමය කරළියට ආවේ එතෙක් සමාජ ඉතිහාසයේදී නිෂ්පාදන බලවේග යන්ගේ සංවර්ධනයට නොලද අතිවිශාල පුළුල් ඉඩකඩක්, නිදහසක් ලබා දෙමිනි, 1789 ප්‍රංශ මහා විප්ලවයෙන් යුරෝපාකරයේ මේ සඳහා

නිෂ්පාදන අතිරික්තයක් ලබාදීමට සමත් වූ අතර අනෙක් පැත්තෙන් මාක්ස් කී පරිදි ධනපතියන් තමන් තමන්ගේම මිනීවල හාරාගන්නා වැඩ කරන පුළුල් කම්කරු පංතියක් බිහිකරනු ලැබීය. මේ අයුරින් ධනපති ක්‍රමය නැවත ආපස්සට නොයන අයුරින් ස්ථාපිත වනවාත් සමඟම නිෂ්පාදන මාර්ගවල හිමිකාරත්වය දරූ දේපල හිමි


## 1981 ජුලි පේරාදෙණිය ඉන්ජිනේරු පීඨ සිසුන් උද්ඝෝෂණයේ




## 1981 ශිෂ්‍ය භික්ෂු උද්ඝෝෂණයක අවස්ථාවක්



## කැලණියේ සිසු මර්දනයට එරෙහිව කොළඹ විශ්වවිද්‍යාල සිසුන් තර්ස්ටන් පාරේ උද්ඝෝෂණයක - 1981 ජූනි



## 1981.02.10 - පෞද්ගලික වෛද්‍ය විද්‍යාලවලට එරෙහිව හා ශිෂ්‍යයින්ට ශිෂ්‍යාධාරයක් ලබා දෙන ලෙස ඉල්ලා සිදු කළ උද්ඝෝෂණයක්



# රණවක සොයුරාගේ ඝාතනය

වෙඩි වැදුණු රණවක සොයුරා රැගෙන යන සහෝදර සිසුන්. මෙහි වම් පස කෙලවර සිටින්නේ නිමල් බාලසූරිය සහෝදරයායි. රණවක සොයුරාට වෙඩි තැබූ පොලිස් නිළධාරියාද පසෙකින් වේ.















## ඉන්දු ලංකා ගිවිසුමට එරෙහි විරෝධය





ඉතාම ජනප්‍රිය පුවත්පත

# කොළඹ රැයේ නොසන්සුන් තත්ත්වයක්

ගිහි - පැවිදි විශාල පිරිසකගේ සහභාගිත්වයෙන් පිටකොටුව බෝගහ අසල රැයේ උදේ පැවැති සත්‍යග්‍රහයට කඳුළු ගෑස් ගැසීමෙන් පසුව කොළඹ පුරා නොසන්සුන් තත්ත්වයක් ඇතිවිය.

## පැය 4 කදී 20 ක් මරුට 117 කට තුවාල

ඇඳිරි නීතිය

## කඳුළු ගෑස් වැදී සිසිකඩ දුවති

● කොටුව දුම්රිය පළ ළඟ

● වාහන රැසක් ගිනිබත්

## කොළඹ සත්‍යග්‍රහ




## ක්ලිෆඩ් පෙරේරා සහෝදරයාගේ අවමංගල්‍යය



නිමල් බාලසූරිය සහ සේන මච්චාගම සහෝදරවරු ද මෙහි වෙති.

# නිමල් බාලසූරිය සොයුරාගේ ඝාතනය



නිමල් බාලසූරිය සහෝදරයාගේ අවමඟුල් උත්සවය. වෙනුර එදිරිසිංහ, උදේනි බන්දුල සහෝදරවරු ද මෙහි වෙති.

1988 කොටා පාර්ක්හි දී  පැවැත්වූ ඒකාබද්ධ රැළිය.



1988 ජුනි 20. ජාතික ශිෂ්‍ය වීර දින සැමරුම - රැලිය සහ පෙළපාලිය
පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ වීරසූරිය ස්මාරකය අසල








**විරු සිසු සැමරුම වෙනුවෙන් ජාතික ශිෂ්‍ය මධ්‍යස්ථානය විසින් තැනූ විරු සිසු ස්මාරකයක්**


**විශ්වවිද්‍යාල තුළ හමුදා කඳවුරු ඉදි කිරීමට එරෙහිව**




**පැවති මර්දනය හමුවේ එකළ අවිශිබම නියෝජිතයින් අධ්‍යාපන ඇමතිවරයා සමග සාකච්ඡා සඳහා සහභාගී වූයේ මෙසේ මුහුණු ආවරණය කරගනිමිනි**




## සරසවි සිසුන්ගේ පවුල්වල සාමාජිකයන් ඝාතනය කිරීමට එරෙහිව.







# ජ'පුර සිසු පියසිරි ප්‍රේමලාල් සොයුරාට උත්තමාචාර














# ත්‍රිමා විතාන සොයුරාට උත්තමාචාර









# ඓතිහාසික නුගේගොඩ රැළිය








# පාසල් ශිෂ්‍ය ක්‍රියාකාරිත්වය



සිසු ඝාතන වලට නිදහස් අධ්‍යාපන කප්පාදුවට විරුද්ධව රාජකීය - නර්ස්ටන් විදුහල් වල සිසුන් පෙරමුණේ

ජේ.ආර්.

...දිග අධ්‍යාපන ලෝකයේ ගිණිසිලු වූ නාලන්දා, ... ඔක්ස්ෆර්ඩ්, හිදන්ත පුරී, වලභී, තක්ෂිලා...

...අපට ලබා ගැනීමට වරම් දී තිබූ ක්‍රමය අහිමි කරන ... වලදී පත්‍රිකා පනත 1985/86 වර්ෂ වලදී ක්‍රියාත්මක...

---

...මහතා කියා සිටියේ ඒ ප්‍රදේශවල පාසල්වල සාමකාමී වාතාවරණයක් ඇති කිරීමේ බලතල පළාත් සභා මහ ඇමැතිවරුන්ට හා ඒ ඒ පළාත්වල අධ්‍යාපන අධ්‍යක්ෂවරුන්ට පවරා ඇති බවයි.

## පාසල් අරින්න උද්ඝෝෂණ කරති

(ධර්මරත්න විජේසුන්දර)

**රජය විසින් නම්කර වසන ලද පාසල් යළි වහාම විවෘත කරන්නැයි ඉල්ලමින් රටේ විවෘත ව පැවැති පාසල් බොහොමයක ශිෂ්‍ය ශිෂ්‍යාවෝ උද්ඝෝෂණ ව්‍යාපාර ආරම්භ කළහ.**

පාසල් සිසුන්ගේ විරෝධතා ව්‍යාපාර මැඩපැවැත්වීම සඳහා කඳුළු ගෑස්, හා බැටන් පහර කිප පොළක දී ම යොදවා තිබූ බව ද ස්ථාන කිහිපයකින් වාර්තා විය.

කොළඹ පමණක් රටේ විවෘත ව පැවැති පාසල් දහයකට වැඩි ගණනක ශිෂ්‍ය ශිෂ්‍යාවෝ මෙම විරෝධතා ව්‍යාපාරයට එක් වී සිටියහ.

මහනුවර දිස්ත්‍රික්කයේ පාසල් 21 ක ශිෂ්‍ය ශිෂ්‍යාවෝ විසි දහසක් පමණ දෙනා ද පාසල්වලින් එළියට බැස විරෝධතා ව්‍යාපාරවල යෙදුණහ.

ශිෂ්‍ය විරෝධතා ව්‍යාපාරත් සමඟ ම බස් රථ කීපයක් ගිනි තබා ඇති බව වාර්තා වූ අතර සමහර ප්‍රදේශවල මාර්ග අවහිර කිරීම්, මහ මඟ ටයර් පුළුස්සා දැමීම් ආදිය ද වී යැයි ආරක්ෂක අංශ නිලධාරියෙක් කියා සිටියේය.

---

දිවයින 9

## පාසලේදී වෙඩිකා මියගිය පුතාගේ අළු ටිකවත් අපට පෙන්නුවේ නෑ !

— මව්පියෝ කම්පාවෙති

(ඡායාරූපය හා විස්තරය සමුගන්නාර වාර්තාකරු සෝමසිලය වගොඩවිට)



### සරසවිශිෂ්‍ය ඝාතනයටවිරෝධය

නන්ද පතිරණගේ සරල ගී අද

රවුම් කියත් තල
කුරාස ලකුණ - ජර්මන්
10", 36" හා 42"
යතු තල
ඇස්. සී. ඇම් - ඉතාලි
10" හා 12"

---

ඉතාම ජනප්‍රිය පුවත්පත

පුවත් පතක් වශයෙන් ශ්‍රී ලංකාවේ ලියාපදිංචි කරන ලදී. මිල රු: 4.00

## දින නියමයක් නැතිව පාසල් 115 ක් වසයි

(දයා ලංකාපුර)

ශිෂ්‍ය විරෝධතා ව්‍යාපාර පවතින රජයේ පාසල් 115 ක් දින නියමයක් නොමැතිව වසා...

ම. ම. වි., වැගියකුඹුර ම. ම. වි., කැප්පෙටිපොල ම. වි., ජනානන්ද ම. වි., කඳුරුගමුව...

කළුතර
කළුතර ම. වි., ශ්‍රීපාලි ම. වි. හොරණ තිස්ස ම. ම. වි.,

කුලියාපිටිය
නක්කාවත්ත ම. ම. වි., යකරවත්ත බා. වි. ...